# අත්අඩංගුවේදී ඝාතනයට ලක්වීම
# අඟුලාන පොලිස් ස්ථානය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## පටුන

පිටුව


(i) හැඳින්වීම 03

(ii) ක්‍රමවේදය 04

**පළවන පරිච්ඡේදය : විමර්ශනය** 05

1.0 විමර්ශනයේදි ලබා ගන්නා ලද සාක්ෂි සංක්ෂිප්තයන් 05

1.1 අගතියට පත් පාර්ශවය (පැමිණිලි අංක HRC/3463/09 හි පැමිණිලිකරුවන්) විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි 05

1.1.1. මිය ගිය එම්.බී.දිනේෂ් තරංග ප්‍රනාන්දු යන අයගේ මව වන බී.එම්.ස්වර්ණලතා අපොන්සු යන අයගෙන් ලබාගත් ප්‍රකාශය 05

1.1.2. 2009-08-18 දිනැති මුතුතන්ත්‍රි බස්තියම්ගේ සුසන්ත ප්‍රියලාල් ප්‍රනාන්දු යන අයගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු 06

1.1.3. මුතුතන්ත්‍රි බස්තියන්ගේ සංඝදාස ප්‍රනාන්දු යන අයගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු 08

1.1.4. දනුෂ්ක උදයකාන්ත යන අයගේ මව වන දේවිකා ප්‍රනාන්දු යන අයගේ අනාවරණය කර ගන්නා ලද කරුණු 09

1.2. ස්වාධීන සාක්ෂි 09

1.2.1. අඟුලාන පොලිස් ස්ථානයේ සිරමැදිරියේ රඳවා සිටි ගාල්ලගේ බැසිල් ප්‍රනාන්දු යන අයගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු 09

1.2.2. දැකුම්පිටිය ආරච්චිගේ දමිත් කුමාර යන අයගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු 10

1.2.3. මහමරක්කල කුරුකුලසූරිය පටබැඳිගේ උදයසිරි පෙරේරා යන අයගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු 11

1.2.4. රංගිගේ අනිල් පීරිස් යන අයගේන් අනාවරණය කරගන්නා ලද කරුණු 12

1.2.5. වල්පොල ගමගේ සුසන්ත ජයලත්ගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු 12

1.3. වගඋත්තරකරුවන්ගෙන් හෙළිදරව් වු කරුණු 15

1.3.1. පළවන වගඋත්තරකරු ලෙස හඳුන්වනු ලබන අඟුලාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පො ප නිව්ටන් 15

1.3.2. දෙවන වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන සිවිල් ආරක්ෂක භට ගොඩපිටියවත්ත ආරච්චිගේ ජනප්‍රිය සේනාරත්න යන අය 16

1.3.3. තුන්වන වගඋත්තරකරු ලෙස සඳහන් වන පො.කො. ජයරත්නගේ ධම්මික නිහාල් ජයරත්න 17

1.3.4. හතරවන වගඋත්තරකරු ලෙස සඳහන් පො.කො. ගලගමගේ ඉන්ද්‍රවංශ කුමාරසිරි යන අය 18

1.3.5. පස්වන වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන සිද්ධිය සම්බන්ධයෙන් දැනට බන්ධනාගාර ගතව සිටින පො.කො.35473 චමල් තුෂාර කුලසිංහ යන අය 20

1.3.6. හයවන වගඋත්තරකරු ලෙස සඳහන් රොහාන් බණ්ඩාර නවරත්න යන අය 21

1.3.7.හත්වන වගඋත්තරකරු ලෙස 2009.08.12 වන දින රාත්‍රි උප සේවයේ රාජකාරි කල ගයාන් චතුරංග තොටවත්ත යන අය 22

1.3.8. අටවන වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන සිද්ධිය සම්බන්ධයෙන් දැනට බන්ධනාගාර ගතව සිටින පො.කො.73295 දිසානායක මුදියන්සේලාගේ නිශ්ශංක දිසානායක යන අය 24

1.4. අතවරයට ලක්වූ පාර්ශවයේ ප්‍රකාශ 25
1.4.1. නදිකා කල්පනි ප්‍රනාන්දු යන අයගෙන් හෙලිවූ කරුණු 25
1.4.2. විදානලාගේ තරංග දර්ශන ද මැල් ගේ ප්‍රකාශය 26
1.5. විමර්ශන නිලධාරීන්ගේ නිරීක්ෂණ 27
1.5.1. අත්අඩංගුවට ගැනීම 27
1.5.2. රඳවා තබා ගැනීම 27
1.5.3. වධහිංසාව 28
1.5.4. වින්දිතයින්ගේ අයිතිවාසිකම් 28
1.5.5. වෙනත් කරුණු 29

**දෙවන පරිච්ජේදය : නීතිමය විශ්ලේෂණය** 30

2.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්‍ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම් 30
2.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13:1 ව්‍යවස්ථාව මගින් සුරක්‍ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම් 33
2.2.1. නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකුව සිරභාරයට නොගැනීම 33
2.2.2. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුතුය. 34
2.3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම්
2.3.1. සිරභාරයට ගැනීම හා රඳවා තබා ගැනීම 34
2.3.2. සිරභාරයට ගන්නා යම් තැනැත්තෙකු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු වෙත ගෙන යාම 36
2.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(3) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් 36
2.5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් 36
2.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් 38
2.7. වෛද්‍ය සාක්ෂි 38
2.8. රාජ්‍ය වගකීම හා මූලික අයිතිවාසිකම් සුරක්‍ෂිත කිරීම 40
2.9. අගතියට පත් පාර්ශවය සම්බන්ධයෙන් වන්දි පිරිනැමීම සම්බන්ධ දේශීය හා ජාත්‍යන්තර නීති අර්ථකථනය. 42
2.10. තරුණයන් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ගේ වගකීම 44
2.11. මෙම පැමිණිල්ලෙන් අගතියට පත් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් 44

**තුන්වන පරිච්ජේදය : නිර්දේශය** 45

3.1. මූලික අයිතිවාසිකම් කඩවීම 45
3.2. විනයානුකූලව කටයුතු කිරීම 45
3.3. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය 45
3.4. වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම 46

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 47

## (i) හැඳින්වීම

2009-08-12 වන දින අඟුලාන පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගනු ලැබූ දිනේෂ් තරංග සහ දනුෂ්ක උදයකාන්ත යන දෙදෙනා ඝාතනයට ලක්වීම පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයකට ලක් කර තිබුණි. එම මාධ්‍ය වාර්තා මගින් හෙලිවූ කරුණු පිළිබඳව කොමිෂන් සභාවේ අවධානය යොමු වූ අතර, 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කොමිෂන් සභාවේ විශේෂ විමර්ශන කණ්ඩායමක් විමර්ශන කටයුතු ආරම්භ කරන ලදි.

කොමිෂන් සභාව මගින් මෙම කර්තව්‍ය ආරම්භ කරන ලද්දේ, පනතේ 14 **වන වගන්තියට** අනුකූලව අතෘප්තියට පත් තැනැත්තකුගේ පැමිණිල්ලක් නොමැතිව වුවද **විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකමක් උල්ලංඝණය වීමක් සම්බන්ධව** කොමිෂන් සභාව විසින් **<u>එහි මෙහෙයවීමෙන්</u>** විමර්ශන කටයුතු ආරම්භ කිරීමට ඇති බලතල ප්‍රකාරවය.

**පොලිස් අත්අඩංගුවට පත්වන්නන් ඝාතනයට ලක්වීම (Deaths in Custody)** බරපතල මානව හිමිකම් ගැටළුවක් ලෙස කොමිෂන් සභාව නිරීක්ෂණය කරන බැවින්ද, මෙම තත්වය වැළැක්වීමේ ක්‍රමවේදයන් හඳුන්වාදීමේ වගකීමක් කොමිෂන් සභාව සතුවන බැවින්ද, මෙම සිද්ධියට ප්‍රමුඛතාවය දෙමින් කටයුතු කිරීමට කොමිෂන් සභාව තිරණය කරන ලදි.

## (ii) ක්‍රමවේදය

මෙම සිදුවීමට අදාල විමර්ශන කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රථම දිනදී විමර්ශන නිලධාරීන් කණ්ඩායමක් අදාල ස්ථානයට ගිය අතර, ප්‍රථම දිනයේදී සිද්ධිය සිදුවූ අගුලාන ප්‍රදේශයේ කැළඹිලිසහගත තත්වයක් තිබූ බැවින්, නිරීක්ෂණාත්මක ප්‍රවේශයක් මගින් අදාල ස්ථානයන් පරීක්ෂා කරන ලද අතරම, අවස්ථානෝචිත පරිදි යම් යම් පුද්ගලයන්ගෙන් තොරතුරුද අනාවරණය කරගන්නා ලදී.
වැඩිදුර විමර්ශන කටයුතු ඉදිරිදිනවලදී සිදු කිරීමේදී අගතියටපත් පාර්ශවයෙන්, විශේෂයෙන් ඝාතනයට ලක්වන ලද තරුණයන්ගේ දෙමාපියන්ගෙන් සහ ඥාතීන්ගෙන්ද, සිද්ධිය සිදුවූ දින අගුලාන පොලිස් ස්ථානයේ සිරමැදිරියේ රඳවා සිටි පුද්ගලයින්ගෙන්ද, සිද්ධිය සම්බන්ධයෙන් කරුණු කීමට ඉදිරිපත්වූ වෙනත් පුද්ගලයින්ගෙන් ප්‍රකාශයන් සටහන් කර ගන්නා ලදී. තවද මෘත ශරීර හමුවූවායැයි පවසන ලද ස්ථානද,පොලිස් ස්ථානයද ස්ථානීය පරීක්ෂාවකට ලක් කරන ලදී.

එසේම මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායම විසින් මෙම සිදුවීමට සම්බන්ධ වන ලිංගික අතවරයකට ලක්වීම නිසා පැමිණිල්ලක් කිරීමට පොලිස් ස්ථානයට ගිය කාන්තාව රැඳී සිටි අගුලාන සුනාමි කඳවුරද ස්ථානීය පරීක්ෂණයකට ලක් කරන ලදී.

එමෙන්ම ඒ වන විටත් සිද්ධියට සම්බන්ධ අගුලාන පොලිස් ස්ථානයේ සේවය කරන ලද වගඋත්තරකරුවන් බන්ධනාගාරගතවී සිටි බැවින් ප්‍රකාශ ලබා ගැනීම එම ස්ථානයේදී කිරීමට කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් පියවර ගන්නා ලදී.

තවද මෙම සිද්ධිය සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි රැස්කිරීමට කටයුතු කරන ලද අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මෙන්ම සිද්ධියට අදාල පොලිස් ස්ථානය වෙතට ගොස් ලේඛන පරීක්ෂාවන් සිදු කරන ලදී. මෙම සිදුවීම ඝාතනයකට සම්බන්ධ බැවින් හා අදාල තරුණයන් දෙදෙනා පොලිසියේදී වධහිංසාවට ලක්වූවාදැයි පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයක්ද තිබූ බැවින් **විශේෂඥ සාක්ෂි** ලබා ගැනීමට (අධිකරණ වෛද්‍ය වාර්තා කැඳවීම) කටයුතු කරන ලදී.

ඉහත සියලුම කරුණු රැස් කිරීමෙන් අනතුරුව විමර්ශන වාර්තාව සකස් කර, එකී වාර්තාව විශ්ලේෂණයට ලක් කරමින් රජය වෙත නිර්දේශයක් ලබා දීමට පියවර ගැනේ.

# පළවන පරිච්ඡේදය

# විමර්ශනය

---

**1.0 විමර්ශනයේදී ලබා ගන්නා ලද සාක්ෂි සංක්ෂිප්තයන්**

**1.1. අගතියටපත් පාර්ශවය (පැමිණිලි අංක HRC/3463/09 හි පැමිණිලිකරුවන්) විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි**

**1.1.1. මිය ගිය එම්.බී.දිනේෂ් තරංග ප්‍රනාන්දු යන අයගේ මව වන බී.එම්.ස්වර්ණලතා අපොන්සු යන අයගෙන් ප්‍රකාශය**

- මිය ගොස් ඇත්තේ, තමාගේ දෙවන පුතා වන බවත්, ඔහු රැකියාව වශයෙන් මාළු වෙළඳාම කල අවිවාහක තරුණයෙකු බවත්, ඔහු සෑම දිනකම කොළඹින් මාළු ගෙනවිත් බයිසිකලයක මාළු දමාගෙන වෙළදාම් කල බවත්, මාළු වෙළඳාමට අමතරව අමතර රැකියාවක් ලෙස රේස්බයි රේස් බුකියේ (ස්පොට් ටයිම්) නැමැති ස්ථානයේ පාර්සලය රැගෙන යාමේ කාර්යය ඉටු කරන ලද බවත්, එය පස්වරු 5.45ත් 7.15 යන වේලාවන් අතරේ සිදු කරන ලද බව.

- 2009.08.12 වන දින රේස්බයි රේස්හි රාජකාරි සඳහා ඔහු නිවසින් පිටව් නොගිය බවත්, මාළු වෙළඳාමටද නොගිය බවත්, ඊට හේතුව ලෙස තමාට සනීප නොමැති බවත්, පසුදින රස්සාවට යන බවත් ඔහු තමා සමඟ පැවසු බව.

- තම පුතා සවස 4.00ට පමණ නිවසින් පිටව ගිය බවත් තමා සවස 5.00ට පමණ එළවළු ගැනිමට පොලිසිය ඉදිරිපිට ඇති එළවළු කඩයට ගියවිට තම පුත්‍රයා අගුලාන පොදුජන ක්‍රිඩා පිට්යේ සෙල්ලම් කරමින් සිටිනු දුටු බව හා ඔහු සමග තරංග යන අය සහ තවත් අය සිටි බව.

- තම පුත්‍රයා සාමාන්‍යයෙන් රාත්‍රි 8.00ත් 8.30ත් 9.00ත් අතර නිවසට පැමිණෙන නමුත් එදින නොපැමිණි බවත්, රාත්‍රි 12.00ට පමණත් පුතා නොපැමිණිය නිසා ඒ බව තම ස්වාමි පුරුෂයාට පැවසු බවත්, පසුව පාන්දර 1.00ට පමණ පොලිසිය ඉදිරිපිට පදිංචි අනිල් පිරිස් යන අය පුතා ගෙදර ඉන්නවාදැයි ඇසු බවත්, එවිට ඔහු නැති බව ප්‍රකාශ කල බවත්, පසුව තම පුතාට අගුලාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් හොඳටම ගහන බව අනිල් නැමැති අය පැවසු බවත්, ඉන්පසුව ස්වාමිපුරුෂයාත් වැඩිමහල් පුතා වන සුසන්ත ප්‍රියලාල් සහ අසල්වැසි තමරා යන අය සමඟ අගුලාන පොලිසියට ගිය බව

- පොලිස් ස්ථානයේ සාලයේ විදුලි පහන් දල්වා තිබු බවද, ගේට්ටුව ලඟ ග්‍රාම ආරක්ෂක සුසන්ත සහ තවත් තිදෙනෙකු සිටි බවත්, ඔවුන් තමාට පොලිසිය ඇතුලට යාමට නොදුන් බවත්, පුතාලා දෙදෙනා පිලිබඳව විමසු විට පරුෂ වචනයෙන් බැන වැදුණු බවත්, “උදේට වරෙන්” යැයි පවසා තමන්ව එලවා ගත් බව.

- මෙවිට වේලාව පාන්දර 1.30ට පමණ වන බවත්, ඉන්පසුව විනාඩි 20ක් පමණ එතැනම සිටි නමුත් එතැන ඉන්න ඉඩනොදුන් නිසා නැවත නිවසට යාමට පෙර ක්‍රිඩාංගනය අසල සුනාමි නිවාසකට ගොස් ආරවුලක් ඇති වුණාදැයි විමසු බවත්, එවිට එම නිවසේ සිට කාන්තාවන් දෙදෙනෙක් සහ පිරිමින් තුන්දෙනෙක් එළියට ආ බවත්, ඔවුන් විසින් කලු බැනියමක් ඇඳ සිටි අයෙක් සහ කහ

පාට බැනියමක් ඇඳ සිටි අයෙක් ක්‍රීඩාපිටියේ සිටි බවත්, රාත්‍රි 10.00ත් 10.30ත් අතර කළු බැනියම ඇඳ සිටි අය සිගරට් එකක් පත්තු කර ගැනිම සඳහා පැමිණි බවත්, ගිනි පෙට්ටිය දෙන විට තරුණ කාන්තාවගේ අතින් ඇල්ලු බව හා එම නිසා පොලිසියට ගොස් පැමිණිල්ලක් සටහන් කල බව ඔවුන් විසින් තමාට ප්‍රකාශ කල බව.

- ඉන්පසුව පොලිස් නිලධාරින් හතරදෙනෙකු ක්‍රීඩාපිටියට පැමිණ පුතාවයි, අපොන්සුවයි අරගෙන පොලිසියට ගිය බවත්, එම අයව පොලිසියේ රඳවා සිටින බවත්, හෙට උදේට පැමිණිල්ල සමාදානයට පත්කර ගමු යැයි ඔවුන් විසින් තමාට ප්‍රකාශ කල බව.

- තමා, තම පුත්‍රයා සහ ස්වාමිපුරුෂයා එම ස්ථානයේ පාන්දර 3.10 වනතුරු ඔවුන් සමඟ සාකච්ජා කරමින් සිට පසුව සුසන්තගේ නිවසට ගිය බවත්, තමාත් ස්වාමි පුරුෂයාත් මල්ලිගේ ගෙදරට ගොස් ඔවුන්ට පණිවිඩයක්දි නැවත නිවසට පැමිණි බවත්, පසුදින උදෑසන 6.00ට අගුලාන පොලිස් ස්ථානයට ගොස් බලන ලද නමුත් දරුවන් දෙන්නා සිරමැදිරියේ නොසිටි බවත්, වෙනත් දෙදෙනෙකු සිරමැදිරියේ සිටි බවත්, සිරමැදිරියේ සිටි බැසිල්ගෙන් ඊයේ රාත්‍රියේ කුඩුවේ සිටි දෙන්නා කෝ කියා ඇසු විට පාන්දර 2.30ට පමණ පොලිසියෙන් එළියට අරන් ගිය බව ඔහු තමන්ට ප්‍රකාශ කල බව.

- ඒ වන විට පොලිස් ස්ථානයේ නිලධාරින් නොසිටි බවත්, සිරමැදිරියේ සිටි අය සමඟ කතා කර අවසන් විමත් සමඟ පොලිස් නිලධාරියෙකු වැඩ භාර ගැනිමට පැමිණි බවත්, ඔහුගෙන් පුතාලා දෙන්නා ගැන විමසු විට ගල්කිස්ස පොලිස් ස්ථානයට යන ලෙස නියෝග කල බව.

- තමන් තම දරුවා පිළිබඳව තොරතුරක් නොමැතිව අසරණවු බවත්, එම අවස්ථාවේම මෙන් එතැනට පැමිණි අයෙකු තම ස්වාමි පුරුෂයාට කතා කර රත්මලාන සමුපකාරය පිටුපස ලස්සන කොල්ලෙක් මරලා දාලා ඉන්නවා දුටු බවද, අත්දෙකේ පච්චා කොටා ඇති බවත්, කහ පාට ටිෂර්ට් එකකින් අත්දෙක ගැට ගසා ඇති බව පැවසු පසු ඒ ගැන සැකයක් ඇති වි වහාම එම ස්ථානයට ගිය බවත්, එවිට එම ස්ථානයේ තම පුතාගේ මළ සිරුර වැටි තිබෙනු දුටු බවත්, ඔහුගේ අතේ ලේ තැවරි තිබෙනු දුටු බවත්, තවද ඔහුගේ හක්ක තැලි පොඩිවි තිබුණු බවත්, හක්ක යට ලොකු තුවාල තිබු බවත්, තම දරුවාට වෙඩි තබා තිබෙනු දුටු බවත් ඔහුගේ කකුලක්ද කඩා තිබෙන බව තමා දුටු බව.

- පෙරදින තමන් සුනාමි කඳවුරේ සිටියදි පාන්දර 2.30ට පමණ පොලිස් ජිප් රථයක් මොරටුව පැත්තට ගොස් නැවත පැය කාලකට පසු ඉතා වේගයෙන් රත්මලාන පැත්තට යනු දුටු නමුත්, තමන් එම අවස්ථාවේ ඒ පිළිබඳව එතරම් තැකීමක් නොකල බව.

- තමන් පසුදා 7.30ට පමණ අගුලාන පොලිස් ස්ථානයට ගොස් තම දරුවාට සිදුකර ඇති අපරාධය ස්ථානය භාර නිලධාරියාට සැල කල පසු ඔහු විසින් තම දරුවා පොලිසියට ගෙන ආවේ නැහැ කියා ප්‍රකාශ කල බව.

- තම පුතා කිසිදු වරදකට වරදකරුවකු වු අයෙකු නොවන බව.

### 1.1.2. 2009-08-18 දිනැති මුතුතන්ත්‍රි බස්තියම් ගේ සුසන්ත ප්‍රියලාල් ප්‍රනාන්දු යන අයගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු

- 2009-08-12 වන දින අගුලාන පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන පහර දිමෙන් පසු වෙඩි තබා ඝාතනය කළ බවට සැක කෙරෙන මුතුතන්ත්‍රි බස්තියන්ගේ දිනේෂ් තරංග ප්‍රනාන්දු තම සහෝදරයා බව හා එම සහෝදරයා මින් පෙර කිසිදු ආකාරයක වැරැද්දකට සම්බන්ධ නොවි ඇති බවද රැකියාව ලෙස මාළු වෙළඳාමේ නියුතුව සිටි බව.

- 2009-08-12 වනි දින රාත්‍රී 12.00-1.00ත් අතර තම අසල්වැසියකු වන අනිල් පිරිස් නැමැත්තා නිවසට පැමිණ "අයියේ, අන්න පුතාට පොලිසියෙන් ගහනවා, මේ බව කිව්වේ ගේට්ටුවේ ඉන්න ග්‍රාමාරක්ෂක භටයා හොඳටම ගහනවලු. ගිහින් බලන්න" යනුවෙන් පැවසූ බවත්, ඒ සමගම තම පියා වන සංඝදාස ප්‍රනාන්දු සහ මව වන ස්වර්ණලතා අපොන්සුද අසල්වැසි කාන්තාවක් වන තමරා අක්කාද සමග තමා අගුලාන පොලිස් මුරපොල වෙත ගිය බව.

- එසේ යන විට පොලිසිය තුල සිටි නිලධාරියෙක් තමන්ට පරුෂ වචනයෙන් බැණ වැදුන බවත්, එසේ නමුත් තමා තම පියා සමග පොලිසිය තුළට ගොස් තම සහේදරයා සහ ඔහු සමඟ රැගෙන ආ බවට දැනගත් අනෙක් තරුණයා ගැන විමසූ බවත්, එවිට ස්ථානයේ සිටි නිළධාරින් විසින් "රෑ 10 න් පස්සෙ අත්අඩංගුවට ගත් අය ගැන බලන්න බැහැ. උදේ වරෙන්" යැයි පැවසූ බැවින් නැවත පැමිණි බව.

- පොලිස් ස්ථානයේ තම සහෝදරයා නොමැති වුවද ඔහු සුනාමි කඳවුර අසල ක්‍රිඩා පිට්ටනියේ හවස් කාලයේ රැඳිසිටි බවට ලද තොරතුරු අනුව ඒ අසල පිහිටි සුනාමි කඳවුරට ගිය බවත් ඒ වනවිට එහි නිවාසයන්හි නිදා නොගෙන සිටි තැනැත්තන්ගෙන් සහෝදරයන් ගැන විස්තර විමසූ බවත්, එහි සිටි කාන්තාවක් විසින් පොලිසියට මල්ලිලා සම්බන්ධව දුරකතන ඇමතුමක් දුන්නේ තමන් බව ප්‍රකාශ කල බවත්, ඇය විසින් පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනිමට එකග වූ බවත්, ඒ සඳහා උදේට කටයුතු කිරිමට හැකි බව ඇය සමඟ සිටි අයවලුන් තමන්ට දැන්වූ බව.

- පසුදින උදේ එනම් 2009-08-13 වන දින තම යාළුවෙක් වන අරුණ දිලුක් හෙවත් පොඩා යන අය නිවසට පැමිණ "අන්න උඹගෙ මල්ලි මරා දාලා යැ"යි පැවසූ බවත්, එසැනින් තමා බයිසිකලය රැගෙන අගුලාන පොලිස් ස්ථානයට ගිය බවත්, එහි ලොකු මහත්තයා වන නිවුටන් මහතා සිටි බවත් ඔහුට මේ සිද්ධිය සම්බන්ධව පැවසූ නමුත් ලොකු මහතා මේ සිද්ධිය සම්බන්ධයෙන් තමන් කිසිත් නොදන්නා බවත්, සොයලා බලන්නම් යැයි තමන්ට පැවසූ බව.

- මෙම සිද්ධිය ලැව් ගින්නක් සේ අවට ප්‍රදේශවලටද පැතුරුණු බවත්, මෙම අසාධාරණ ක්‍රියාවෙන් ප්‍රකෝපව රැස්වූ පිරිස ගල්මුල් වලින් පොලිසියට පහරදි අලාභ හානි සිදුකල බව.

- සිය සහෝදරයා සහ ඔහුගේ යහළුවා යන දෙදෙනාගෙන් එක් අයෙක් රත්මලාන ඥානෝදය පාරේ වෙරළේද, අනෙක් අය ලුනාවේ සිට රාවතාවත්ත පාරේ පාලමක් අසල වෙඩි තබා ඝාතනය කොට සිරුරු දමා ගොස් තිබූ බවද, තමා සිය සහෝදරයාගේ මෘත ශරිරය අසලට ගොස් පරික්ෂා කල බවත්, ඔහු අත්දෙක පපුවට තබාගෙන මුණින් අතට වැටී සිටි බවත්, මුහුණ වැලි අතරේ සිටින සේ වෙඩි තබා තිබූ බව.

- 2009-08-13 වන දින දවල් 11.30-12.00ට පමණ පැවති ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත්වරයාගේ මරණ පරික්ෂණයේදී සිය සහෝදරයාගේ මෘත ශරිරය හඳුනා ගත් බවත්, සහෝදරයා අවසන් වරට ඇඳ සිටි ඇඳුම් අතරින් කහපාට ටිෂර්ට් එක ඔහුගේ ඉනේ ගැට ගසා තිබූ බවත්, සහෝදරයාගේ බෙල්ලේ සහ පපුවේ වෙඩි පහරවල් දෙකක් තිබෙනු දුටු බව හා පහර දිමෙන් සිදුවූවේ යැයි සැකකල හැකි පහරවල් පිටේ තිබූ බව.

- තමා කළුබෝවිල රෝහලට ගොස් මෘත ශරිරය ලබා ගැනිමේ කටයුතු අවසන් කර පොලිස් ස්ථානයටද ප්‍රකාශයක් ලබාදි සහෝදරයාගේ මළ සිරුර මල් ශාලාවකට භාරදුන් බවත්, 2009-08-16 වන දින අවසන් කටයුතු සිදුකල බව.

- ගල්කිස්ස අධිකරණයේ අංක 2518/09 යටතේ පවරා ඇති නඩුවේදි 2009-08-26 වන දින සාක්ෂි දෙන ලෙසට උපදෙස් ලැබී ඇති බව.

- 2009-08-13 වන දින රාත්‍රී පොලිසියේ සියළු දෙනා අත්අඩංගුවට පත් වූ බව දැනගන්නට ලැබුණු බවත්, මෙම සිද්ධිය ඇසින් දුටු අයවලුන් ලෙස එදින රාත්‍රී අගුලාන පොලිස් මුරපොලේ රාජකාරි

කල ග්‍රාමාරක්ෂක නිළධාරි මෙන්ම එදින අගුලාන පොලිස් මුරපොලේ සිර මැදිරියේ සිටි බැසිල් සහ බෙරගහන ගෙදර කුමාර යන තැනැත්තන් සාක්ෂි සපයන බව.

### 1.1.3. මුතුතන්ත්‍රි බස්තියන්ගේ සංඝදාස ප්‍රනාන්දු යන අයගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු

- වෙඩි තැබීමෙන් මියගොස් ඇති මුතුතන්ත්‍රි බස්තියන්ගේ දිනේෂ් තරංග ප්‍රනාන්දු යන තමාගේ පුතා වයස අවුරුදු 26 ක අවිවාහක තරුණයකු බවත්, රැකියාව ලෙස මාළු වෙළදාම් කරන ලද බව.

- 2009.08.12 වන දින තම පුතා මාළු වෙළඳාමට ගියේ නැති බවත්, එදින සවස 5.00 ට 6.00ට පමණ ඉස්කෝලේ වත්තට සෙල්ලම් කරන්න ගිය නමුත්, ඔහු රෑ වෙනකම් ගෙදර පැමිණියේ නැති බවත්, රාත්‍රි 1.00ට පමණ අනිල් නැමති අය පැමිණ ගේට්ටුවට ගසා තමාට කථා කර තම පුතාට පොලිසියෙන් ගහන බව දැණුම් දුන් බව.

- තමා තම බිරිඳ වන පී. එම්. ස්වර්ණලතා අපෝන්සු සහ අසල්වැසියෙකු වන තමරා අක්කා යන අය සමග අගුලාන පොලිසියට ගිය බවත්, එවිට පොලිස් ස්ථානයේ රාළහාමිලා තුන්දෙනෙක් සිටි බවත්, ඔවුන්ගෙන් "දැන් ගෙනාපු ළමයි කෝ" කියා ඇසූ බවත්, ඒ වනවිට රාත්‍රි 1.30 පමණ වී තිබූ බව.

- එම අවස්ථාවේදි හෙට උදේට එන්න කියා පොලිසියෙන් කියූ බවත්, ඉන් අනතුරුව තමන් ගෙදර පැමිණි බවත්, උදේ 6.00 ට පමණ කෝපි බෝතලයකුත් රැගෙන තම පුතා බැලීමට පොලිස් ස්ථානය වෙත ගිය බව හා එහි සිටි නිලධාරීන්ගෙන් "ඊයේ රෑ ගෙනා ළමයි කෝ" කියා ඇසූ විට ගල්කිස්සට ගෙනිච්ච බව දැනුම් දුන් පසුව, බයිසිකලය රැගෙන ගල්කිස්ස දෙසට ගිය බව හා ඒ අවස්ථාවේ පාරේ සිටි අයෙකු මොකද හදිස්සියේ කියා තමාගෙන් විමසූ බවත්, එවිට පුතා පොලිසියෙන් අල්ලලා ගල්කිස්සට ගෙනිච්චා කිව්වා, ඒ නිසා ඒ පැත්තට යනවා කියා පිළිතුරු දුන් බවත්, එම අවස්ථාවේ එම පුද්ගලයා සුදු ලස්සන අත්දෙකේ පච්ච දෙකක් කොටපු නිල් පාට කලිසමක් ඇඳපු කොල්ලෙක් මරලා දාලා තියෙනවා කියා තමාට දැනුම් දුන් බව.

- තමා එම ස්ථානයට ගොස් පරික්ෂා කරන විට එම ස්ථානයේ මරා දමා තිබුනේ තමාගේ පුතා වන මුතුතන්ත්‍රි බස්තියන්ගේ දිනේෂ් තරංග ප්‍රනාන්දු යන අය බව හඳුනාගත් බවත්, ඔහුගේ මළ සිරුර මුනින් අතට වැටී තිබූ බවත්, කහපාට ටී ෂර්ට් එක ඉනේ බැඳ තිබූ බවත්, පිට නිල් පාට වී තිබූ බවත්, පිටේ බයිසිකල් චේන් පාරවල් හා සපත්තු පාරවල් තිබෙනු දුටු බව.

- ඉන් අනතුරුව තමා නැවත අගුලාන පොලිසිය අසලට ගොස් "මගේ කොල්ලට වෙඩි තියලා මරලා තියෙනවා" කියා කෑගැසූ බවත්, ඊට පසු අවට සිටි මිනිසුන් ප්‍රකෝප වී පොලිසියට ගල්වලින් ගහන්න පටන්ගත් බව.

- ඉන් අනතුරුව කළුබෝවිල රෝහල වෙත ගොස් මළසිරුරු භාර ගන්නා ලෙසට උපදෙස් ලැබුනු බවත්, කළුබෝවිල රෝහලෙන් මළසිරුරු භාරගෙන මල් ශාලාවට භාරදුන් බව.

- කිසිදු වරදක් නොමැතිව තමාගේ පුතා අත්අඩංගුවට ගෙන මෙසේ වෙඩි තබා මරා දමා ඇති බවත්, තම පුතා තවත් අයෙකු සමග ගොස් ඉස්කෝලේ වත්ත අසල ගේකින් ගින්දර ඉල්ලා ඇති බවත්, එම අවස්ථාවේදි එම නිවසේ කාන්තාවගේ අතින් ඇල්ලූ බවට එම කාන්තාව පොලිස් ස්ථානය වෙත ගොස් පැමිණිලි කිරීම මත මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවට ආරංචි ලැබී ඇති බව.

**1.1.4 දනුෂ්ක උදයකාන්ත යන අයගේ මව වන දේවිකා ප්‍රනාන්දු යන අයගේ අනාවරණය කර ගන්නා ලද කරුණු**

- සිය පුතා ගොළුමඩම කාය වර්ධන මධ්‍යස්ථානයක සේවය කල බවත්, 2009-08-12 වන දින තමා වැඩට ගොස් සවස 5.00ට පමණ නිවසට පැමිනි බවත්, එවිට තම පුතා නිවසේ නිදාගෙන සිටිනු දුටු බව.

- පසුව ඔහු සවස් කාලයේ කොම්පියුටරයට කේබල් එකක් අරගෙන එන්නම් යැයි පවසා පාර පැත්තට ගිය බවත්,පසුව ඔහු නිවසට දුරකතනයෙන් කතා කොට රෑ 10.00-10.30ට පමණ පැමිණෙන බව පවසා ඇති බවත්, එසේ නමුත් රෑ 11.30 වන තෙක් පුතා නිවසට නොපැමිනි බව.

- පසුව රෑ 3.00ට පමණ ධනුෂ්ක ගේ මව වන ස්වර්ණා අක්කා නිවසට පැමිණ ළමයි පොලිසියෙන් අල්ලලා යැයි දැනුම් දුන් බවත්, පසුව තමා ස්වාමිපුරුෂයා සහ පොඩිපුතා සමඟ පොලිසියට ගොස් තම දරුවා පිළිබඳව සොයා බැලු බව.

- දරුවා පොලිසියේ නොසිටි බවත්, පසුව ස්වර්ණා අක්කා දැනුම් දුන් පරිදි තම දරුවන්ට විරුද්ධව පැමිනිල්ලක් කලා යැයි කියන පිරිස හමුවීමට සුනාමි වත්තට ගිය බවත්, එම පිරිස හමුවී කතාබස් කර නැවත නිවසට පැමිනි බව.

- පසුදින සිය දරුවා ලුනාව පාලම අසල මරා දමා ඇති බව දැනගන්නට ලැබුණු බව.

**1.2. ස්වාධීන සාක්ෂි**

**1.2.1. අගුලාන පොලිස් ස්ථානයේ සිරමැදිරියේ රඳවා සිටි ගාල්ලගේ බැසිල් ප්‍රනාන්දු යන අයගෙන් අනාවරණය වන ලද කරුණු**

- තමා මොරටුව අගුලාන, සමුද්‍රසන්න මාවත, අංක 366හි පදිංචි අයෙකු බව.

- තමාව 2009.08.11 වන දින පස්වරු 4.00ට පමණ බීරිඳත් සමග ඇති වු බහින් බස්වීමක් සම්බන්ධයෙන් අගුලාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් රැගෙන ගිය බව හා පොලිස් ස්ථානයේ සිරමැදිරියේ රඳවා තැබු බවත්, පැයකට පමණ පසුව දමිත් කුමාර නැමැති අයවද සිරමැඳිරියට ගෙන ආ බවත්, ඉන්පසුව ඔවුන් දෙදෙනා සිරමැදිරියේ සිටින අතරදි <u>රාත්‍රී 11.00ට පමණ තරුණයින් දෙදෙනෙක් පොලිසියෙන් රැගෙන ආ බව</u>

- ඔවුන් රැගෙන ආ පොලිස් නිලධාරීන් ලෙස කුමාර, ප්‍රදිප්, විජේගේ මස්සිනා කුලතුංග සහ තවත් පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකු හඳුනාගත් බව.

- ඔවුන් සියලුදෙනාම මෙම තරුණයින් දෙදෙනාට පහර දුන් බවත්, පහර දෙනු ලැබුවේ අතින් පයින් බව.

- <u>එම තරුණයින් දෙදෙනා තමා හඳුනන සංඝදාස සහ සමන් යන අයගේ පුතුන් වන ධනුෂ්ක සහ දිනේෂ් බවට හඳුනා ගත් බව</u>

- පහර දිමෙන් පසුව තරුණයින් දෙදෙනාව තමා සිටි සිරමැදිරියට දැමූ බවත්, ටික වේලාවකට පසුව ඕ.අයි.සි මහතා තරුණයින් දෙදෙනාව රැගෙන එන ලෙස පවසන ඇසුනු බවත්, පොලිස් නිළධාරීන් ස්ථානාධිපතිවරයාගේ කාමරය වෙත දිනේෂ් සහ ධනුෂ්කව රැගෙන ගිය බව.

- පසුව ලොකු මහත්තයා ගින්දර ගේන්න කියනවා තමාට ඇසුණු බවත් පසුව පොලිස් නිලධාරියෙක් කාමරයකට ගොස් ලයිටරයක් ගෙන යනු දුටු බව

- පසුව පහර දෙන ශබ්දයක් ඇසුණු බවත් ඊට පැය 1 /2කට පසුව දිනේෂ් සහ ධනුෂ්කව දෑත් පිටුපසට කර බැඳ මාංචු දමා ෂොපින් බෑග් ඔලුවට දමා ගැට ගසා පොලිස් පිජ් රථයට දැමූ බවත් එම අය පොලිස් පිජ් රථය දක්වා පයින් ඇවිද ගිය බවත් ඔවුන්ට පිටුපසින් පොලිස් නිලධාරින් තුවක්කු 4ක්ද රැගෙන ගොස් පිජ් රථයකට නඟින අයුරු දුටු බවත් ඕ.අයි.සි මහතා පිජ් රථයේ ඉදිරිපසට ගොඩවනු සිරමැදිරියේ සිට තමා දුටු බව

- පසුව අළුයම 2.00ට 2.30ට පමණ පොලිස් පිජ් රථය නැවත පොලිස් ස්ථානයට පැමිණි බවත්, නමුත් දිනේෂ් හා ධනුෂ්ක පැමිණියේ නැති බවත් ඊට පසුදින උදේ සංඝදාස හා දේවිකා යන අය පොලිසියට පැමිණි බවත් පොලිසියේ අයගෙන් දරුවා පිළිබඳව විමසනු දුටු බවත් එවිට ස්ථානාධිපතිවරයා පැමිණ ඔවුන්ට යම් කිසිවක් පවසනු තමා දුටු බව

- **පසුව ස්ථානාධිපතිවරයා තමා ලඟට පැමිණ කිසි දෙයක් දැක්ක බව නොකියන ලෙසත් ඔවුන් දෙදෙනා කූඩුවේ සිටිය බවට නොකියන ලෙසට උපදෙස් දුන් බව**

- පසුව පොලිසිය ඉදිරිපිට විශාල ඝෝෂාවක් ඇසුණු බවත් ගල් ගසා විදුරු බිඳින හඬ ඇසුණු බවත් එවිට පොලිස් නිලධාරීන් තුවක්කු වලින් අහසට වෙඩි තැබූ බව

- පසුව ගල්කිස්ස පොලිසියේ නිලධාරීන් පැමිණ තමා සහ සිර මැදිරියේ සිටි අනෙක් අයව පිජ් රථයක දමා ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ගෙන ගොස් ටික වේලාවකට පසුව කළුබෝවිල රෝහලට ගෙන ගිය බවත් ඉන්පසුව මල් ශාලාවට ගොස් මෘත ශරීර දෙක පෙන්වූ බවත් එවිට තමන් එම මෘත ශරීර දෙක පෙර දින පොලිස් කූඩුවේ සිටි දිනේෂ් සහ ධනුෂ්කගේ බව හඳුනා ගත් බව

- මේ පිලිබඳව ගල්කිස්ස පොලිස් ස්ථානයට ප්‍රකාශයක් ලබා දුන් බවත් පසුව ඔවුන් දෙදෙනාව මුදා හැරිය බව

**1.2.2.දැකුම්පිටිය ආරච්චිගේ දමිත් කුමාර යන අයගෙන් අනාවරණය කර ගන්නා ලද කරුණු**

- තමාව අගුලාන පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීමෙන් පසු 2009.08.11 වන දින පස්වරු 4.30 සිට 2009.08.13 වන දින උදේ දක්වා අගුලාන පොලිසියේ සිර මැඳිරියේ රඳවා සිටි බවත් තමා 2009.08.12 වන දින රාත්‍රියේද සිර මැඳිරියේ සිටි බව

- එදින රාත්‍රි 10.00 ට පමණ කාන්තාවන් දෙදෙනෙකු සහ පිරිමියෙකු පොලිසියට පැමිණිල්ලක් කරන්න පැමිණි බවද ඔවුන් විසින් ඉස්කෝලවත්තේ දෙන්නෙක් බීබී ඉන්න බවත් ඒ අය ගින්දර ඉල්ලන්න ආ බවත් එවිට කාන්තාවන් දෙදෙනාගෙන් තරුණ කාන්තාවගේ අතින් ඇල්ලූ බව ඒ අවස්ථාවේ ස්ථානයේ සිටි නිලධාරීන්ට ප්‍රකාශ කරනු තමාට ඇසුනු බව

- තමා සිර කූඩුව තුළ සිටින විට පැමිණිල්ල කරන්න පැමිණි අය තමාට පෙනුනු බවත් ඔවුන් ඉහත ආකාරයට ප්‍රකාශ කරනු තමාට ඇසුනු බව

- ඒ අනුව එක් පොලිස් නිලධාරියෙකු පැමිණිල්ල ලියාගත් බවත් ඊට පසු "ඕගොල්ලෝ යන්න අපි ඒ කට්ටිය ගේන්නම්" කියා පොලිස් නිලධාරියා ප්‍රකාශ කරනු ඇසුනු බව

- ඊට ටික වේලාවකට පසු පොලිස් නිලධාරීන් හතරදෙනෙකු පමණ පොලිස් ස්ථානයෙන් පිටව ගිය බවත් පැය භාගයකට පමණ පසු පුද්ගලයන් දෙදෙනෙකු පොලිසියට ගෙන ආ බව දුටු බව

- පොලිසියට ගෙන ඒමෙන් පසු සිරමැදිරිය ඉදිරිපිටදී පොලිස් නිලධාරීන් වටවී ඔවුන් දෙදෙනාට පහරදෙනු දුටු බව

- ඉන්පසු එම අයවලුන්ව සිරමැඳිරියට දැමූ බවත් සිරමැඳිරිය තුළදී තමා ඔවුන් සමග කථා කල බව

- එම පුද්ගලයන් දෙදෙනාගෙන් තමන් "මොකද මල්ලි ඕගොල්ලෝ ගෙනාවේ" කියා ඇසූ බවත් එයට පිළිතුරු ලෙස ඔවුන් "අපිව ගෙනාවේ නිකං,වරදක් කරලා නෙමේ" යනුවෙන් ප්‍රකාශ කල බව

- ඉන් අනතුරුව ස්ථානාධිපතිවරයා පැමිණීමෙන් පසුව ඔවුන්ව කූඩුවෙන් එළියට ගෙන ස්ථානාධිපතිවරයාගේ කාමරයට රැගෙන ගිය බවත් එහිදී ඔවුන්ට පහරදෙනු ඇසුනු බවත් පටියකින් වැනි දෙයකින් පහරදෙනු ඇසුනු බවත් ස්ථානාධිපතිවරයා ලයිටරයක් ගේන්න කියා කෑගසා කියනු ඇසුනු බව

- පැය භාගයකට පමණ පසු එම තරුණයන් දෙදෙනාව ෂොපින් බෑග් දෙකක් ඔළුවට දමා අත් පිටුපසට කර බැඳ ජීප් එකේ දාගෙන රැගෙන ගිය බවත් ඒවනවිට රාත්‍රි 1.30 ට පමණ වී තිබූ බව

- ඊට පසු නැවත පොලිසියට ඔවුන් රැගෙන ආවේ නැති බවත් පිටවී ගිය නිලධාරීන් පමණක් පැමිණෙනු දුටු බවත්

- රාත්‍රි 4.30 ට පමණ එක් නිලධාරියෙකු ජීප් රථය සෝදනු දුටු බවත් මියගිය තරුණයන් දෙදෙනාගේ සිරුරු තමාට පෙන්වූ අවස්ථාවේදී එම මළ සිරුරු කලින් දින රාත්‍රියේ එනම් 2009.08.12 වන දින රාත්‍රියේ සිර මැදිරියේ සිටි පුද්ගලයින් දෙදෙනාගේ බව තමා හඳුනාගත් බව

## 1.2.3.මහමරක්කල කුරුකුලසූරිය පටබැඳිගේ උදයසිරි පෙරේරා යන අයගෙන් අනාවරණය කර ගන්නා ලද කරුණු

- 2009.08.12 වන දින රාත්‍රි තමා නොම්මර 39, මුහුදු බඩ පාර, අගුලාන ලිපිනයේ පිහිටි තමාගේ කඩේ වැඩ කරමින් සිටි බවද එදින රාත්‍රි 11.32 ට පමණ මියගිය දිනේෂ් සහ ධනුෂ්ක යන දෙදෙනා තමාගේ කඩයට පැමිණ කෑම ඉල්ලූ බවත් කඩේ කෑම අවසන් වී තිබූ බැවින් කේක් කෑලි දෙකක් පමණක් ගෙන ඔවුන් කෑ බවත් ඉන් පසු තමා විසින් "දැන් රෑ වෙලානේ මල්ලි ඕගොල්ලෝ ගෙදර යන්න" කියා ඔවුන්ට පැවසූ බවත් ඉන්පසු ඒ දෙදෙනා පිටවී ගිය බව

- රාත්‍රි 2.00ට විනාඩි පහක් පමණ තිබියදී තමා කඩය වැසූ බවත් ඊට පස්සේ මුත්‍රා කිරීමට එළියට බැස්ස බවත් ඒ වේලාවේ කඩය ඉදිරිපිටින් පොලිස් ජීප් රථය වේගයෙන් ලුනාව පැත්තට යනු දුටු බව

### 1.2.4. රංගිගේ අනිල් පීරිස් යන අයගේන් අනාවරණය කර ගන්නා ලද කරුණු

- තමා මොරටුව, අගුලාන, මුහුදුබඩ පාර, අංක 237 හි පදිංචි අයෙකු වන අතර රැකියාව වශයෙන් අගුලාන ආර්ථික මධ්‍යස්ථානයේ කම්කරුවෙකු ලෙස සේවය කරන බව

- 2009.08.12 වන දින තමා පොලිසිය අසල ආර්ථික මධ්‍යස්ථානයේ වැඩ නිමවී රාත්‍රි 12.30ට පමණ තවත් යහළුවන් තිදෙනෙකු සමග පැමිණි බවත් ඉවත දමන මාළු සුන්බුන් දැමූ භාජන විසිකිරීමට තිබූ බැවින් ඒවාද රැගෙන මුහුද පැත්තට ගිය බවත් ඒ යනවිට අගුලාන පොලිසිය ඇතුලේ කාට හෝ ගහන ශබ්දයක් ඇසුනු බවත් තමා මුහුද අසලට ගොස් මාළු භාජන ටික අස්කර ඉක්මනින් පැමිණ නැවත වතාවක් පොලිසිය අසලට ගොස් ඒ පිළිබඳව විපරම් කල බව

- එහි සිටි ග්‍රාමාරක්ෂක සුසන්ත යන අය තමා හඳුනන බවත් කාටද ගහන්නේ කියා තමා ඔහුගෙන් විමසූ බවත් <u>**ඒ අවස්ථාවේ සංඝදාස අයියාගේ පුතාට ගහනවා**</u> කියා ග්‍රාමාරක්ෂක සුසන්ත තමාට ප්‍රකාශ කල බව

- එසේ තමා පොලිසිය ඉදිරිපිට බලා සිටින විට සාපන් කුමාර එතැනටවිත් තමාට පරුෂ වචනයෙන් බැණ,පහරදුන් බවත් ඊට පසු තමා එම ස්ථානයෙන් ඉවත්ව සංඝදාසගේ නිවසට ගොස් ඔහුගේ පුතාට පොලිසියෙන් පහරදෙන බව නිවසේ අයට දැන්වූ බව

### 1.2.5. වල්පොල ගමගේ සුසන්ත ජයලත්ගෙන් අනාවරණය කර ගන්නා ලද කරුණු

- අගුලාන පොලිස් ස්ථානයේ 2009-08-12 වන දින රාත්‍රි ප්‍රධාන ගේට්ටුවේ ආරක්ෂක රාජකාරි කරන ලද සිවිල් ආරක්ෂක නිළධාරියා බව

- 2008-09-18 වන දින සිවිල් ආරක්ෂක බලකායට බැඳි 2008-10-20 දින සිට ගල්කිස්ස මුලස්ථාන පොලිසියට රාජකාරියට වාර්තා කල බවත්, 2008-11-24 වන දින අගුලාන පොලිස් මුරපොලට රාජකාරිය වාර්තා කල බව.

- 2009-08-12 වන දින අගුලාන පොලිස් මුරපොලේ ප්‍රධාන දොරටුවේ ආරක්ෂක රාජකාරියේ යෙදි සිටි බවත්, එදින පො.ප. නිවුටන් මහතා ස්ථානාධිපතිවරයා ලෙස රාජකාරි කල බවත්, උපසේවක ලෙස පො.කො. 67455 තොටවත්ත සිටි බවත්, ඊට අමතරව පො.කො. 71411 ධම්මික, පො.කො. කුලසිංහ, පො.කො. 65300 කුමාර, පො.කො. 81155 සේනාරත්න, පො.කො.රි. නවරත්න, පො.කො. දිසානායක රාජකාරියේ යෙදි සිටි බවත්, සමහරු විවේකය රපෝර්තු කර සිටි බව

- එදින සවස 6.00 ට රාජකාරි වාර්තා කල බවත් එම අවස්ථාවේදි අගුලාන පොලිස් මුරපොලේ සිරි මැදිරියේ අත්අඩංගුවට ගත් දෙදෙනෙකු සිටි බවත්, රාත්‍රි 7.00ට පමණ අත්අඩංගුවට ගෙන සිටි ගැහැණු අයෙකු සහ පිරිමි අයෙකු නිදහස් කල බවත්

- එදින රාත්‍රියේ පොලිස් ස්ථානාධිපති මහතා, ධම්මික රාළහාමි, කුලසිංහ රාළහාමි, කුමාර රාළහාමි, සිවිල් ආරක්ෂක සේනාරත්න යන නිළධාරින් පොලිසියේ සිට ගෙවල් 4ක් පමණ දුරින් පිහිටි කුලසිංහ රාළහාමි විවාහ වි සිටින නිවසේ සාදයකට සහභාගි වු බවත්, <u>**එවිට වේලාව රාත්‍රි 9.00ට පමණ ඇති බව**</u>

- <u>**මේ අතරතුර රාත්‍රි 11.00-11.30ට පමණ ත්‍රිරෝද රථයකින් පැමිණි පිරිසක් (එහි කාන්තාවන් දෙදෙනෙකු සහ පිරිමින් තිදෙනෙකු සිටි බවත්) ආමි එකෙන් කියලා දෙදෙනෙක් ඇවිත් නිදා ගෙන සිටින විට ඔවුන් අතර සිටි තරුණ කාන්තාවගේ අතින් ඇද්ද බව පවසා, ඒ සඳහා පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය බව තමන්ට දැන්වූ බව**</u>

- එවිට තමා පොලිස් උපසේවක ලෙස සිටි තොටවත්ත රාළහාමි ලඟට මොවුන් යොමුකල බවත්, ඉන්පසුව තොටවත්ත මහතා තමා හට සාදයේ සිටින කුමාර රාළහාමිව කැඳවාගෙන එන ලෙස දැන්වූ බැවින් තමා සාදය පැවති ස්ථානයට ගොස් කුමාර රාළහාමිට කතා කල බව

- මෙහිදි ස්ථානාධිපති ඇතුළු පිරිස එම නිවසේ ඉස්තෝප්පුවේ මත්පැන් පානය කරමින් සිටිනු තමා දුටු බව

- තමන්ගේ දැනුම් දිමට අනුව කුමාර රාළහාමි, ධම්මික රාළහාමි, කුලසිංහ රාළහාමි පොලිසියේ ගේට්ටුව ලඟට පැමිණි බවත්, පැමිණිලිකරුවන් පැමිණ සිටි ත්‍රිරෝද රථයෙන්ම පොලිසිය අසල සිට මීටර් 200ක් පමණ දුරින් පිහිටි සුනාමි කඳවුරට තමාද සමඟ ගොස් කාන්තාවට කරදර කරන ලද පුද්ගලයන් දෙදෙනා සොයා බැලු බවත්, ඔවුන් පිළිබඳ තොරතුරක් සොයා ගත නොහැකි වු බැවින් ආපසු පැමිණි බව

- එසේ පැමිණෙමින් සිටින අතරතුර පැමිණිලි දැම්මට පැමිණි වයසක අයෙකු එම ස්ථානයේදි “තොටවත්ත රාළහාමි ඒ දෙන්නව අල්ලා ගත්තා යැ”යි පැවසු බව

- තමා පොලිසියට පැමිණ පැමිණිලිකාරියන් හා නිලධාරින් සමඟ පොලිසියට ගිය බවත් පොලිසිය තුලදි උපසේවක රාජකාරියේ යෙදි සිටි තොටවත්ත මහතා ධනුෂ්ක නැමැත්තාට කකුලෙන් පහරක් දෙනු තමා දුටු බවත් කුමාර රාළහාමිද ධනුෂ්කට අතින් පහර කිහිපයක් ගැසු බවත්, ඒ වනවිට දිනේෂ් නැමැත්තා කුඩුවේ සිටි බව

- තමා මෙම කුමාර රාළහාමි අමතා දිනේෂ් නැමැත්තා තමා හොඳින් අඳුනන අයෙකු හෙයින් පහර නොදෙන ලෙස ඉල්ලු බව මෙහිදි උඹ පලයන් ගේට්ටුව ලඟට යැයි කුමාර මහතා තමාට පැවසු බව

- මෙම තරුණයන් දෙදෙනා අත්අඩංගුවට ගැනිම සම්බන්ධව තමා පොලිසිය ඉදිරිපිට ආර්ථික මධ්‍යස්ථානයේ ඉවතදමන මාළු ඔළු ආදිය ඉවත් කරන අනිල් නැමැත්තාට පැවසු බව එවිටම කුමාර රාළහාමි පැමිණ මෙම අනිල් නැමැත්තාටද පහර දුන් බව හා අනිල් දිවගිය බව

- රාත්‍රි 12.00ට පමණ ඕ.අයි.සි මහතා පොලිසිය තුලට ආ බවත් ඒ මහතාගේ කාමරයට ගිය බවත් මෙවිට පොලිසිය තුල සිදුවන සිදුවිම් හොඳින් නිරික්ෂණය කිරිමට හැකිවු බව

- පොලිසිය අවට සහ ඇතුලතද විදුලි ආලෝකය තිබුණු බවත් තොටවත්ත රාළහාමි පැමිණිල්ලක් කිරිමට පැමිණි තැනැත්තන්ව ඕ.අයි.සි මහතා වෙත රැගෙන යනු දුටු බවත්, කුඩුවේ සිටි තැනැත්තන්ද ඕ.අයි.සි මහතාගේ කාමරයට රැගෙන ගිය බව

- ඒ සමග ඕ.අයි.සි මහතාගේ ඇර තිබු ජනෙල් පියන් තුන කුමාර මහත්තයා වසා දැමු බවත්, ඔහු එලියට පැමිණ ත්‍රිවිල් රථයේ රබර්බිඩ්ම ස්ථානාධිපතිවරයාගේ කාමරයට රැගෙන ගිය බවත්,ටිකවේලාවකින් දිනේෂ්ටයි දනුෂ්කටයි ඕ.අයි.සි මහතාගේ කාමරයේදි පහර දෙනවා සහ ඔවුන් ඉතා උස් හඬින් කැගසනවා ඇසුණු බව

- මේ වනවිට අගුලාන පොලිසියේ සිර මැදිරියේ සිටි දෙදෙනාද ඇහැරිලා සිටිනු දුටු බවත් මේ අතරතුර පැමිණිලි ගොනුකිරිමට පැමිණි තැනැත්තන්ද ස්ථානාධිපතිවරයාගේ කාර්යාලයෙන් එළියට පැමිණ උපසේවක අසල තිබු බංකුවේ වාඩිවි සිටිනු දුටු බව

- ටික වේලාවකින් ස්ථානාධිපතිවරයා එලියට පැමිණ පසු නවරත්නට එන්න යැයි කැගැසු බවත්, නවරත්න විසින් පොලිසියේ නිල් පැහැති කැබ් රථය පොලිසිය ඉදිරියට රැගෙන ආ බවත්, 2009-08-13 වන දින අළුයම 12.25ට පමණ ඕ.අයි.සි මහතා සිවිල් ඇඳුමින් කැබ් රථයට නැගුනු බවත්, පසුපසින් කුමාර රාළහාමි සිවිල් ඇඳුමින් ස්වයංක්‍රිය ටි56 ගිනි අවියක් තබා ගෙන කැබ්

රථයකට නැඟුනු බවත් ඒ සමඟම ධනුෂ්ක සහ දිනේෂ් යන දෙදෙනා මාංචු දමා ගැට නොගසන ලද ෂොපින් බෑග් දෙකක් මුහුණුවලට දමා කැබ් රථයට නංවා ගත් බව

- මේ වේලාව වනවිට මෙම නිලධාරීන් බීමතින් සිටි බවත්, පොලිසියෙන් එලියට ආ කැබ් රථය පලමුවෙන් පොලිසියට දකුණු පැත්තෙන් පිහිටි දුම්රියපොළ පැත්තට ගිය බවත්, එසේ ගොස් විනාඩි 15-20කට පසු පොලිසිය ඉදිරිපිටින් නැවත රත්මලාන දෙසට යනු දුටු බවත්, මෙසේ යන අවස්ථාවේදි, තොටවත්ත රාළහාමි සහ තමා පොලිස් ස්ථානයේ මිදුලෙහි පිහිටි තැඹිලි ගස යට පුටු දෙකක් තබාගෙන කතා කර කර සිටි බව

- ටික වේලාවකින් දිනේෂ්ගේ තාත්තා පැමිණ තම ළමයින් ගැන විමසු බවත් "ඔවුන් දැන් බැලිමට බැහැ, උදේට එන්න" යැයි තොටවත්ත රාළහාමි පවසනු තමාට ඇසුනු බව

- 2009-08-13 වන දින අළුයම 2.30-3.00ට පමණ පිටතට ගිය කැබ් රථය නැවත පොලිස් ස්ථානයට පැමිණි බවත්, පළමුවෙන් ඕ.අයි.සි මහතා බැස ඇතුලට ගිය බවත්, කුමාර මහතාද ගිනි අවියද සමඟ පොලිස් ස්ථානය ඇතුලට ගිය බවත් නවරත්නද කැබ් රථය ගරාජයට දමා පොලිසිය තුලට යනු දුටු බව

- මෙහිදි දිනේෂ් හා ධනුෂ්ක නැමැත්තන් නැවත නොපැමිණි බවත් විනාඩි 15කට පසු ප්‍රදිප් රාළහාමිද පොලිස් ස්ථානය තුලට පැමිණි බවත්, ඒ මහතා කොළඹ පැවැත්වු ඕවර 20-20 ක්‍රිකට් තරඟයේ විශේෂ රාජකාරි නිමවි පොලිසියට පැමිණි බව

- පෙර කී පරිදි රත්මලාන දෙසට ගිය පොලිස් කැබ්රථය අගුලානේ දුම්රිය පොළ පැත්තෙන් වැල්ල අයින දිගේ පොලිසියට පැමිණ බව දුටු බව

- 2009-08-13 අළුයම 3-4ට පමණ ධනුෂ්කගේ අම්මාද තාත්තාද වෙනත් පොඩි ළමයෙක්ද පොලිසියට පැමිණ ධනුෂ්ක අත්අඩංගුවට ගත්තාදැයි අසා සිටි බව

- මෙහිදි තොටවත්ත රාළහාමි "ඒ අය කවුරුත් නැහැ, උදේ ඇවිත් ඕ.අයි.සි මහත්තයා හමුවෙන්නයැ"යි පැවසු බවත්, "සුනාමි කඳවුරේ අය කිවුවා මගේ පුතාව පොලිසියට අරගෙන ආවා ඒකයි බලන්න ආවේ යැ"යි එම අය පැවසු බව

- 2009-08-13 වන දින උදේ 6.00ට පමණ දිනේෂ්ගේ පියාත් පොලිසියට පැමිණි බවත්, ධනුෂ්කගේ මවද පැමිණි බවත් පැමිණ ඔවුනගේ දරුවන් පිළිබඳව විමසු බව

- උදේ රාජකාරි නිමවි ගෙදර ගොස් තමා මේ සම්බන්ධයෙන් තම පියාට දැන්වු බවත් අත්අඩංගුවට ගත් තැනැත්තන් දෙදෙනා මරා දමා ඇති බවට තොරතුරු ලද බවත් මේ සම්බන්ධයෙන් 119 දුරකතන අංකයට අමතා තමා මේ පිළිබඳව දැනුම් දුන් බවත්, මොරටුව පොලිසියටද, ගල්කිස්ස පොලිස් ස්ථානයටද දැන්විමට කිහිප අවස්ථාවකදිම උත්සාහ කලත් නොහැකි වු බව

- 2009-08-13 දවල් 1.00-2.00ට පමණ ගල්කිස්ස පොලිස් ස්ථානයේ මු.පො.ප. වරයා වෙත පැමිණ විස්තර පැවසිමට තැත්කල බවත් ස.පො.අ. 1 මහතා වෙත සම්පුර්ණ විස්තරය දැන්වු බවත් ඒ අනුව සියළුම නිළධාරීන් අත්අඩංගුවට ගෙන බන්ධනාගාර ගත කර ඇති බව

**1.3. වගඋත්තරකරුවන්ගෙන් හෙළිදරව් වූ කරුණු**

**1.3.1 මින්මතු පළවන වගඋත්තරකරු ලෙස හඳුන්වනු ලබන අගුලාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පො ප නිව්ටන්.**

- තමා 2008.02.13 වන දින සිට අගුලාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් සේවය කල බව

- 2009.08.12 වන දින පෙරවරු 5.30ට රාජකාරි ආරම්භ කල අතර පසුව දෛනික රාජකාරිවලට අදාලව කරනලද වැටලිම් වලින් පසු සැකකරුවන් හතරදෙනෙක් සවස සිරමැදිරියේ රඳවා සිටි අතර ඔවුන් අත්අඩංගුවට ගනු ලැබුවේ තමා සමඟ රාජකාරි කල නිලධාරින් බව

- තමා එදින 20යි 20 පකිස්තාන් ශ්‍රී ලංකා ක්‍රිකට් තරඟය තිබූ නිසා එම තරඟය නැරඹීමට 9.00ට පමණ සූදානම්වූ බවත් <u>**ඉන්පසු තරඟය මඳක් නරඹා නැවත රියදුරුට කතා කර හදිසියක් වුවහොත් කතා කරන ලෙස දන්වා නින්දට ගිය බව**</u>

- **තමා සම්පූර්ණ මැච් එක නොබැලූ බවත් නින්දට ගියේ පැය 21.30ට පමණ බව**

- තවද එදින විශේෂ රාජකාරි සඳහා නිලධාරින් පිටව ගොස් සිටි බව

- අගුලාන පොලිසියට කැබ් රථයක් ලබා දී තිබෙන බවත් එය නවරත්න විසින් පදවන බවයි. එදින ඔහු ඔළුව කැක්කුමක් නිසා රාත්‍රියේ හට නිවාසයේ නිදා ගත් බව

- තමා නිදා ගැනිමෙන් පසුව පොලිසියට එන පැමිණිලි උප සේවයේ නිලධාරියා විසින් සටහන් කරන බවත් එහිදි සුළු පැමිණිලි පිලිබඳව තමාට දැනුම් නොදෙන බවත් බරපතල සිද්ධියක් වාර්තා වූ විට එය තමාට දැනුම් දෙන බව

- රාත්‍රි කාලයේදි පොලිස් ස්ථානයෙන් පිටතට වාහන ගැනිමට පොලිස් කොස්තාපල් රියදුරුට හැකියාවක් නොමැති බවත් කැබ් රථය හා ත්‍රිවිල් රථයේ යතුරු උප සේවයට භාර දි ඇති බවත් වාහනයක් අරගෙන යනවා නම් ඒ බව තමාට දැනුම් දිය යුතු බව

- එදින ගේට්ටුවේ ආරක්ෂක සහයක සුසන්ත යන අය සේවයේ යොදා තිබුණු අතර එදින උප සේවයෙන් පැමිණිල්ලක් ලැබුණු බවට තමා වෙත ප්‍රකාශයක් නොකල බව

- 2009.08.13 වන දින රාජකාරි වාර්තා කිරිමට පෙර සිරමැදිරිය පරික්ෂා නොකල බවත් ඩී.ආර් එකේ නම් 2ක් තිබූ බවත් නිතර නිතර වරදවල් සම්බන්ධයෙන් අයවලුන් අත්අඩංගුවට ගන්නා බැවින් ඔවුන්ගෙන් කිසිවක් තමා විමසුවේ නැති බව

- පසුදින සේවයට වාර්තා කල වේලාව පැය 5.30ට පමණ බවත් එවිට උප සේවයේ සිටි පො කො 73207 විජේසුන්දර නිලධාරියා බවත් එම අවස්ථාවේදි සිරමැදිරියේ බැසිල් සහ තවත් අයෙකු සිටි බවත් පැමිණිලි කිසිවක් තිබෙනවාද යන්න තමා විමසූ බවත් ඔහු විසින් කිසිවක් නොමැති බව ප්‍රකාශ කල පසු තමා මුහුණ සෝදා ගෙන 6.30ට පමණ කාර්යාලයට ආ බවත් කාර්යාලයේ සිටින අවස්ථාවේදි දැක පුරුදු අයෙක් පැමිණ "ලොකු මහත්තයා මගේ පුතාලා දෙන්නා පොලිසියට රැගෙන ආවලු. නමුත් දැන් කූඩුවේ නැහැ" කියා ප්‍රකාශ කිරිමෙන් පසුව තමා රාත්‍රි උප සේවයේ සිටි තොටවත්ත සහ උප සේවයේ යෙදෙන විජේසුන්දර යන අය ඉදිරියට කැඳවා විමසූ බවත් ඔවුන් දෙදෙනා රාත්‍රියේ එවැනි දෙදෙනෙකු නොගෙන ආ බව ප්‍රකාශ කල බව හා පසුව තමා එම පුද්ගලයාට පැය 1/2 කින් විස්තර සොයා ප්‍රකාශ කරන බව දැන්වූ බව

- පුද්ගලයින් දෙදෙනෙක් වෙඩි තබා ඝාතනය කිරිම දැන ගත්තේ පුවත්පත් හා රූපවාහිනියෙන් බව

- පසුව තමාට සුනාමි කඳවුරෙ පිහිටි සුනාමි නිවසක කාන්තාවක් පොලිසියට කල පැමිණිල්ලක් සටහන් නොකොට පො.කො.ධම්මික, පො.කො.රෝහණ සහ පො.කො.කුලසිංහ යන නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් රේල්පාර උඩ **<u>බියර් බෝතල් බොමින් සිටින ලද</u>** සැකකරුවන් දෙදෙනෙකුව **<u>අත්අඩංගුවට ගෙන ඔවුන් දෙදෙනාට පොලිස් ස්ථානයේ ගේට්ටුව අසලදී හොදටම පහර දි ඇති බවත් එයට රිසව් තොටවත්ත සම්බන්ධ වි ඇති බව දැනගන්නට ලැබුණු බව</u>**

- **<u>ආරක්ෂාවට චෝදනාගාරයට භාර දිමේදිද තොටවත්ත පහරදි තිබෙන බවද දෙහිවල විශේෂ රාජකාරී ගිය සාජන් විකුම සැකකරුවන් දෙදෙනාව බලෙන් කුඩුවටදා ගෙන ඇති බව දැනගන්නට ලැබුණු බව හා</u>** ඉන්පසු ඔවුන්ට මොනවා උනාදැයි තමා නොදන්නා බව

- අදාල සැකකරුවන්ට වෙඩි තැබිම සම්බන්ධයෙන් කරන චෝදනා තමා ප්‍රතික්ෂේප කරන බවත් අත්අඩංගුවට ගැනිමක්, රඳවා තබාගැනිමක්, පහරදිමක් හෝ ඝාතනය කිරිමක් තමා විසින් නොකල බව

### 1.3.2 මින්මතු දෙවන වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන සිවිල් ආරක්ෂක භට ගොඩපිටියවත්ත ආරච්චිගේ ජනප්‍රිය සේනාරත්න යන අය

- 2009.08.12 වන දින අගුලාන පොලිස් ස්ථානයට ප.ව 3.30ට පමණ රාජකාරියට වාර්තා කල බව

- එසේ නමුත් තමා 11 වන දින රාජකාරියට වාර්තා නොකල නිසා එදින උපසේවක රාජකාරි වාර්තා කිරිමට අවසර නොදුන් බවත් ඒ අනුව තමා බැරැක්කයට ගොස් නිදාගත් බව

- ඉන් පසු රාත්‍රි 9.30 ට පමණ තමාද අගුලාන පොලිසියේ ස්ථානාධිපතිවරයාද කුමාර, ධම්මික, කුලසිංහ යන නිලධාරීන් සමග උපන්දින සාදයකට සහභාගි වු බව

- **<u>එහිදි තම කණ්ඩායම මත්පැන් පානය කරමින් සිටියදි කුමාර</u>** **<u>රාළහාමිට කෝල් එකක් ආ බවත්, ඒ වෙලාවේ ඔහු එම ස්ථානයෙන් ඉවත්ව ගිය බවත් ඊට ටික වේලාවකට පසු පැමිණ ඔහු කොල්ලෝ දෙන්නෙක් ගැනියෙක් ඇඳගෙන යන්න හදලා තියනවා කියා ස්ථානාධිපතිවරයාට දැන්වූ බව</u>**

- ඉන් පසුව ස්ථානාධිපතිවරයා එම පුද්ගලයන් අත්අඩංගුවට ගන්නා ලෙස දැනුම්දුන් බවත්, කුමාර නැමැති අය එතැනින් පිටව ගොස් විනාඩි 10 කට පමණ පසුව නැවත පැමිණ කොල්ලෝ දෙන්නා ගෙනාවා කියා ස්ථානාධිතිවරයාට දැනුම්දුන් බව

- තමන් නැවත පොලිසිය වෙත යන විට ඉහත සඳහන් පුද්ගලයින් දෙදෙනා සිරමැඳිරියේ සිටි බවත් ස්ථානාධිපතිවරයා ඔහුගේ කාමරයට අත්අඩංගුවට පත් වු දෙදෙනා සහ පැමිණිලිකාර කාන්තාවද කැඳවනු තමා දුටු බව

- ඉන් පසු, "තමුන් යනවා, මං එයාව බලා ගන්නම්" කියා පැමිණිලිකාර කාන්තාවට ස්ථානාධිපතිවරයා බැන වැදුණු බවත්, ඉන් පසුව ස්ථානාධිපතිවරයා "පොල්ලක් ගේන්න" කියා කුමාරට කියු බවත්, කුමාර ත්‍රිවිල් එකේ තිබෙන රබර් පටියක් ස්ථානාධිපතිවරයාට ගෙනගොස් දුන් බවද, ඉන්පසු ස්ථානාධිපතිවරයා අත්අඩංගුවේ පසුවන පුද්ගලයින් දෙදෙනාට පහර දුන් බව හා තමාට එය බලා හිඳිමට බැරි නිසා ගේට්ටුව ලඟට ගොස් සිද්ධිය බලා සිටි බව

- ඉන් පසු කුමාර සහ ස්ථානාධිපතිවරයා අත්අඩංගුවේ පසු වු පුද්ගලයින් දෙදෙනාගේ ඔලුවට ෂොපින් බෑග් 2ක් දමා අත් වලට මාංචු දමා එළියට ගෙනවිත් පිජ් රථයට දා ගත් බවත්, ගේට්ටුව

ලගදි තමාටත් පිජ් රථයට නඟින ලෙස ස්ථානාධිපතිවරයා දැනුම් දුන් නිසා තමාද එම පිජ් රථයේ නැඟි බව

- ඒ අනුව ස්ථානාධිපතිවරයා පිජ් රථයේ ඉදිරිපස අසුනේ හිඳගත් බවත් පි. සි. ඩි. නවරත්න වාහනය පදවා ගෙන ගිය බවත්, පිටුපස අසුනේ කුමාර රාලහාමි, කුලසිංහ රාලහාමි, ධම්මික රාලහාමි, දිසානායක රාලහාමි හා සිවිල් ආරක්ෂක සේනාරත්න වන තමාද අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයින් දෙදෙනා සමග ගමන් කල බව

- පලමුවෙන් පිජ් රථය ලුනාව දෙසට ගිය බවත්, ලුනාව දෙසට ගොස් වැලි පාරකට හැර වු බවත්, ඊට පසු පිජ් රථය නතර කොට අත්අඩංගුවේ පසු වු කොල්ලෝ දෙන්නාගෙන් එක් අයෙකු බිමට බස්සවා කුමාර රාලහාමි, ධම්මික රාලහාමි, ස්ථානාධිපතිවරයායි බිමට බැස එතැන සිට මීටර් කිහිපයක් දුරට ඔහුව එක්කගෙන ගිය බවත්, ඊට පසු වෙඩි ශබ්දයක් ඇසුණු බවත් ධම්මිකයි, ස්ථානාධිපතිවරයායි, කුමාරයි ඇවිත් පිජ් රථයට නැගිනු දුටු බව

- නැවත රත්මලාන දෙසට ටික දුරක් පිජ් රථය ගමන් කර රේල් පාරක් අසල නතර කල බවත් ස්ථානාධිපතිවරයායි ධම්මිකයි කුමාරයි පිජ් එකේ සිටි කොල්ලාද රැගෙන බිමට බැස්ස බවත්, ටික දුරක් ගිය පසු පලමු වෙඩි ශබ්දය ඇසුණු බවත්, ඉන් පසු ධම්මික පිජ් එකට නැග්ග බවත්, ඊට පසු තවත් වෙඩි ශබ්දයක් ඇසුණු බව

- ඉන්පසු කුමාරයි, ස්ථානාධිපතිවරයායි පිජ් එකට නැග්ග බවත්, එවිට කුමාරගේ අතේ වෙපන් එක තිබුණු බවත්, නැවත වාහනය පනගන්වා ගාලු පාරට පැමිණ කඩයක් ලඟ නතර කර පිරිස තේ බිමට ගිය බවත්, පැය 1/2 කට පසු නැවත කට්ටියම පිජ් රථයෙන් පොලිසියට පැමිණි බව

- පොලිස් ස්ථානයට පැමිණි පසු කුමාර නැමැති අය ටි 56 ගිනි අවිය ගලවා එයට මුත්‍රා කරන ලෙස ධම්මිකට කියු බවත් ඉන් පසු ධම්මික වෙපන් එකට මුත්‍රා කල බවත් පසුව වෙපන් එක පිරිසිදු කර ඔයිල් කර සිවිල් ආරක්ෂක සුසන්තට භාරදී ආයුධ පෙට්ටියට දාන ලෙස දැනුම් දුන් බව

### 1.3.3 මින්මතු තුන්වන වගඋත්තරකරු ලෙස සඳහන් වන පො.කො. ජයරත්නගේ ධම්මික නිහාල් ජයරත්න

- තමා පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස සේවය කරන බව

- සිද්ධිය සිදුවු 2009-08-12 වන දින පොලිසිය අසල පිහිටි පො.කො. කුලසිංහගේ මස්සිනාගේ නිවසේ උපන්දින සාදයකට සහභාගි වු බවත්, එම නිවසේදී මත්පැන් පානය කල බව

- එසේ මත්පැන් පානය කරමින් සිටියදී කුමාර රාළහාමිට දුරකථන ඇමතුමක් පැමිණි බවත් ඒ අනුව ඔහු එළියට ගොස් නැවත ඇතුලට ආ බවත් අගුලාන පොලිසියට ස්ත්‍රී දුෂණයක් සම්බන්ධ පැමිණිල්ලක් වාර්තා වි ඇති බව ඔහු සඳහන් කල බවත් ඒ අනුව කුමාරටත්, තමාටත් කුලසිංහ රාළහාමිටත් මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙස ස්ථානාධිපති නියෝග කල බව

- එම උපදෙස් අනුව තමන් තිදෙනා පොදු ජය පාසැල දෙසට ගිය බවත්, එහි කිසිවෙක් නොසිටි හෙයින්, ආපසු පොලිසිය දෙසට පැමිණි බවත්,ඒ එනවිට එදින රාත්‍රි උපසේවක රාජකාරියේ යෙදි <u>සිටි තොටවත්ත රාළහාමි සහ කුමාර</u> තරුණයන් දෙදෙනෙකුට පහර දෙනවා දුටු බව හා තවත් දෙදෙනෙකු පොලිස් කුඩුවේ සිටි බව

- තමාත් කුලසිංහ සහ කුමාරත් නැවත සාදය පැවති තැනට පැමිණි බවත්, එසේ ගොස් කුමාර අයියා ස්ථානාධිපතිවරයාට සැකකරුවන් ගෙනවිත් සිටින බව දැන්වු බවත් පසුව තමන් සාදය අවසන් වි පොලිසියට පැමිණි බවත්, ස්ථානාධිපතිවරයාද පැමිණිබවත් ඔහු විසින් අත්අඩංගුවට ගත් දෙදෙනාව තම කාර්යාලයට කැඳවා ප්‍රශ්න කළ බවත්,ඉන්පසු ස්ථානාධිපතිවරයා සහ කුමාරත්

මෙම සැකකරුවන්ට අතින් පයින් පහර දුන් බවත්, ඉන්පසු තොටවත්ත ලවා පටියක් ගෙන්වා ගත් ස්ථානාධිපතිවරයා සැකකරුවන්ට එයින් පහර දුන් බව

- මෙසේ පහරදි පැමිණිල්ල කිරිමට පැමිණි තැනැත්තන්ට පසුදින එන ලෙස දන්වා ඔවුන්ට පිටව යාමට පැවසු බවත්,ඉන්පසු තමාට සහ කුමාරට තුවක්කු දෙකක් ගන්නා ලෙස ස්ථානාධිපතිවරයා නියෝග කල බවත්, ඒ අනුව තමන් ස්වයංක්‍රිය ගිනි අවි දෙකක් ගත් බව

- ඉන්පසුව අත්අඩංගුවට ගෙන සිටි තැනැත්තන් දෙදෙනාද සමඟ තමා කැබ් රථයට නැගුනු බවත්,ඒ වන විට වේලාව රාත්‍රි 12.30-1.00ට පමණ වු බවත්, කැබ් රථයට නැගුනු දෙදෙනාගේ ඔළුවට ගැටනොගසන ලද ෂොපින් බෑග් දෙකක් දමා තිබු බවත්, ඔවුන්ව රැගෙන ගොස් ලුනාව හන්දියෙන් ගාලු පාර පැත්තට හැරි යන කොට හමුවන පළවන පාලම ලඟ වාහනය නවත්වා, ස්ථානාධිපතිවරයා විසින් එක තරුණයෙකුව එළියට ගෙන, තමාට කතා කොට “මුන් දෙන්නා පාතාලයට සම්බන්ධ රටේ නමගිය අපරාධකාරයෝ, මිනිමැරුම් මංකොල්ලකෑම් ගණනාවක් කර තිබෙනවා, මුංව මැරුවට පව් නැහැ, හිටියොත් කොච්චර අපරාධ කරයිද, වෙඩි තියපං” යැයි පැවසු බව

- එහිදි තමා වෙඩි නොතැබු බවත්, එවිට ස්ථානාධිපතිතුමා කුනුහරුපෙන් බනිමින් වෙඩි තියන ලෙස තර්ජනය කල බවත්, (**<u>එම අවස්ථාවේදි ඔහු විසින් එක වෙඩි පහරක් තබා ඇති බව ලබා දී ඇති ප්‍රකාශයෙන් ඇඟවේ.)</u>**

- ඉන්පසු කැබ් රථය නැවත වෙරළ අයින දිගේ රත්මලාන පැත්තට ආ බවත්, වෙරළ අයිනේ කැබ් රථය නවතා අනෙක් තැනැත්තාවද මුහුදු වෙරළට රැගෙන ගොස් “වෙඩි තියපං” යැයි ස්ථානාධිපතිවරයා පැවසු බවත්, පළමු වෙඩි තැබිම නිසා වු කම්පනය මත වෙඩි තැබු බවත්, වැදුනාද නොවැදුනාද යන්න නොදන්නා බව

- **ඒ වනවිට තමන් ආයුධය සේනාරත්නට දි තිබු බවත්, එවිටම තමාට වෙනත් වෙඩි තැබිම් දෙකක්ද ඇසුනු බවත්,** ඉන්පසු සියළු දෙනාම කැබ් රථයෙන් ගාළුපාර අයිනේ පිහිටි කඩයකට පැමිණ තේ බිව් බව

- වෙඩි තැබිම සම්බන්ධයෙන් කිසි කෙනෙකුට දැන ගන්න තියන්න එපා යැයිද, සියළු දෙයම තමා බලාගන්නා බව ස්ථානාධිපතිවරයා පැවසු බව

### 1.3.4 මින්මතු හතරවන වගඋත්තරකරු ලෙස සඳහන් පො.කො. ගලගමගේ ඉන්ද්‍රවංශ කුමාරසිරි යන අය

- 2009.08.12 වන දින වනවිට අගුලාන පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටි බවත් ස්ථානාධිපතිවරයා විසින් දැනුම්දුන් පරිදි කුලසිංහගේ මාමාගේ ගෙදර සාදයකට ගිය බව

- එහි ගිය පසු මත්පැන් බීමට ලැබුනු බවත් දුරකථන ඇමතුමක් ගැනීම සඳහා තමා නැවත පොලිස් ස්ථානයට පැමිණි බව

- ඉන් පසු තමා ස්ථානයේදී දුරකථනයෙන් තම බිරිඳට කථා කරමින් සිටියදී ග්‍රාමාරක්ෂක සුසන්ත පැමිණ ස්ථානාධිපතිතුමා එන්න කියු බව දැනුම්දුන් බවත් ඒ අනුව තමා නැවත සාදය තිබු ස්ථානයට ගිය බව

- එහි ගොස් වාඩිවෙනවාත් සමගම ග්‍රාමාරක්ෂක සුසන්ත පැමිණ ස්ථානාධිපතිවරයාට කාන්තාවක් පැහැරගෙන යන්න හැදු බවට පැමිණිල්ලක් කිරීමට කට්ටියක් පැමිණ ඇති බව දැනුම්දුන් බව

- **ඒ අනුව ස්ථානාධිපතිවරයාගේ උපදෙස් මත ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට ස්ථානයට පැමිණ බවත් කාන්තාවන් දෙදෙනෙකු සහ පිරිමි දෙදෙනෙකු පැමිණ සිටි බවත් ඒ අතර අවුරුදු 20-30 ත් අතර තරුණ කාන්තාවක් සිටි බවත් දෙදෙනෙකු පැමිණ ඇයව පැහැරගෙන යාමට හැදූ බවත් එතන සිටි පිරිමි අය කෑගැසූ නිසා එයින් වැලකුනු බවත් ඉන් පසුව ඔවුන් පොලිසියට පැමිණි බවත් තමන්ට ප්‍රකාශ කල බව**

- ඉන්පසු මෙම සිද්ධිය තමා ස්ථානාධිපතිවරයාට දැනුම්දුන් බවත් ස්ථානාධිපතිවරයා තමාට ධම්මික, කුලසිංහ හා සේනාරත්න සමග ගොස් මේ පිළිබඳ සොයා බලන ලෙස උපදෙස් දුන් බව

- තමන් සිවිල් ඇඳුමින් සිටි නිසා ප්‍රධාන ගේට්ටුවේ ග්‍රාමාරක්ෂක සුසන්ත සමග යන ලෙසට උපදෙස් දුන් බවත් ඒ අනුව පොලිස් ස්ථානයට පැමිණ තිබූ ත්‍රිවිල් රථයක් කථා කරගෙන සිද්ධිය සිදුවූ සුනාමි කඳවුර පිහිටි ස්ථානයට ගිය බව

- එහිදී වයෝවෘද්ධ කාන්තාවක් විසින් ඉහත ආකාරයේ සිද්ධියක් සිදුවූ බවත් ඔවුන් ඊට පසු එතනින් ඉවත්ව ගිය බව තමන්ට ප්‍රකාශ කල බව

- ඉන්පසු නැවත තමන් පොලිස් ස්ථානය දෙසට පැමිණ සාදය තිබූ ගෙදරට හැරෙන තැනින් ත්‍රිරෝද රථයෙන් බැසගත් පසු කව්රු හෝ කථාකරන ශබ්දයක් ඇසී ඒ දෙසට ධම්මික සහ සේනාරත්න දුවගෙන යනු දුටු බවත් තමාද ඒ දෙසට යනවිට **සේනාරත්නත්, ධම්මිකත් පුද්ගලයන් දෙදෙනෙකුට පහරදෙමින් සිටි බවත්** තමා ස්ථානයට ගොස් එය වැළැක්වීමට තැත් කල බවත් එසේ නමුත් ඔවුන් ඉවත් නොවූ නිසා තොටවත්තට සිර මැදිරිය අරින ලෙස උපදෙස් දුන් බවත් එවිට මොවුන් දෙදෙනා තමාවත් පෙරලාගෙන පැනයාමට තැත්කල බවත් සිරමැදිරියේ දොර අතින් අල්ලාගෙන ඔවුන්ව මැදිරිය තුළට දැමීමට තැත් කිරීමේදී එම අයවලුන් තමාගේ කකුල පාගාගෙන සිටි බවත් ඉන්පසු තමා ඔවුන්ට පහරක් ගසා සිරමැදිරියට දැමීමට තැත් කලද එසේ කල නොහැකි වූ බැවින් විශේෂ රාජකාරියට ගොස් සිටි පො.සැ.ජයවික්‍රම මහතා පැමිණ තමාව පසුපසට ඇද දමා තමා සමග සිටි අනෙක් අයවද පසකට ඇද දමා සැකකරුවන් දෙදෙනා සිර මැදිරියට දැමූ බව

- තමන් නැවත සාදය තිබූ නිවසට ගොස් ස්ථානාධිපතිතුමාට මේ පිළිබඳව දැනුම්දීමෙන් පසු ස්ථානාධිපතිවරයා සමග ආහාරගෙන නැවත පොලිස් ස්ථානයට පැමිණි බවත් ඉන්පසු තමාට පරුෂ වචනයෙන් බැණ අත්විලංගුවේ යතුරත් රැගෙන කැබ් රථයට නඟින ලෙසට ස්ථානාධිපතිවරයා කී බව

- ඒ අනුව යතුරු කැරැල්ල සමග තමා කැබ් රථයට ගොඩවුන බවත් කැබ් රථයේ ඉදිරි පස අසුනේ ස්ථානාධිපති පො.ප. නිව්ටන් මහතාද, කැබ් රථයේ රියදුරු 23564 නවරත්න ද පසුපස අසුනේ දිසානායක,කුලසිංහ,ධම්මික යන පොලිස් කොස්තාපල්වරුන් සහ ග්‍රාමාරක්ෂක සේනාරත්නත් ටී56 ගිනිඅවි දෙකක්ද අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් දෙදෙනාද සමඟ එහි ගමන් කල බව

- ටී 56 ගිනි අවි ගෙන යන ලද්දේ සේනාරත්න සහ ධම්මික යන නිලධාරීන් විසින් බව

- සැකකරුවන් දෙදෙනාට වෙන වෙනම මාංචු දමා තිබූ බවත් ලුනාව රෝහලට ආසන්නයේ ගාලු පාරට වැටෙන පාර දිගේ ටික දුරක් ගොස් කළුවර පෙදෙසක කැබ් රථය නතර කල බවත් එවිට ධම්මික ටී 56 ගිනි අවියක් සමග බැස්ස බවත් සේනාරත්න එක් සැකකරුවෙකු බස්සවාගෙන පාර අයිනේ වාඩි කල බවත් ඒත් සමග වෙඩි ශබ්දයක් ඇසුනු බවත් වාඩි වී සිටි පුද්ගලයා බිම් දිගාවූ බවත්

- **ස්ථානාධිපතිවරයා අධික ලෙස බීමත්කමින් සිටි නිසා තමාට පරුෂ වචනයෙන් බැන බැහැලා හැන්ඩ් කප් එක ගලවපන් කියා කියූ බවත් තමා යතුර ගෙන හැන්ඩ් කප් ගැලවූ බව**

- ඉන්පසු ඉක්මනට යමු කියා ස්ථානාධිපතිවරයා කෑගැසූ බවත් ඒ අනුව තමන් ජීප් රථයට ගොඩවූ බවත් නැවත කැබ් රථය පොලිසිය දෙසට වේගයෙන් ගමන් කර පොලිසිය පසුකර ඉදිරියට ගොස් සමූපකාරය අසල නවතන ලද බවත් අනෙක් සැකකරුද සේනාරත්න විසින් බස්සවා ගත් බවත් ස්ථානාධිපතිවරයා තමාට නැවත කථාකර හැන්ඩිකප් යතුර අරන් එන ලෙස නියෝග කල බව

- පසුව මුහුද පැත්තට ඇති පාරේ ස්ථානාධිපතිතුමා ඉදිරියෙන් ගිය අතර ධම්මික ටී 56 ගිනි අවිය අරන් පසුව ගිය බවත් සැකකරුගේ ටී ෂර්ට් එකේ උරහිසෙන් අල්ලා ගෙන සේනාරත්න ධම්මිකටත් ස්ථානාධිපතිතුමාටත් මැදින් ගිය බව දුටු බව

- පසුව තමා අයිනෙන් ගොස් **රේල් පාර අසලදී හැන්ඩිකප් එක ඇරිය බවත් හැන්ඩි කප් එක සාක්කුවේ දමාගෙන තමා** ආපසු හැරී අඩි 5 ක් පමණ එනවිට මුහුද අයිනට රැගෙන ගිය පුද්ගලයාට වෙඩි තබන ශබ්දය ඇසුනු බව

- තමා හැරී බලනවිට **<u>ධම්මික අත තිබූ ටී 56 අවිය සේනාරත්න උදුරාගත් බවත් උඹ වෙඩි තියන්න දන්නේ නැහැ යනුවෙන් කෑගසා සේනාරත්නද වැටී සිටි අයට වෙඩි පහරක් තැබූ බව</u>**

**1.3.5 මින්පසු පස්වන වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන සිද්ධිය සම්බන්ධයෙන් දැනට බන්ධනාගාර ගතව සිටින පො.කො.35473 චමල් තුෂාර කුලසිංහ යන අය**

- තරුණයින් දෙදෙනා ඝාතනය වීමට අදාළ සිද්ධිය වූ දිනයේ පොලිස් ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙක් සහභාගී වූ උපන්දින සාදය පැවැත්වූයේ තම භාර්යාවගේ සහෝදරයා වන කිත්සිරි ප්‍රනාන්දු හෙවත් විජේ යන අයගේ නිවසේ බව

- පොලිස් ස්ථානයේ සිට එම නිවසට ඇති දුර මීටර් 50කටත් වඩා අඩු දුර ප්‍රමාණයක් ඇති බව

- ඝාතනය වී ඇති පුද්ගලයින් දෙදෙනා හා සම්බන්ධ සිද්ධියට අදාළ පැමිණිල්ල පිළිබඳව ගේට්ටුවේ රාජකාරියේ යෙදී සිට ඇති සුසන්ත නැමැති සිවිල් ආරක්ෂක භටයා විසින් සාදය පැවති ස්ථානයට පැමිණ පොලිස් නිලධාරීන් දැනුවත් කල බව

- පසුව ස්ථානාධිපති විසින් සිද්ධිය පිළිබඳව සොයා බැලීමට අදාළ ස්ථානයට යන ලෙස තමා ඇතුළු නිලධාරීන්ට උපදෙස් දුන් බව

- ඒ අනුව තමා ඇතුළු නිලධාරීන් පිරිසක් ප්‍රදේශයට ගොස් සැකකරුවන් පිළිබඳව සොයා බැලූ නමුත් ඔවුන් සොයා ගැනීමට නොහැකි වූ බැවින් නැවත පොලිස් ස්ථානය වෙත පැමිණුන බව

- එසේ නැවත පොලිස් ස්ථානයට පැමිණෙන විට වේලාව රාත්‍රී 11.30 පමණ වී තිබුණු බව

- පොලිසියට පැමිණි අවස්ථාවේ උපසේවා රාජකාරියේ යෙදී සිටි පො.කො.තොටවත්ත යන නිලධාරියා තරුණයින් දෙදෙනෙකු පොලිස් ස්ථානය ඇතුළට කැඳවාගෙන ගිය බව හා **<u>තොටවත්ත, ධම්මික, සේනාරත්න සහ කුමාරසිරි යන නිලධාරීන්</u>** එම තරුණයින් දෙදෙනාට පහරදෙන ආකාරය තමා දුටු බව

- එම අවස්ථාවේ පයවික්‍රම නැමැති සාජන් මහතා ඊට මැදිහත්වී එම පුද්ගලයින් දෙදෙනා සිර මැදිරියට යොමු කරන ලෙස උපදෙස් දුන් බවත් පසුව තමා නැවත උපන්දින සාදය පැවති නිවසට ගිය බව

- ඉන්පසුව ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් රාත්‍රී ආහාරය ගෙන නැවත පොලිස් ස්ථානය වෙත පැමිණි බව හා ස්ථානාධිපති නිව්ටන් මහතා මීට පෙර සඳහන් කළ තරුණයින් දෙදෙනා තමා ලගට කැඳවාගෙන එන ලෙස උපදෙස් දුන් බව

- <u>**උපදෙස් අනුව තරුණයන් දෙදෙනාව කාර්යාලයට ගෙන ගිය පසු ස්ථානාධිපති මහතා ඔවුන්ව දණ ගස්සවා අතින් පයින් පහරදුන් බව හා**</u> ඒ වනවිට රාත්‍රී 12.00 පසුවී තිබුණු බව

- ස්ථානාධිපති වන නිව්ටන් මහතා විසින් ෂොපින් බෑග් ගෙන්වා ඒවා තරුණයින් දෙදෙනාගේ ඔළු වලට දමා පොලිස් කැබ් රථයට ඔවුන්ව නංවා ගන්නා ලෙස උපදෙස් දුන් බව හා ඉන්පසු කැබ්රථය සැකකාර තරුණයන්ද සමග ලුනාව දෙසට ධාවනය කළ බව

- වාහනයේ ගමන් ගත් නිලධාරීන් ටී 56 ආයුධ දෙකක් රැගෙන ගිය බවත් ඉන් එකක් පො.කො.ධම්මික අත තිබුණු බවත් අනෙක් ආයුධය ආසනය උඩ තිබුණු බව

- ඉදිරියට ධාවනය කළ වාහනය ලුනාව කලපුව අසල නතර කළ බවත් පො.කො.ධම්මික එක සැකකරුවෙකුට බහින ලෙස නියෝග කල බවත් ධම්මික, සේනාරත්න සහ කුමාරසිරි යන නිලධාරීන් වාහනයෙන් බැසගත් බවත් ස්ථානාධිපති නිව්ටන් වාහනයේ ඉදිරිපස සිට බැස සැකකරු අසලට ආ බවත් ඊට පසු විනාඩියක් ගතවීමට පෙර වෙඩි ශබ්දයක් ඇසුණු බවත් නිව්ටන් මහතා පො.කො.කුමාරසිරිට සැකකරුගේ මාංචු ගලවන ලෙසට කෑ ගසා කී බව ඇසුනු නමුත් පිටත සිදුවන දේ තමා නොදුටු බව

- ඉන් පසුව වාහනය ගල්කිස්ස දෙසට ධාවනය කළ බවත් වෙරළ ආසන්නයේ ස්ථානයක වාහනය නතර කළ බවත් ඒ අවස්ථාවේදී පො.කො.ධම්මික අනෙක් සැකකරුට වාහනයෙන් බසින ලෙස නියෝග කළ බවත් තමා සහ දිසානායක හැරුණුකොට අනෙක් නිලධාරීන් වාහනයෙන් බැස ගත් බවත් පසුව සැකකරුද රැගෙන නිලධාරීන් පිරිස වෙරළ දෙසට ගමන් කළ බවත් විනාඩි කිහිපයකින් වෙඩි ශබ්ද දෙකක් ඇසුණ බවත් නිලධාරීන් පිරිස දුවගෙන ඇවිත් වාහනයට ගොඩවුන බවත් <u>**ඒ අවස්ථාවේදී සිවිල් ආරක්ෂක සේනාරත්න මූට හරියට වෙඩිල්ලක් තියාගන්න බැරි බව හා මම හරියට වැඩේ කළා කියා ප්‍රකාශ කළ බව**</u>

**1.3.6 මින්මතු හයවන වගඋත්තරකරු ලෙස සඳහන් රොහාන් බණ්ඩාර නවරත්න යන අය**

- තමා 2009-08-12 වන දින උදරාබාධයක් හේතුවෙන් බැරැක්කයට ගොස් නිදාගත් බවත් අලුයම 1.30ත් 2.00ට පමණ රාජකාරියේ සිටි උපසේවා නිලධාරි තොටවත්ත යන අය පැමිණ ස්ථානාධිපතිවරයා තමාට කතා කරන බව දැනුම් දෙන ලද බවත් පසුව නිදිමතින් අවදි වී කලිසමක් අඳින අවස්ථාවේදී ස්ථානාධිපති විසින් පරුෂවචන කියමින් බැන වදිනු ඇසුණු බැවින් කැබ් එකට නැඟ එය පනනංවා පොලිසිය ඉදිරියට ගෙන ආ බව

- තමන් පොලිස් ස්ථානය ඉදිරිපිටට රථය රැගෙන එන අවස්ථාවේදී ස්ථානාධිපතිගේ නිල කාමරයේ තරුණයින් දෙදෙනෙක් බිම හිඳගෙන සිටිනු දුටු බවත් ස්ථානාධිපති පුටුවක වාඩි වී සිටි බවත් පොලිස් නිලධාරීන් තිදෙනෙකු එම ස්ථානයේ සිටිනු දුටු බව

- තම වාහනය නතර කරගෙන සිටින අතරතුර ස්ථානාධිපති පැමිණ ඉදිරිපසින් වාඩිවී යමන් ලුනාවට කියා කියූ බවත් රථය පිටුපසට පිරිසක් නඟින ශබ්දය ඇසුණු බව

- ස්ථානාධිපති බීමත්ව සිටින විට ඉතා සැර පරුෂව කටයුතු කරන බැවින් වැඩිදුරටත් ප්‍රශ්න නොකර හිතේ ඇති වූ බයට මොරටුව දෙසට මීටර් 200ක් පමණ ධාවනය කල බවත් පසුව පාලම අසල තිබෙන කලුවර ස්ථානයක රථය නතර කිරීමට ස්ථානාධිපති විසින් තමාට පැවසූ බව

- "රථයේ ලයිට් නිවපන්" යැයි පවසමින් ස්ථානාධිපති වාහනයෙන් බැස රථයේ පිටුපස දෙසට ගිය බවත් පිටුපසින් සිටි අයද රථයෙන් බැස යන හඬ ඇසුණු බව

- තමා ස්ථානාධිපතිට තිබූ බය නිසා රථයෙන් නොබැස්ස බවද පිරිස ගොස් විනාඩියකට පමණ පසු වෙඩි ශබ්දයක් ඇසුණු බවත් "කුමාර හැන්කප් ගලවපන්" කියා ස්ථානාධිපති හයියෙන් කෑ ගසන හඬ ඇසුණු බව

- පසුව පිරිස රථයට ගොඩවූ අතර ස්ථානාධිපති "රත්මලානේට යමන්" යැයි පැවසූබවත් තට්ටයා පාලම අසල මාර්ග බාධකය අසලට පැමිණ රථය නැවැත්වූ බවද පසුව අගුලාන හන්දියට ගොස් පොලිසිය ඉස්සරහා ගොඩ පාරෙන් රත්මලාන කඩමංඩිය අසල සමුපකාරය ළඟ රථය නැවැත්වීමට ස්ථානාධිපති විසින් අණ කල බවද පසුව රථයේ පැමිණි පිරිස මුහුද දෙසට දිවෙන පාර දිගේ ගිය බවද එම ගිය පිරිස අතර **පොලිස් ස්ථානාධිපති කුමාර, සේනාරත්න සහ ධම්මික යන අය සිටි බවද ධම්මික අත තුවක්කුවක් තිබූ බව දුටු බව**

- මෙහිදි **<u>සේනාරත්න විසින් හැන්කප් (අත් විලංගු) දමා ඇති අයෙකුව උරහිසින් ඇද ගෙනමෙන් යනවා</u>** රථයේ ලයිට් එළියෙන් දැකිමට හැකි වු බව

- පිරිස ඉවත්ව ගොස් විනාඩි 6ක් 7ක කාලය අතරදී වෙඩි හඬ දෙකක් ඇසුණු බව හා එයට සුළු මොහොතකට පසු නැවත පිරිස පැමිණි බව

- හැන්කප් දමා ගෙන ගිය අය නැවත නොපැමිණි බවද **<u>හැන්කප් දෙක කුමාර අය්යා අත තිබෙනවා දුටු බව හා තුවක්කුව සේනාරත්න යන අය අත තිබූ බව</u>**

- පසුව පිරිස පොලිසියට පැමිණි බවත් ස්ථානාධිපති විසින් "කව්රු හරි උඹෙන් ඇහැව්වොත් උඹට බඩේ අමාරුවක් හැදි නිදා ගත්තා යැයි කියපන් යැයිද මහත්තයාත් මැච් එක බලලා නිදා ගත්තා යැයි කියපන් කියා වාහනයෙන් එළියට ගියේ නැහැ කියපන්" යනුවෙන් තමාට ප්‍රකාශ කල බව

### 1.3.7 **මින්මතු හත්වන වගඋත්තරකරු ලෙස 2009.08.12 වන දින රාත්‍රි උප සේවයේ රාජකාරි කල ගයාන් චතුරංග තොටවත්ත යන අය**

- තමා 2009.08.12 වන දින සවස 5.45ට පමණ උප සේවයේ වැඩ භාරගත් බවත් රාත්‍රි 8.45ත් 9.00ක් අතර කාලයේදි ස්ථානාධිපතිවරයා කුලසිංහ නැමැති රාලහාමිගේ මස්සිනාගේ උපන්දින සාදයකට ගිය බවත් ඔහු සමඟ ධම්මික, කුමාර අය්යා, ග්‍රාම ආරක්ෂක සේනාරත්න යන අය ගිය බවත් යන අවස්ථාවේදි යම් ප්‍රශ්නයක් මතු වුවහොත් ස්ථානාධිපතිවරයාට දැනුම් දෙන ලෙස තමාට දන්වා සිටි බව

- එදින තමා උප සේවයේ රාජකාරි කල අතර සුසන්ත නැමැති ග්‍රාම ආරක්ෂකයෙකු ප්‍රධාන ගේට්ටුවේ රාජකාරි කල බවත් අනෙක් පිරිස බැරැක්කයේ නිදා සිටි අතර **ප්‍රදිප් රාලහාමි ක්‍රිකට් මැච් එක සඳහා විශේෂ රාජකාරි වලට ගොස් සිටි බව**

- සාදයට ගොස් සිටි කුමාර රාලහාමි කෝල් එකක් ගැනිම සඳහා පොලිස් ස්ථානයට පැමිණි බවත් පැයක් පමණ දුරකථනයෙන් කතා කල බවත් පසුව ග්‍රාම ආරක්ෂක සේනාරත්න නැමැති අය කුමාර සොයා ගෙන පැමිණි බවත් ඔහුට සර් එන්න කිව්වා යැයි පැවසු බව හා ඒ අනුව කුමාර ගිය බව

- ඉන් පසුව තමාගේ මතකයේ හැටියට රාත්‍රි 11.30ට පමණ තරුණ ගැහැණු කෙනෙකුත්, වයසක ගැහැණු කෙනෙකුත්, ඔහුගේ පුතාත් තරුණ ගැහැණු කෙනාගේ මහත්තයාත් පොලිසියට පැමිණ

කොල්ලෝ කට්ටියක් ඇවිත් ගිනි පෙට්ටියක් ඉල්ලනවා අතින් අදින්න හැදුවා ගෙදර යන්න බැහැ ඒ කට්ටිය එතැන ඉන්නවා කියා තමා වෙත ප්‍රකාශ කල බව

- පසුව තමා ග්‍රාම ආරක්ෂක කැඳවා ඔහුට මේ බව ස්ථානාධිපතිවරයාට දැනුම් දෙන ලෙස ප්‍රකාශ කල බවත් පසුව කුමාර නැමැති නිලධාරියා තනියම පොලිසියට පැමිණි බවත් අදාල විස්තරය කාන්තාව විසින් කුමාරට පැවසු බවත් පසුව ඔහු සාදය තිබු නිවසට ගොස් ධම්මිකත්, කුලසිංහ සහ ග්‍රාම ආරක්ෂක සේනාරත්න යන අය සමඟ පොලිස් ස්ථානයට පැමිණ කාන්තාවගේ පුරුෂයාගේ ත්‍රිරෝද රථයෙන් ඔහු සමඟ සිද්ධිය වු ස්ථානයට ගිය බවත් ඔවුන් සමඟ සුසන්තද යනු දුටු බව

- පසුව ටික වෙලාවකට පසු පැමිණිල්ල දැමීමට පැමිණි කාන්තාව අදාල තරුණයින් දෙදෙනා පාරේ ගමන් කරන බව පෙන්වූ බවත් පසුව ඔවුන්ට කතා කර පොලිසියේ ගේට්ටුව ඇතුලට ගෙන්වා ගත් අතර ඔවුන්ගෙන් ඒ පිලිබඳව ඇසු විට ඒ කිසිවක් නොදන්නා බව ප්‍රකාශ කල බවත් එවිට එම කාන්තාව ඔවුන් දෙදෙනා පෙන්වා අතින් ඇද්දේ ඔවුන් බව ප්‍රකාශ කල බවත් එවිට තරුණයන් දෙන්නා පැනලා යාමට සැදූ බවත් පසුව ඔවුන්ගේ ෂර්ට් එකෙන් අල්ලා ගෙන පොලිසිය ඇතුලට ගෙන ගිය බවත් එම අවස්ථාවේදී ඔවුන් “ෂර්ට් එකෙන් අල්ලන්නේ ඇයි අපි වරදක් කරලා නැහැ” කියා ප්‍රකාශ කල බවත් එම අවස්ථාවේදී ඔවුන්ට පහරවල් දෙකක් ගැසු බවත් එම අවස්ථාවේදී සිද්ධියට ගිය කට්ටිය එනම් කුමාර,ධම්මික,සේනාරත්න පැමිණි බවත් කුලසිංහ ගේට්ටුව ලඟින් බැස ගිය බවත් එම පිරිස අතර සිට තරුණ කාන්තාව තමා අමතා “සර් මෙයාලා තමයි ආම් එකේ කියලා මගේ අතින් ඇද්දේ ”යැයි ප්‍රකාශ කල බවත් ඒ අවස්ථාවේදී කුමාර, ධම්මික, ග්‍රාම ආරක්ෂක සේනාරත්න යන අය තරුණයන් දෙදෙනාට පහර දුන් බවත් පහර දෙන ශබ්දයට සාජන් වික්‍රම පැමිණ පිරිස පාලනය කර සැකකාර තරුණයන් දෙදෙනාව සිරමැදිරියට දමන ලෙස තමාට ප්‍රකාශ කල බව

- පසුව කුමාරයි ධම්මික සහ සේනාරත්න ඉවත්ව ගිය බවත් තමා පැමිණිල්ල වාර්තාගතකිරීමට සැරසෙන විට ස්ථානාධිපතිවරයා පැමිණි බවත් ඔහු සමඟ කුමාර, ධම්මික,කුලසිංහ සහ සේනාරත්න යන අය පැමිණි බවත් ස්ථානාධිපතිවරයා විසින් තමාගෙන් විස්තර අසා එම දෙදෙනා ඔහුගේ කාර්යාලයට එක්ක එන ලෙස නියෝග කල බවත් පසුව තමා ඔවුන් දෙදෙනාව ස්ථානාධිපතිවරයාගේ කාර්යාලයට ගෙන ගිය බව

- පසුව ස්ථානාධිපතිවරයා තරුණයින් දෙදෙනාට අතින් පයින් පහර දුන් බවත් අතින් ගහලා හරි යන්නේ නැහැ කියා පොල්ලක් ගේන්න කියා කියු බවත් පසුව ධම්මික ත්‍රිවිල් එකේ රබර් පටියක් රැගෙන තරුණයන් දෙදෙනාගේ ඔළුවට ගැහු බවත් අනෙක් නිලධාරීන්ද ඔවුන්ට පහර දුන් බව

- පසුව නවරත්නව ඇහැරවු බවත් පසුව නවරත්න පොලිස් කැබ් රථය මිදුලට ගත් බවත් ධම්මිකටත් සේනාරත්නටත් ආයුධ දෙකක් දෙන්න කියා කියු බවත් පසුව රිසව් එකේ පෙට්ටිය ඇර සේනාරත්න සහ ධම්මික ටි 56 තුවක්කු 2ක්, මැගසින් 2ක් ගත් බවත් පසුව තමා පෙට්ටිය වසා ස්ථානාධිපති ලඟට ගිය බවත් පසුව තරුණයන් දෙදෙනාගේ අත් දෙක පිටුපසට තියා මාංචු දැමු බවත් ඔළුවට ෂොපින් එකක් දමා තිබු බවත් පැමිණිල්ල දාන්න ආපු අයට උදේට එන්න කියා දැනුම්දුන් බව

- පසුව තමා අදාල පැමිණිල්ල ලියා ගන්න දැයි ස්ථානාධිපතිවරයාගෙන් ඇසු බවත් ඔහු තමාට පරුෂවචනයෙන් බැණවැදුන බව හා පැමිණිලි කිරීමට පැමිණි අයටද උදේට එන්න කියා ප්‍රකාශ කල බව

- පසුව පිරිස තරුණයන් දෙන්නා පිප් එකට දමා ගත් බවත් කුමාර අයියාත් ස්ථානාධිපතිත් කාර්යාලයෙන් එලියට පැමිණ “මුන් පාතාලයේ දෙන්නෙක් මුන්ගෙන් වෙපන් ගන්න තියනවා තවත් කට්ටිය අල්ලන්න තියනවා” යනුවෙන් ප්‍රකාශ කල බවත් දිසානායකටත් නැගිට්න්න කියා කියු බවත් පසුව දිසානායකත් පිප් රථයට නැග්ග බවත් නවරත්න කැබ් රථය එලවා ගෙන ගිය බව හා පිප් එක ගියේ අගුලාන පැත්තට බව

* එවිට වේලාවට අලුයම 1.30ට පමණ වන බව

* ඉන්පසුව නැවතත් පොලිසියට ඉදිරිපිටින් වේගයෙන් රත්මලාන පැත්තට පිජ් රථය යනු දුටු බවත් නැවත විනාඩි 45 කට පසු පිජ්රථය පොලිසියට පැමිණි බවත් ස්ථානාධිපතිතුමා කාර්යාලයට ඇවිත් විනාඩි 2කට පමණ පසු නිදිය ගන්න ගිය බවත් ධම්මිකත් සේනාරත්නත් තුවක්කු 2ක භාර දුන් බව

* එවිට තමා තරුණයන් දෙන්නා කෝ කියා ඔවුන්ගෙන් විමසූ බවත් එවිට ඔවුන් දෙන්නා පාතාලේ නොවන නිසා දමා ආ බව ඔවුන් තමාට පැවසූ බව

* පසුව උදේ 5.20ට උප සේවයේ භාර ගැනිමට සිටි අයට කතා කල බවත් උදෑසන 6.00ට රිසව් භාර දි නින්දට ගිය බව පසුව මිනිසුන් පැමිණ කෑ ගසන විට අත්අඩංගුවේ සිටි තරුණයන් දෙන්නා මියගොස් ඇති බව දැන ගත් බව

* අත්අඩංගුවේ සිටින අයව සොයා ගෙන රාත්‍රි එක් තරුණයකුගේ අම්මාද අනෙක් තරුණයාගේ තාත්තාද ආ බවත් ඔවුන්ට උදේට එන ලෙස තමා පැවසූ බව

**1.3.8 මින්මතු අටවන වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන සිද්ධිය සම්බන්ධයෙන් දැනට බන්ධනාගාර ගතව සිටින පො.කො.73295 දිසානායක මුදියන්සේලාගේ නිශ්ශංක දිසානායක යන අය**

* 2009.08.12 වන දින පොලිස් භෝජනාගාරයේ සේවය කරමින් සිටි බවත් පසුව රාත්‍රි 12.00ත් 1.00ත් අතර කාලයේ බැරැක්කයේ සිටින විට කවුරුන් හෝ ශබ්ද නගා කතා කරනවා ඇසි බලන විට උප සේවා රාජකාරියේ යෙදි සිටි පො.කො.තොටවත්ත අසල තරුණයින් දෙදෙනෙකු හා කාන්තාවක හා තවත් පිරිමි කෙනෙකු සිටින බව තමා දුටු බවත් තොටවත්ත විසින් තරුණයින් දෙදෙනාගෙන් ප්‍රශ්න කරන ආකාරය තමාට නිරීක්ෂණය වූ බවත් විශේෂ සිදුවීමක් නොවුන නිසා තමා නැවත බැරැක්කය වෙත ගිය බව

* විනාඩි 10කට පමණ පසු කුලසිංහ, ධම්මික, සහ කුමාර යන නිලධාරින් පොලිස් ස්ථානයට පැමිණි බවත් කුමාර යන නිලධාරියා ඒ අවස්ථාවේ සැකකාර තරුණයින්ගෙන් ප්‍රශ්න කරනවා තමාට ඇසුණ බවත් බැරැක්කය සහ චෝදනාගාරය පෙනෙන දුරකින් තිබෙන නිසා තමාට මෙම සිද්ධිය ඇසුණු හා පෙනුන බව

* <u>**කුමාර යන නිලධාරියා තරුණයින්ට අතින් පහරවල් කිහිපයක් එල්ල කරනු දුටු බවත් පයවික්‍රම සාපන් මහතාගේ මැදිහත්වීම මත තරුණයින් දෙදෙනා රිසව් රාජකාරියේ යෙදි සිටි තොටවත්ත විසින් සිර මැදිරියට දමනු දුටු බව**</u>

* ඉන් පසු තමා බැරැක්කයේ නිදාගෙන සිටි බවත් තමා අසලින්ම පො.කො.රි.නවරත්න යන අය සිටි බවත් ස්ථානාධිපති, නිව්ටන් මහතා විසින් සිනුව නාද කරනු ඇසි තමා සහ නවරත්න යන නිලධාරින් ස්ථානාධිපති කාමරයට පැමිණි බවත් ඒ අවස්ථාවේ ස්ථානාධිපති විසින් ඉහත කී තරුණයින් දෙදෙනා තමාගේ නිල කාමරයට රැගෙන එන ලෙස තොටවත්තට නියෝග කළ බවත් ඒ අවස්ථාවේ ඒ අසල පො.කො.කුලසිංහ පො.කො.ධම්මික පො.කො.කුමාරසිරි, සිවිල් ආරක්ෂක සේනාරත්න යන අයද සිටි බව

* ස්ථානාධිපති විසින් ඒ අවස්ථාවේ තරුණයින් දෙදෙනාට තර්ජනය කරමින් උඹලා පාතාලයට සම්බන්ධයි නේද ආදි වශයෙන් ප්‍රශ්න කරමින් සිටි බවත් පැමිණිලි කිරීමට පැමිණි ඉහත කී කාන්තාව සහ පිරිමි පුද්ගලයා එම ස්ථානයේ සිටි බවත් **ස්ථානාධිපති විසින් ත්‍රිරෝද රථයේ පටියක් ගෙන්වා ගෙන තරුණයින්ට පහරදුන් බවත්** පසුව තරුණයින් දෙදෙනා පොලිස් කැබ් රියට

නංවාගෙන ඉහත කී නිලධාරීන්ටද වාහනයට ගොඩවන ලෙස උපදෙස් දුන් බවත් ධම්මික සහ කුමාර යන නිලධාරීන්ට ආයුධ දෙකක් රැගෙන එන ලෙස වැඩිදුර උපදෙස් දුන් බව

- පො.කො.ටි.නවරත්න යන අය විසින් පදවාගෙන යන ලද කැබ් රථය ලුනාව දෙසට කිලෝ මීටර් 2,1/2ක් පමණ ධාවනය කර පාලමක් අසල නතර කළ බවත් පො.කො.කුලසිංහ සහ තමා රථයේ සිටියදී අනෙක් නිලධාරීන් වාහනයෙන් බැස ගත් බවත් ස්ථානාධිපති විසින් කුමාර ලවා එක් තරුණයෙක් වාහනයෙන් බස්සවා ගත් බවත් ඒ ආසන්නයේ කළපුවක් තිබූ බව තමාට මතකයේ තිබෙන බවත් ඉහත නිලධාරීන් විසින් එම සැකකරුව ඒ දෙසට කැඳවාගෙන ගිය බවත් සුළු වේලාවකින් වෙඩි ශබ්දයක් ඇසුණු බව

- ඒ අවස්ථාවේ කැබ් රථයේ සිටි <u>**අනෙක් තරුණයා මල්ලිට වෙඩිතිබ්බා නේද යනුවෙන් කෑගැසූ බවත්**</u> ස්ථානාධිපතිවරයා විසින් මාංචුවල යතුරු කා ලගද තියෙන්නේ ඉක්මණට මාංචු ගලවපල්ලා යනුවෙන් සඳහන් කරනු තමාට ඇසුණු බවත් පසුව නිලධාරීන් පිරිස වාහනයට නැඟුනු බවත් ඉන් අනතුරුව එය ගල්කිස්ස දෙසට නැවත ධාවනය කළ බවත් කලින් කී අවස්ථාවේ වාහනයෙන් බසින විට **ටී 56 ආයුධ කුමාර සහ ධම්මික** යන නිලධාරීන් අත තිබූ බව

- ගල්කිස්ස ඥානේන්ද්‍රාරාම පාර දෙසින් වෙරළ දෙසට ධාවනය කළ වාහනය රේල් පාර අසල නතර කර පෙර පරිදිම කුලසිංහ සහ තමා වාහනයේ සිටියදී නිලධාරීන් අනෙක් තරුණයාද වාහනයෙන් බස්සවාගෙන වැල්ල පැත්තට ගෙන ගිය බවත් විනාඩි කිහිපයකින් වෙඩි ශබ්දයක් ඇසුණු බවත් ඊටත් විනාඩි දෙක තුනකින් තවත් වෙඩි ශබ්දයක් ඇසුණ බවත් ඉන්පසුව නිලධාරීන් පිරිස පැමිණ වාහනයට නැඟුණු බවත් පසුව ගාලු පාරට පැමිණ රාත්‍රී කඩයකින් සියළුදෙනා තේ පානය කල බව

## 1.4. අතවරයට ලක්වූ පාර්ශවයේ ප්‍රකාශ

### 1.4.1 නදිකා කල්පනි ප්‍රනාන්දු යන අයගෙන් හෙළිවූ කරුණු

- 2009.08.12 වන දින ඇයත් ඇගේ ස්වාමි පුරුෂයාත් ස්වාමි පුරුෂයාගේ මිතුරෙකුත් තම ආච්චි වන කල්‍යාණි නැමැති අයගේ නිවසට රාත්‍රී 9.30ත් 10.00ත් අතර කාලයේදී පැමිනි බව

- පැය 1/2කට පසු නිවස තුලට කවුරුන් හෝ විදුරු කටු වගයක් විසික් කල බවත් එය නිවසේ ලැලි වලට වැදීමෙන් ඇති වු ශබ්දයට නිවසේ සිටි අය වන තම සියාත් ආච්චිත් මාමාත් ගොස් බැලු බවත් එම අවස්ථාවේදි කලුටීෂර්ට් එකක් ඇඳ සිටි තරුණයෙකු නිවස අසල සිටි බවත් ඉහත ශබ්දය සම්බන්ධයෙන් ඔහුගෙන් විමසු විට ඔහු ප්‍රකාශ කර සිටියේ යාලුවන් සමග මත්පැන් පානය කිරීමෙන් පසුව ඔවුන් විසින් තමාව දමා යන්නට ගිය බවත් එම නිසා ඇති වු කෝපයට බෝතලය පොලොවේ ගැසු බව ඔහු ප්‍රකාශ කල බව

- නිවසට නුදුරුව පුටුවක තවත් තරුණයෙක් හිඳගෙන සිටි බවත් ඉන්පසුව තම ස්වාමි පුරුෂයා තමන් පැමිණි ත්‍රිවිලය නිවසේ පිටුපස සිට නිවස ඉදිරිපිටට රැගෙන ආ බවත් පසුව සියලුදෙනාම නිදා ගැනිම සඳහා නිවස තුලට ගිය බවත් නිවස තුල නිදා සිටින විට කෙනෙකු පැමිණ තමාගේ අතින් ඇල්ලු බවත් තමා බියට පත්වී නැගිටීමෙන් අනතුරුව නිවසේ සිටි සියලුදෙනාම අවදිවී ඒ සම්බන්ධයෙන් සොයා බැලු බවත් ඉන්පෙර නිවස ලඟට පැමිණි තරුණයා සහ තවත් තරුණයෙකු නිවස ඉදිරිපිට සිටි බවත් ඔවුන් තම මාමාගෙන් සිගරට් ඉල්ලු බවත් පසුව ඔවුන් යුද්ධ හමුදා නිලධාරීන් බවත් නිවස සහ තමාව පරික්ෂා කිරීමට අවශ්‍ය බව ප්‍රකාශ කල බවත් ඒ සම්බන්ධයෙන් විරුද්ධ විමෙන් අනතුරුව එම තරුණයින් දෙදෙනා තමාගේ ඉහල නිලධාරියාවද රැගෙන එන බව ප්‍රකාශ කරමින් එම ස්ථානයෙන් පිටව ගිය බවත් ඒ පිළිබඳව ඇති වු බියට අගුලාන පොලිසියට පැමිණිල්ලක් කිරීමට ගිය බව

- තමන් පොලිස් ස්ථානයට යන විට පොලිසියේ නිලධාරීන් දෙදෙනෙක් පමණක් සිටි අතර ඉන්පසු එම නිලධාරීන් තවත් නිලධාරීන්ට දුරකථනයෙන් කතා කර පොලිස් ස්ථානයට ගෙන්වා ගත් බවත්

ඒ අනුව තවත් නිලධාරීන් හතරදෙනෙක් පැමිණි බවත් එම නිලධාරීන් හතරදෙනා සිවිල් ඇඳුමෙන් සැරසී සිටි බව

- පසුව ඔවුන් තම ස්වාමියාගේ ත්‍රිවිල් රථයේ නැගී එම තරුණයින් දෙදෙනා සෙවීමට ගිය බවත් මදවේලාවට පසු එම තරුණයින් දෙදෙනා පොලිස් ස්ථානය අසල පාරේ යනු තමන් දුටු බවත් එවිට තමන් පොලිස් ස්ථානයේ සිටි නිලධාරීන්ට ඔවුන් දෙදෙනා පෙන්වීමෙන් අනතුරුව එම නිලධාරීන් විසින් ඔවුන් දෙදෙනාව පොලිස් ස්ථානය තුළට ගෙන සිරමැදිරියට දැමූ බවත් තමාගෙන් **<u>පැමිණිල්ල ලියා ගැනීමට සූදානම් වූ අතර තමාගේ නම ලිපිනය සහ වයස මහත්තයාගේ නම ඇතුලු විස්තර රතු පාට පෑනෙන් ලියූ බවත්</u>** ඒසමඟම ස්ථානාධිපතිවරයා පොලිස් ස්ථානයට පැමිණි බවත් මීට කලින් එම නිලධාරියාව නොහඳුනන බවත් පොලිස් ස්ථානයේ සිටි කිසිදු නිලධාරියෙක් කලින් තමා නොහඳුනන බව

- පසුව ස්ථානාධිපතිවරයා විසින් ඔහුගේ කාමරයට තමාටත් තම ස්වාමිපුරුෂයාටත් කතාකර පැමිණිල්ල අසා සිටි බවත් පසුව ආමි එකේ දෙදෙනාව රැගෙන එන ලෙස නිලධාරීන්ට ප්‍රකාශ කල බවත් කාර්යාලය තුලදී එම අයට පහර දුන් බව

- ස්ථානාධිපතිවරයා විසින් එතැන සිටි තවත් නිලධාරියෙකු ලවා ත්‍රිවිල් එකේ රබර් පටිය ගෙන්වා ගෙන එයින්ද තරුණයන් දෙදෙනාට පහර දුන් බවත් පසුව හෙට උදේට එන ලෙස පවසා තමන්ව පොලිස් ස්ථානයෙන් එලවා ගත් බවත් පසුව තමා රැඳී සිටි සුනාමි ගම්මානයට පැමිණි බවත් එසේ සිටින විට අදාල තරුණයින් දෙදෙනාගේ ඥාතීන් තම නිවසට පැමිණි බවත් ඔවුන් අදාල පැමිණිල්ල සමථයකට පත් වන ලෙස ඉල්ලා සිටි අතර පසුව උදේ අදාල තරුණයින් දෙදෙනාව මරා දමා ඇති බවට දැන ගැනීමට ලැබුණු බව

### 1.4.2. විදානලාගේ තරංග දර්ශන ද මැල් ගේ ප්‍රකාශය

- තමා වෘත්තියෙන් ත්‍රිරෝද රථ රියදුරකු බව

- තමා ධනුෂ්ක සහ දිනේෂ් යන තැනැත්තන් ගේ හිරිහැරවලට ලක්වූ කාන්තාවගේ පුරුෂයා බව

- 2009-08-12 වන දින අගුලානේ පොදු ජය විද්‍යාලයේ සුනාමි කඳවුරේ පිහිටි කරලැයින් නැමැති බිරිඳගේ ආච්චිගේ නිවසට ගිය බව

- එහි තමාත් තම බිරිඳත් රාත්‍රි 10.15-10.30ට පමණ නිදාගෙන සිටිද්දී, නිවස පසුපසින් බෝතල් බිඳෙන ශබ්දයක් ඇසුනු බවත්, ඒ පිළිබඳව සොයා බලද්දී එක් අයෙකු කළු ටීෂර්ට් එකක් ඇඳසිටි අයෙකු තමා අසලට පැමිණ "දුමක් නැද්ද? (සිගරට්ටුවක්) යනුවෙන් විමසූ බවත් තමා ඔහුට නැහැයැයි පවසා, ඔයා බීලා නේද ඉන්නෙ කියා ඇසූ බවත්, ඉන්පසු එම තැනැත්තා පිටව ගොස් නැවතත් ටික වේලාවකින් පැමිණ "ත්‍රිවිල් එකෙන් හයර් එකක් යන්න පුළුවන්ද" යනුවෙන් ඇසූ බවත්, තමා "බැහැ" යැයි පැවසූ බව

- නැවතත් කහපාට ටීෂර්ට් එකක් ඇඳ සිටි අයෙකුද ගේ ඇතුලට පැමිණ ඔවුන් ආමි එකෙන් යැයිද නිවස සෝදිසි කරන්න ඕනා යැයිද පැවසූ බවත් ඉන්පසුව ඔවුන් ඈතට ගොස් ගල් වලින් නිවසට පහර දුන් බවත්, මෙසේ හිරිහැර කිරීම නිසා පොලිස් ස්ථානයට පැමිණිලි කිරීමට ගිය බව

- මේ පිළිබඳව පැමිණිලි කිරීමෙන් පසු පොලිස් නිලධාරීන් විසින් ඔවුන් දෙදෙනාව අල්ලා ගෙන විත් ඔවුන්ට පහර දෙනු දුටු බවත්, ස්ථානාධිපති සමඟ තව හතරදෙනෙකු එසේ පහර දෙනු දුටු බව

- තමන්ගේ පැමිණිල්ල සටහන් කිරීමට ස්ථානයේ ඒ අවස්ථාවේ සිටි නිලධාරියා උත්සාහ කල නමුත් ස්ථානාධිපතිවරයා එය අවශ්‍ය නැති බව පවසා සටහන් කිරීම නතර කල බවත් තමන්ට පසුදින උදේට එන ලෙස දැන්වූ බැවින් පොලිස් ස්ථානයෙන් පිටව ආ බව

## 1.5. විමර්ශන නිලධාරීන්ගේ නිරීක්ෂණ

### 1.5.1. අත්අඩංගුවට ගැනිම

ඊට අමතරව ඩි.යු.අපොන්සු සහ දිනේෂ් තරංග යන අයට විරුද්ධව පැමිණිලි කිරීමට පැමිණි කාන්තාව වන නදිකා කල්පනි ප්‍රනාන්දු යන තැනැත්තියගේද, ඔහු සමග පැමිණි විතානගේ තරංග ද මැල් යන අයගේ ප්‍රකාශයෙන්ද එය වැඩිදුරටත් සනාථ වේ. මෙම අත්අඩංගුවට ගැනිම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) වගන්තියට අනුව නිතියෙන් නියම කර ඇති ආකාරය වන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වැනි වගන්තියට ප්‍රකාරව සිදු කිරීමට ඉඩ ප්‍රස්ථාව තිබියදී එසේ කර නොමැති බවට නිරික්ෂණය වේ.

<u>එමෙන්ම වගඋත්තරකරුවන් වන එම අවස්ථාවේ ස්ථානයේ රාජකාරියේ නියුතු උපසේවක තොටවත්තද, සැකකාර තරුණයන් දෙදෙනා අත්අඩංගුවට ගත් නිලධාරීන් සහ ස්ථානාධිපතිවරයාද නිතියෙන් නියම කර ඇති අත්අඩංගුවට ගැනිමේ කාර්ය පටිපාටියට අනුකූලව එම අත්අඩංගුවට ගැනිම පිළිබඳව නීත්‍යානුකූලව සටහන් තැබීමක් සිදුකර නැත. මෙහිදී රැඳවුම් ලේඛනයේ තොරතුරු ඇතුලත් කිරීම, ප්‍රකාශ ලබාගැනිම, සැකකරුවන් වෙනත් ස්ථානයකට රැගෙන යාම සම්බන්ධයෙන් සටහන් යෙදිම, අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් සටහන් යෙදිම වැනි තොරතුරු කිසිවක් ඇතුලත් කර නැත. අවම වශයෙන් අත්අඩංගුවට ගැනිමට පෙර අත්අඩංගුවට ගත් තැනැත්තන්ට විරුද්ධව වින්දිතයින් විසින් සිදු කරනු ලබන පැමිණිල්ල සටහන් කිරීමට හෝ කටයුතු කර නැත.</u>

අත්අංඩගුවට ගැනිමෙන් පසු ලඟම ඥාතින් පැමිණ විමසද්දිද උපසේවකද අත්අඩංගුවට ගත් අනෙකුත් නිලධාරීන් සහ ස්ථානාධිපති සැකකරුවන් අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් ඔවුන්ට දැනුම් දිමක් සිදු කර නැත. එනම් අත්අඩංගුවට ගත් බව ප්‍රතික්ෂේප කර ඇත. එය අප වෙත ලබා දි ඇති ස්ථානාධිපතිවරයාගේ ප්‍රකාශය අනුවද තහවුරු වේ.

මෙහිදි ස්තානාධිපතිවරයා හැර සියළුම වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගැනිමක් සිදු කල බවත් පොලිස් ස්ථානයේ රඳවා තැබූ බව පිලිගන්නා බවත් වෙඩි තබා ඝාතනය කිරීමට සහාය වූ බවත් ඔවුන්ගේ ප්‍රකාශ වලින් තහවුරු කර ඇත.

### 1.5.2. රඳවා තබා ගැනිම

මිය ගිය අයවලුන් අගුලාන පොලිස් ස්ථානයේ 2009.08.12 වන දින රඳවා සිටි බවට පො.කො ගයාන් චතුරංග තොටවත්ත යන අයගේ ප්‍රකාශයෙන්ද, එදින ප්‍රධාන දොරටුවේ රාජකාරි කළ සිවිල් ආරක්ෂක වල්පොල ගමගේ සුසන්ත පයලත්ගේ ප්‍රකාශයෙන්ද, පො.කො ධම්මික නිහාල් පයරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද, ගොඩවත්තගේ පනප්‍රිය සේනාරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද, ගමගේ ඉන්දුවංශ කුමාරසිරි යන අයගේ ප්‍රකාශයෙන්ද, පො.කො.රී රෝහණ බණ්ඩාර නවරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද, පො.කො කුලසිංහ යන අයගේ ප්‍රකාශයෙන්ද, පො.කො. 73295 දිසානායක මුදියන්සේලාගේ නිශ්ශංක දිසානායක යන අයගේ ප්‍රකාශයෙන්ද, සනාථ වේ. ඊට අමතරව ඩි.යු. අපොන්සු සහ දිනේෂ් තරංග යන අයට විරුද්ධව පැමිණිලි කිරීමට පැමිණි කාන්තාව වන නදිකා කල්පනි ප්‍රනාන්දු යන තැනැත්තියගේද, ඔහු සමග පැමිණි විතානගේ තරංග ද මැල් යන අයගේ ප්‍රකාශයෙන්ද, වැඩිදුරටත් සනාථ වේ. අත්අඩංගුවට ගැනිමෙන් පසු රඳවා තබා ගැනිම නිතියේ දැක්වෙන කාර්ය පටිපාටිය අනුව සිදු කර නැත.

මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (2) වගන්තිය යටතේ සලකා බැලීමේදී අත්අඩංගුවට ගනු ලැබූ හෝ රැඳවා තබා ගනු ලැබූ තැනැත්තෙක් නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චකාරවරයෙකු ඉදිරියට ගෙන යා යුතු අතර, එම විනිශ්චකාරවරයා විසින් කරනු ලබන ආඥාවක් මත සහ ආඥාවක් ප්‍රකාර මිස එම තැනැත්තා තවදුරටත් අත්අඩංගුවේ තබා ගැනීම හෝ රැඳවා තබා ගැනීම එම තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම නොකළ යුතු බව සඳහන් වේ. මෙම සිද්ධියේදී අත්අඩංගුවට ගත් පුද්ගලයින්ව අගුලාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අධිකරණයකට ඉදිරිපත් කර නැති බව නිරීක්ෂණය කරන ලදී. තවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (4) වගන්තිය යටතේ අධිකරණයක් මගින් කරනු ලැබූ ආඥාවකින් මිස කිසියම් තැනැත්තෙකුට මරණීය දණ්ඩනයට යටත් කිරීමක් නොකළ යුතු බව දැක්වේ. සිදු කරනලද විමර්ශනයට අනුව පෙනී යන ලද්දේ අගුලාන පොලිස් ස්ථානයේ නිලධාරීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත සඳහන් කර ඇති ව්‍යවස්ථාවන්ට පටහැනිව කටයුතු කර ඇති බවයි. මේ අනුව වගඋත්තරකරුවන් විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (2) සහ 13 (4) යන ව්‍යවස්ථා උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

### 1.5.3. වධහිංසාව

මිය ගිය අයවලුන්ට අගුලාන පොලිස් ස්ථානයේදී 2009.08.12 වන දින ස්ථානාධිපති පො.ප නිව්ටන් ප්‍රනාන්දු, ගයාන් චතුරංග තොටවත්ත යන අය පහර දුන් බවට පො.කො ගයාන් චතුරංග තොටවත්ත යන අයගේ ප්‍රකාශයෙන්ද, එදින ප්‍රධාන දොරටුවේ රාජකාරි කල සිවිල් ආරක්ෂක වල්පොල ගමගේ සුසන්ත පයලත්ගේ ප්‍රකාශයෙන්ද, පො.කො ධම්මික නිහාල් පයරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද, ගොඩවත්තගේ පනප්‍රිය සේනාරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද, ගමගේ ඉන්ද්‍රවංශ කුමාරසිරි යන අයගේ ප්‍රකාශයෙන්ද, පො.කො කුලසිංහ යන අයගේ ප්‍රකාශයෙන්ද, සනාථ වේ. ඊට අමතරව ඩී.යු.අපොන්සු සහ දිනේෂ් තරංග යන අයට විරුද්ධව පැමිණිලි කිරීමට පැමිණි කාන්තාව වන නදීකා කල්පනී ප්‍රනාන්දු යන තැනැත්තියගේද, ඔහු සමඟ පැමිණි විතානගේ තරංග ද මැල් යන අයගේ ප්‍රකාශයෙන්ද එය වැඩිදුරටත් සනාථ වේ. ඊට අමතරව පො.කො ධම්මික, පනප්‍රිය සේනාරත්න, ඉන්ද්‍රවංශ කුමාරසිරි යන අයද පහර දුන් බවට ගමගේ සුසන්ත පයලත් යන අයගේ ප්‍රකාශයෙන්ද, පො.කො තොටවත්ත යන අයගේ ප්‍රකාශයෙන්ද සනාථ වේ.
දනුෂ්ක උදයකාන්ත අපෝන්සු යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව පහර දීමෙන් සිදු වූ තුවාල හෝ සලකුණු අනාවරණය වී නැති අතර ඔහුගේ මරණයට හේතුව වශයෙන් සඳහන් කර ඇත්තේ රයිපල් තුවක්කුවකින් සිදු කරන ලද තුවාල බවයි.

<u>නමුත් දිනේෂ් තරංග ප්‍රනාන්දු යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව මරණය සිදු වී ඇත්තේ තුවක්කුවකින් වෙඩි තබන ලද තුවාල වලින් වුවත් ඔහුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ මෘත ශරීරයේ **මොට ආයුධයකින් සිදු කරන ලද තුවාල රැසක් ඇති බව සඳහන් කර** ඇත.</u>

ඒ අනුව දිනේෂ් තරංග යන අයට පොලිස් ස්ථානයේදී පහර දී ඇති බවට එය ප්‍රබල සාක්ෂියක් වන බව පෙනීයයි. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බව, ඇසින් දුටු සාක්ෂි, පර්වේෂණ සාක්ෂි සහ විශේෂඥ සාක්ෂි මගින් තහවුරු වන බව නිගමනය කල හැකි වේ.

### 1.5.4. වින්දිතයින්ගේ අයිතිවාසිකම්

අදාල සිද්ධියට මුල් වූ නදීකා කල්පනී ප්‍රනාන්දු යන අය තමාට මියගිය තරුණයන් දෙදෙනා හිරිහැර කිරීමක් සම්බන්ධයෙන් අගුලාන පොලිසියට පැමිණිල්ලක් කිරීමට ගොස් ඇති නමුත් වගඋත්තරකරුවන් විසින් ඇයගේ එම පැමිණිල්ල හරියාකාරව සටහන් නොකොට හා පැමිණිල්ල සම්බන්ධයෙන් නීත්‍යානුකූල පරීක්ෂණයකින් තොරව චූදිතයන්ට විරුද්ධව කටයුතු කළ ආකාරය තුළ එම තැනැත්තියගේ මූලික අයිතිවාසාකම්වලට අගතියක් වී ඇති බව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී පෙනී යන ලදී.ඇයගේ පැමිණිල්ල සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂනයන් සිදු නොකිරීම හේතුවෙන් පැමිණිලිකාරියට අපකීර්තියක් සිදු වී ඇති බව නිරීක්ෂණය වූ අතර නදීකා

කල්පනී ප්‍රනාන්දු යන අයගේ ආච්චි පදිංචි වී සිටි නිවස කුපිත වූ පිරිස් විසින් විනාශ කිරීම තුළින්ද මෙම අයගේ අයිතිවාසිකම් උල්ලංඝනයක් වී ඇත.

### 1.5.5. වෙනත් කරුණු

විමර්ශනයේදී සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති පො.කො බණ්ඩාරිගොඩ අනුර ප්‍රදීප් කුමාර යන අය අදාළ සිද්ධිය වූ දිනයේදී ශ්‍රී ලංකාව හා පකිස්ථානය අතර පැවති පන්දු වාර 20 යි 20 ක්‍රිකට් තරගයේ විශේෂ රාජකාරී සඳහා ගොස් ඇති බව අනාවරණය වන ලදී මෙම අය විසින් මියගිය පුද්ගලයන්ව අත්අඩංගුවට ගැනීමට හෝ පොලිස් ස්ථානයෙන් පිටතට රැගෙන යාමට හෝ ඔවුන්ට පහරදීමට සම්බන්ධ වූ බවට විමර්ශනයේදී ලබාගෙන ඇති සාක්ෂි හෝ ප්‍රකාශ මගින් තහවුරු නොවන බව පෙන්වා දිය යුතුය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, දකුණු කොළඹ විසින් අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ විමර්ශණ කටයුතු කඩිනමින් හා නිසි පරිදි සිදු කෙරෙමින් තිබුණු බවට නිරීක්ෂණය විය.

# දෙවන පරිච්ඡේදය

# නීතිමය විශ්ලේෂණය

---

අදාල තරුණන් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කොමිෂන් සභාව විසින් ආරම්භ කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රීලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ ප්‍රතිපාදන පරිදිය. එම වගන්තියේ සඳහන් පරිදි **කොමිෂන් සභාව විසින් එහි මෙහෙය විමෙන්** විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් අත්‍යෛජතියට පත් තැනැත්තකුගේ හෝ තැනැත්තන් සමූහයකගේ මූලික අයතිවාසිකම් උල්ලංණය කිරීමක් පිළිබඳ චෝදනාවක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කල හැක.

ඒ අනුව සිදු කරන ලද විමර්ශනයෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් මූලිකව සලකා බලන ලද්දේ 1978 ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන පරිච්ඡේදයේ 12(1) සහ 13 වන ව්‍යවස්ථාවේ (2) (3),(4) අනුව්‍යවස්ථා මගින් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් හා 11 ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති වදහිංසාවෙන් මිදීමේ අයිතිවාසිකම මියගිය තරුණයන් දෙදෙනා විෂයෙහි කඩවී ඇත්ද නැද්ද යන්න තිරණය කිරීමයි.

## 2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම්

වගඋත්තරකරුවන් විසින් එකී පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූලව සිදු කලද යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ නීතිය ඉදිරියේ සර්වසාධාරණත්වය නැමති අයිතිවාසිකම සුරක්ෂිත වන සේ කටයුතු කර ඇත්ද යන්න මීලඟට විමසා බලන ලදි.

ඒ සඳහා දේශිය අපරාධ නීතිය තුළ ඇතුලත් නෛතික විධිවිධාන පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් සාකච්ජා කරන ලදි

<u>**1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ, 109:1 වගන්තිය** යටතේ වරදක් කිරීම පිළිබඳ සෑම තොරතුරක්ම පොලිස් නිළධාරියෙකු වෙත පරික්ෂකවරයකු වෙත වාචිකව හෝ ලියවිල්ලකින් දෙනු ලැබිය යුතු බව සඳහන් වේ. මෙහිදී මුල් තොරතුර දුරකථන මාර්ගයෙන් වුවද ලබා දිය හැකි බව වර්තමානයේදී පිළිගෙන ඇත කෙසේ වෙතත් එසේ දෙනු ලබන මුල් තොරතුර නඩුවක සෘජු සාක්ෂියක් ලෙස යොදාගත හැකි බැවින් එය වාර්තාගත වී තිබීම වැදගත්ය.</u>

**අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109:2 වගන්තිය** යටතේ වාචිකව දෙනු ලැබූ තොරතුරක් එය දෙන ලද භාෂාවෙන් පොලිස් නිළධාරියා විසින් ලියා ගත යුතු බව දැක්වේ.

මෙම සිද්ධියේදි මුල් තොරතුරු ලැබුණු ආකාරය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් වි ඇති අතර, 2009-08-12 වන දින එනම් සිද්ධිය සිදුවු දින උපසේවයේ රාජකාරි කල **හත්වන වගඋත්තරකරු ලෙස සඳහන් තොටවත්ත** යන අය ප්‍රකාශ කර ඇත්තේ, රාත්‍රි 11.30ට පමණ පැමිණිලිකාරිය වන නදිකා කල්පනි ප්‍රනාන්දු යන අය සහ තවත් මහළු ගැහැණු කෙනෙක් හා පුරුෂයන් දෙදෙනෙකු ස්ථානයට පැමිණ "තරුණයන් දෙදෙනෙකු පැමිණ නදිකා කල්පනී යන අයට ගිණිපෙට්ටියක් ඉල්ලා අතින් ඇද අතවර කිරීමට සැදු බව" තමා වෙත ප්‍රකාශ කල බවයි.

තවද ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ ඉන්පසුව තමා ප්‍රධාන ගේට්ටුවේ රාජකාරි කල සිවිල් ආරක්ෂක නිළධාරි සුසන්තට කතා කර මේ බව ස්ථානාධිපතිවරයා වෙත දැනුම් දෙන ලෙස ඉල්ලා සිටි බවත්, පසුව 4 වන වගඋත්තරකරු වන කුමාරසිරි පොලිස් ස්ථානයට පැමිණි බවත්, අදාල කාන්තාව විසින් එම විස්තරය කුමාරසිරි නමැති නිළධාරියාට පැවසූ බවත්, ඔහු නැවත සාදය තිබූ නිවසට ගොස් 3 වන වගඋත්තරකරු වන ධම්මික, 5 වන වගඋත්තරකරු වන කුලසිංහ සහ 2 වන වගඋත්තරකරු වන සේනාරත්න සමග ස්ථානයට පැමිණ කාන්තාවගේ ස්වාමිපුරුෂයාගේ ත්‍රිවිල් රථයෙන් සිද්ධිය වු ස්ථානයට ගිය බවයි.

**මෙම 7 වන වගඋත්තරකරු විසින් ඔහුගේ ප්‍රකාශයේ කිසිදු ස්ථානයක මුල් තොරතුර ලද පළමු නිළධාරියා වශයෙන් (වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව අනුමාන කල හැකි පරිදි) තමා එම පැමිණිල්ල එම අවස්ථාවේදී සටහන් කර ගත් බව හෝ පසුව සටහන් කර ගත් බව ප්‍රකාශ කොට නැත. නදිකා නැමැති කාන්තාව සමග ස්ථානයට පැමිණි ඇයගේ ස්වාමි පුරුෂයා යැයි කියනු ලබන පුරුෂයාගේ හෝ ඔවුන් සමග පැමිණි අනෙක් අයවලුන්ගේ ප්‍රකාශ සටහන් කිරීමක්ද මෙහිදී සිදුව නොමැති බව තහවුරු වේ**

මෙහිදී හත්වන වගඋත්තරකරු විශේෂයෙන්ම සදහන් කර ඇත්තේ, සැකකාර තරුණයන් දෙදෙනා පොලිස් ස්ථානයට ගෙන ඒමෙන් පසුව තමා පැමිණිල්ල සටහන් කරගැනිමට සුදානම් වු අවස්ථාවේදී, ස්ථානාධිපතිවරයා එය වළකමින් පැමිණිල්ල සිදු කිරීමට පැමිණි කාන්තාවන් දෙදෙනා ඔහුගේ නිල කාමරයට කැඳවු බවත්, නැවත වරක් ඔවුන්ව නිලකාමරයෙන් පිටතට ගෙන ආ අවස්ථාවේදිද **පැමිණිල්ල සටහන් කර ගැනිමට ස්ථානාධිපතිවරයාගෙන් විමසූ අවස්ථාවේදී ඔහු පරුෂ වචනයෙන් තමාට බැන වැදුනු බවයි.** මේ අනුව උපසේවය භාරව සිටි මෙම වගඋත්තරකරු සිය ඉහල නිළධාරියාගේ බලපෑම මත හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 වගන්තියේ සඳහන් ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති බව නිරීක්ෂණය කරන ලදි.

**4 වන වගඋත්තරකරු වන කුමාරසිරි යන අය සිය ප්‍රකාශයේදි කියා සිටින්නේ, තමා සාදයේ සිටින අවස්ථාවේදි සිවිල් ආරක්ෂක නිළධාරි සුසන්ත පැමිණ කාන්තාවක් පැහැර ගෙන යාම සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට පිරිසක් පැමිණ සිටින බව ස්ථානාධිපතිවරයාට දැන්වු බවත්, ස්ථානාධිපතිවරයාගේ උපදෙස් මත ඒ පිළිබඳව විස්තර සොයා බැලිමට ස්ථානයට පැමිණි බවත්, තමා විසින් ඔවුන්ගේ විස්තරය අසා දැනගත් පසු නැවත ඒ පිළිබඳව ස්ථානාධිපතිවරයාට දැනුම් දී, ඔහුගේ උපදෙස් මත ධම්මික කුලසිංහ සේනාරත්න යන අය සමග ගොස් සැකකරුවන් පිළිබඳව සොයා බැලු බවයි.** ඔහුගේ ප්‍රකාශයේ කිසිදු ස්ථානයකද තමාට කාන්තාව ඇතුළු පිරිස විසින් ලබා දුන් තොරතුර වාර්තා කල බවට කිසිදු සඳහනක් නැත.

2 වන වගඋත්තරකරු විසින් සිය ප්‍රකාශයේදි කියා සිටින්නේ, තමා අනෙකුත් නිළධාරින් සමඟ සාදයට සහභාගි වි සිටින අවස්ථාවේදි 4 වන වගඋත්තරකරු වන කුමාර රාළහාමිට දුරකථන පණිවුඩයක් ලැබුණු බවත්, ඒ අවස්ථාවේදී ඔහු එම ස්ථානයෙන් ඉවත් වි ගිය බවත් ඉන්පසුව ටිකවේලාවකින් පැමිණ තරුණයන් දෙදෙනෙකු විසින් කාන්තාවකට අතවර කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් පොලිස් ස්ථානයට ලැබී ඇති බව ස්ථානාධිපතිවරයාට දැනුම් දුන් බවයි. පසුව තමන් පොලිස් ස්ථානයට යන විට තරුණයන් දෙදෙනා සිර මැදිරියේ සිටි බවත්, ස්ථානාධිපතිවරයා විසින් ඔවුන්ව සහ පැමිණිලිකාර කාන්තාව සිය නිල කාමරයට කැඳවු බවයි. **ඔහුගේ ප්‍රකාශයෙන්ද ඔහු හෝ එම අවස්ථාවේදි ස්ථානයේ සිට අනෙකුත් වගඋත්තරකරුවන් පැමිණිලිකාර කාන්තාවගේ පැමිණිල්ල සටහන් කර ගත් බව හෝ දුටු බවට සදහන් කර නැත.**

කොමිෂන් සභාවේ විමර්ශන නිළධාරින් විසින් සිය විමර්ශන අවස්ථාවේදි, ඒ වනවිට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තු භාරයේ තිබු, සිද්ධිය සිදුවු දින වනවිට අගුලාන පොලිස් ස්ථානය විසින් භාවිතා කරනලද තොරතුරු සටහන් පොත් පරික්ෂාවට ලක්කර ඇති අතර, විමර්ශන නිළධාරින් **විසින් අදාල තොරතුරු සටහන් පොතේ අවසාන සටහන 2009-08-12 වන දින පැය 17.40ට පමණ තබා ඇති බව නිරීක්ෂණය කල බවත්, එම අදාල තොරතුරු සටහන් පොත නැවත සකස් කර ඇති බව හා එහි පිටු අංක 225 වෙනස් කිරීමකට ලක්කර ඇති බවට නිරීක්ෂණය කරන ලද බවට විශේෂයෙන් සදහන් කර ඇත.**

සිද්ධියට අදාල පැමිණිලිකාර කාන්තාවගේ හා ඔහුගේ ස්වාමිපුරුෂයා යැයි කියනු ලබන දර්ශණ මෙල් යන අයගේ ප්‍රකාශ වලට අනුව සැකකාර තරුණයන් දෙදෙනා ඔවුන්ගේ නිවසට පැමිණ ඇත්තේ, රාත්‍රි 9.30-10.30ත් අතර බව නිරීක්ෂණය වේ.

හත්වන වගඋත්තරකරුගේ ප්‍රකාශය අනුව පැමිණිලි කිරීම සඳහා අදාල කාන්තාව පොලිස් ස්ථානයට පැමිණ ඇත්තේ, රාත්‍රි 11.30ට පමණය. එමෙන්ම හතරවන වගඋත්තරකරුගේ ප්‍රකාශයට අනුව, ඔහු එදින රාත්‍රි සාදයට සහභාගි වී ඇත්තේ, රාත්‍රි 9.00ට පසුව වන අතර, ඔහු පැමිණිලිකාර කාන්තාවන්ගේ පැමිණිල්ල සම්බන්ධයෙන් දැනුවත් වී ඇත්තේ, සාදයට සහභාගි වී සිටින අතරතුර බව ලේඛන නිරීක්ෂණයේදී පෙනියයි. සැකකාර තරුණයන් දෙදෙනා අත් අඩංගුවට ගත් වේලාව සම්බන්ධයෙන් අනාවරණය වී ඇති තොරතුරු අනුව **<u>පැමිණිල්ලක් සටහන් කරන ලද්දේ නම් එය සටහන් විය යුත්තේ 2009-08-12 වන දින සවස 5.40 පසුවය. අගුලාන පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොත්වල දිනයට අදාලව සවස 5.40න් පසුව පැමිණිල්ලක් සටහන් වී නොමැති බව විමර්ශණයේදී අනාවරණය කර ගෙන ඇත.</u>**

**<u>Abasinbanda Vs. SI Gunarathna and others</u>**[1] **නඩුවේදී**; තිරණය වන ලද්දේ අදාල අත්අඩංගුවට ගනු ලබන තැනැත්තා වරද කල බවට සනාථ කිරීම අවශ්‍ය නොවුවද එම අත්අඩංගුවට ගැනීම <u>සාධාරණ සැකයක් හෝ සාධාරණ පැමිණිල්ලක් මත</u> කල බවට **විධායකය විසින් සනාථ කල යුතු බවයි. එහිදි අධිකරණය විසින් එම අත්අඩංගුවට ගැනීමේ වලංගුභාවය තිරණය කල යුතු අතර එහිදි විධායකය විසින් ඒ සඳහා <u>අවශ්‍ය ප්‍රමාණවත් සාධක අධිකරණය ඉදිරියේදි තැබිය යුතු බව මෙම නඩුවේදි තිරණය කොට ඇත.</u>**

මෙහිදි ප්‍රමාණවත් සාධක ලෙස **<u>විමර්ෂණ සටහන්, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ, සාමනිලධාරීන්ගේ නිරීක්ෂණ සටහන්, උදාහරණ ලෙස දක්වා ඇත.</u>** මෙම සිද්ධියේදි තරුණයන් දෙදෙනාට එරෙහිව ස්ථානයට ලැබුණ මුල් තොරතුරු,අත්අඩංගුවට ගැනිම, රඳවා තබාගැනිම හෝ විමර්ෂණ කටයුතු පිළිබඳ කිසිඳු සටහනක් තොරතුරු පොත් ආශ්‍රයෙන් සොයගත නොහැකි බව කොමිෂන් සභාව විසින් සිදුකරන ලද විමර්ශනයේදි නිරීක්ෂණය කර ඇත.

මෙය පොලිස් දෙපාර්තමේන්තු **<u>නියෝග ඒ 16 හි</u>**[2] සඳහන් පොලිස් සටහන් පොත් පවත්වා ගෙන යාම මෙන්ම නියෝග **<u>ඒ 17 හි</u>** සඳහන් තොරතුරු සටහන් පොත් පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් නීතිරීති උල්ලංඝනයක් කිරීමක් බවද නිරීක්ෂණය කරන ලදි.

**<u>අදාල නිලධාරීන් විසින් උක්ත නීතිරීති නොතකමින් අදූරදර්ශී ලෙස ක්‍රියාකිරීම හේතුවෙන් මියගිය තරුණයන් දෙදෙනාගේ මෙන්ම මියගිය තරුණයන්ගෙන් අතවරයකට ලක්වූවා යැයි කියනු ලබන කාන්තාවගේ අයිතිවාසිකම් වලටද අගතියක් සිදු වී ඇත.</u>**

මේ අනුව මෙහිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති **නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්වසාධාරණ විය යුතුය** යන මූලික අයිතිවාසිකම මිය ගිය තරුණයන් දෙදෙනා සම්බන්ධයෙන් මෙන්ම අතවරයට පත් කාන්තාව සම්බන්ධයෙන්ද කඩවී ඇති බව තිරණය කල හැක.

---

1 (1995) 1 SLR 244

2 පොලිස් ආඥා පනත

**2.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13:1 ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම්**

**13(1) ව්‍යවස්ථාව: නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව** මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකල යුත්තේය. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුතුය.

**2.2.1 නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකුව සිරභාරයට නොගැනීම**

මෙහිදී **නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය** යන්න පළමුවෙන්ම පැහැදිලි කරගත යුතුය.

**අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 4 වන පරිච්ඡේදයේ සිරභාරයට ගැනීම පිළිබඳ සාමාන්‍ය විධිවිධාන යටතේ යම් තැනැත්තෙකු සිරභාරයට ගන්නා ආකාරය එහි 23 වන වගන්තියෙන් පැහැදිලි කර ඇත.**

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ **32 වන වගන්තිය** වරෙන්තුවක් නොමැති සාම නිළධාරියකුට යම් තැනැත්තකු සිරභාරයට ගත් හැකි අවස්ථා පෙන්වා දි ඇත. එහි **32:1(ආ) වගන්තියෙහි** මෙසේ දක්වා ඇත.

**යම් සංඥෙය වරදකට සම්බන්ධ** වු තැනැත්තකු හෝ එසේ **සම්බන්ධ** වු බවට යම් තැනැත්තකුට විරුද්ධව **සාධාරණ පැමිණිල්ලක් ලැබී** තිබේද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව **විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේද** නැතහොත් ඒ බවට යම් තැනැත්තකු **සම්බන්ධයෙන්** සාධාරණ සැකයක් පවතිද එවැනි තැනැත්තකු සිරභාරයට ගත හැකිය.

මේ අනුව මෙම සිද්ධියේදි **යම්** සංඥෙය වරදකට **සම්බන්ධ** වු තැනැත්තකු හෝ එසේ **සම්බන්ධ** වු බවට **යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක්** අගුලාන පොලිස් ස්ථානයේ පොලිස් නිළධාරින් වෙත ලැබී තිබුනාද යන්න මුලිකව විමසා බැලිය යුතුය.

විමර්ෂන අවස්ථාවේදි කොමිෂන් සභා නිළධාරින්ට ප්‍රකාශ ලබාදුන් නදිකා කල්පනි ප්‍රනාන්දු යන අයට අනුව ඇය විසින් තරුණයන් දෙදෙනෙකු තම **නිවසට පැමිණ තමාට අතවර කිරීමට තැත්කිරීමක් සම්බන්ධයෙන්** අගුලාන පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කිරිමට ගිය බවත් තමා එම පොලිස් ස්ථානයේ සිටියදි එම තරුණයක් දෙදෙනා පොලිස් ස්ථානය අසලින් ඇවිද ගෙන යනු දුටු **තමා පොලිස් ස්ථානයේ සිටි නිළධාරින්ට ඒ බව පෙන්වීමෙන් පසුව** නිළධාරින් විසින් එම දෙදෙනා අල්ලා සිර මැදිරියට දැමු බවට කරුනු අනාවරණය කර ඇත.

**එමෙන්ම මිය ගිය ඩි.යු.අපොන්සු සහ දිනේෂ් තරංග යන අයව කාන්තාවකට අතවර කිරීමක් සම්බන්ධයෙන් 2009.08.12 වන දින අගුලාන පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇති බව** එදින උප සේවයේ රාජකාරි කරමින් සැකකරුවන්ව අත්අඩංගුවට ගත් පො.කො ගයාන් චතුරංග තොටවත්ත ඔහුගේ ප්‍රකාශයෙන්ද, එදින ප්‍රධාන දොරටුවේ රාජකාරි කල සිවිල් ආරක්ෂක වල්පොල ගමගේ සුසන්ත පයලත්ගේ ප්‍රකාශයෙන්ද, පො.කො ධම්මික නිහාල් පයරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද, ගොඩවත්තගේ ජනප්‍රිය සේනාරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද, ගමගේ ඉන්ද්‍රවංශ කුමාරසිරි යන අයගේ ප්‍රකාශයෙන්ද, පො.කො.රි රෝහණ බණ්ඩාර නවරත්න යන අයගේ ප්‍රකාශයෙන්ද,පො.කො කුලසිංහ යන අයගේ ප්‍රකාශයෙන්ද, පො.කො.73295 දිසානායක මුදියන්සේලාගේ නිශ්ශංක දිසානායක යන අයගේ ප්‍රකාශයෙන්ද හෙලිකර ඇත.

**මේ අනුව එම තරුණයන් දෙදෙනා අත්අඩංගුවට ගැනිමට අදාල වගඋත්තරකරුවන්ට හේතුවක් උද්ගතව තිබූ බව පෙනෙන අතර ඒ අනුව අත්අඩංගුවට ගැනීමක්ද සිදු වි ඇති බව සනාථ වේ.**

**2.2.2 යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුතුය.**

**මේ අනුව සිරභාරයටගත් තරුණයන් දෙදෙනාට ඔවුන් සිරභාරයටගත් හේතුව දැනුම් දුන්නේද යන්න මිළගට විමසා බලන ලදි**

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ **23 වන වගන්තියේ** සදහන් පරිදි සිරභාරයට ගනු ලබන තැනැත්තා තමා අත්අඩංගුවට ගනු ලැබීමට **වචනයෙන් හෝ ක්‍රියාවෙන් අවනත වුවහොත්** මිස ඔහු සිරභාරයට ගැනිම කරන තැනැත්තා විසින් සිරභාරයට ගනු ලබන තැනැත්තාගේ **ශරීරය ස්පර්ශය කොට සිරභාරයට ගැනිම කල යුතු** අතර එසේ සිරභාරයට ගනු ලබන්නේ යම් **චෝදනාවක් හෝ දෝෂාරෝපණයක් මතද ඒ චෝදනාවේ හෝ දෝෂාරෝපණයේ ස්වභාවය ඔහුට දැනුම් දිය යුතුය**

මෙය පොලිස් **අංක ඒ දරණ පොලිස් දෙපාර්තමේන්තු නියෝගයන්හිද** සඳහන් වේ.

**අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 32(1) බී** අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 22 වන වගන්තියට අනුව සෑම සාමනිලධාරියකු විසින්ම තමාට ක්‍රියාකිරීමට බලය ඇති ප්‍රාදේශිය බල ප්‍රදේශය තුල යම් වරදක් සිදුකිරීම හෝ සිදුකිරීමට තැත්කිරීම සම්බන්ධයෙන් තමා දන්නා හෝ තමා විසින් ලබාගන්නා යම් තොරතුරක් **තමාගේ ආසන්නම ජ්‍යේෂ්ඨ නිලධාරියාට වහාම දැනම් දිය යුතු බව සඳහන් වේ.**

එලෙස ලැබෙන මුල් තොරතුරක් අනුව ආරම්භ වන පොලිස් විමර්ශනයකදි සාමනිලධාරීන් කෙලෙස ක්‍රියාකල යුතුද යන්න අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ මෙන්ම පොලිස් ආඥා පනතේද සදහන්ව ඇත.

**අදාල සිද්ධියේදි තරුණයන් දෙදෙනා අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් ප්‍රකාශ සටහන් කර ගැනිමක් හෝ විධිමත් විමර්ශනයක් පැවැත්වූ බවට කිසිදු ලිඛිත සාක්ෂියක් නොමැති බැවින් සිර භාරයටගත් තරුණයන් දෙදෙනාට ඔවුන් සිරභාරයට ගත් හේතුව දැනුම් දුන්නේද යන්න අවිනිශ්චිත බව කිව යුතුය.**

## 2.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම්

### 2.3.1 සිරභාරයට ගැනිම හා රඳවා තබාගැනිම

මෙම සිද්ධියේදි මුල් පැමිණිලිකාරිය වන නදිකා කල්පනි ප්‍රනාන්දු සහ තරංග දර්ශනද මැල් යන අයගේ සාක්ෂියෙන්ද සුසන්ත ජයලත් යන අයගේ ප්‍රකාශයෙන්ද දිනේෂ් තරංග ප්‍රනාන්දු හා ධනුෂ්ක උදයකාන්ත යන තරුණයන් දෙදෙනා පොලිස් අත්අඩංගුවට පත්ව් ඇති බව තහවුරු වේ. එමෙන්ම වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ මගින් සැකකාර තරුණයන් දෙදෙනා පොලිස් අත්අඩංගුවෙන් නිදහස් වි නොමැති බවටද සාධක අනාවරණය වේ. සුසන්ත ජයලත් ගේ ප්‍රකාශය අනුව සහ 6 වන වගඋත්තරකරු වන තොටවත්තගේ ගයාන් චතුරංගට අනුව 2009-08-13 වන දින අළුයම අවසන් වරට තරුණයන් දෙදෙනා දකින අවස්ථාවේදිද ඔවුන් අගුලාන පොලිස් නිළධාරීන් භාරයේ පසුවි ඇත. තරුණයන් දෙදෙනා පොලිස් අත්අඩංගුවට පත්විම මෙන්ම ඔවුන් අවසන්වරට දකින අවස්ථාවේදිද පොලිස් අත්අඩංගුවේ පසුවිම සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මගින් තහවුරු වි ඇති අතර සිද්ධිය සිදුවන අවස්ථාවේ සිරමැදිරියේ සිටි ගාල්ලගේ බැසිල් ප්‍රනාන්දු සහ දමිත් කුමාර යන අයගේ ප්‍රකාශ අනුව අගුලාන පොලිස් ස්ථානයෙන් පිටතට ගෙන ගිය තරුණයන් දෙදෙනා නැවත පොලිස් ස්ථානයට රැගෙන නොපැමිණි බව තහවුරු වේ. මේ අනුව අවසන් වරට නිගමනය කල හැකි වන්නේ අවසන් වරට දකින අවස්ථාව වන විටද තරුණයන් දෙදෙනා පොලිස් අත්අඩංගුවේ පසුවූ බවයි.

පොලිස් විමර්ශණයක මූලික අරමුණ වන්නේ, නඩු කටයුත්තක් පැවරිම සඳහා අවශ්‍ය සාධක තිබේද යන්න සොයා බැලිමයි. පොලිස් විමර්ශනයක් සිදු කළයුත්තේ සැකකරුට එරෙහිව සාක්ෂි පවතිද

නැද්ද යන්න සොයා බැලීම පිණිස මිස ඔහු වැරදිකරුද නිවැරදිකරුද යන්න තීරණය කිරීම සඳහා නොවන අතර එය **අධිකරණය සතු කාර්යභාර්යකි.**

එමෙන්ම 23:1 **වගන්තිය** යටතේ සිරභාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිරභාරයට ගනු ලබන තැනැත්තා විසින් ප්‍රතිරෝධය පාන අවස්ථාවකදී හැර සිරභාරයට ගැනීමේදී සාධාරණ ලෙස අවශ්‍ය උපක්‍රම පමණක් යෙදිය යුතු බව දැක්වෙයි.

එමෙන්ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ **28 වන වගන්තියට** අනුව සිරභාරයට ගනු ලබන තැනැත්තා පැනයාම වැලැක්වීමේ ලා අවශ්‍ය ප්‍රමාණයට වැඩි මැඩපැවැත්වීමක් නොකල යුතු බව දක්වා ඇත.

**මෙම සිද්ධියේදී අගුලාන පොලිස් ස්ථානයේ ප්‍රධාන දොරටුවේ සේවය කරන ලද සුසන්ත ජයලත් ගේ සහ අනිල් පීරිස් යන තැනැත්තාගේ සාක්ෂියෙන්ද පළවන වගඋත්තරකරුගේ සහ අනෙකුත් වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශවලින්ද අත්අඩංගුවට පත් තරුණයන් දෙදෙනාට සිරමැදිරියට දැම්මට පෙර පහර දී ඇති බවට තොරතුරු අනාවරණය වේ.**

**පොලිස් අංක ඒ**20 දරණ දෙපාර්තමේන්තු නියෝගයේ පොලිස් ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තන් පිළිබද නිතිරීති සඳහන් කර ඇත. එහි සඳහන් වන සිර භාරයට ගැනීම සම්බන්ධයෙන් නිතිරීති ඇතුලත් දෙවන වගන්තියෙහි පහත කරුණු දැක්වේ.

(ඒ) සිරභාරයට ගැනීම් **හැකිතාක් දුරට සාහසික ක්‍රියාවලින්** තොරව කල යුතුය. සිරභාරයට ගැනීමට පෙර හෝ ඉන්පසුව හෝ යම් සාහසික තැනැත්තකු මැඩ පැවැත්වීමට බලය පාවිච්චි කිරීම අවශ්‍ය වූ විට **ඉඳුරාම අවශ්‍ය වූ තරමට පමණක් බලය පාවිච්චි කල යුතුය**

(බී:11) වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත් තැනැත්තකුට ඇප දී නැත්නම් **අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඔහු අධිකරණය බලය ඇති මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිටට** යැවිය යුතුය.

(බී:4) වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත් සැම කෙනෙකුම එසේ **සිරභාරයට ගත් බව කාර්යභාර නිළධාරියා විසින් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයාට දැනුම් දිය යුතුය**

මෙම සිද්ධියේදී අදාල වගඋත්තරකාර නිළධාරීන් විසින් මෙම දෙපාර්තමේන්තු නියෝගවලට ඉඳුරාම පරිභාහිර ආකාරයෙන් ක්‍රියාකර ඇති බවට සාධක නිරීක්ෂණය කරන ලදී.

**තවද පොලිස් දෙපාර්තමේන්තු අංක ඒ 20 හි සිරභාරයට ගත් තැනැත්තන් රඳවා තබාගැනීම සම්බන්ධයෙන් නිතිරීති** සඳහන් කර ඇති අතර **දෙපාර්තමේන්තු නියෝග ඒ 17 හි**

සිරභාරයට ගත් සිරකරු සම්බන්ධයෙන් එනම් ඔහු සිරභාරයට ගත් වේලාව, සිරභාරයට ගත් තැනැත්තා සම්බන්ධ තොරතුරු, චෝදකගේ චෝදනාව, සිරකරු බීමත්ව සිටිද යන්න හා ශරීරයේ වූ තුවාල ආදියක ස්වභාවය හා ඔහු සන්තකයේ ඇති දේපල හා භාණ්ඩ පිළිබද විස්තර වහාම තොරතුරු පොතේ සඳහන් කල යුතු බවත් සිරභාරයට ගත් තැනැත්තා සිරභාරයට ගැනීමට හේතු සහ චෝදනාවේ ස්වභාවය පිළිබඳ වද තොරතුරු පොතේ සටහන් කල යුතු බව දැක්වේ.

එසේ නමුත් මෙම සිද්ධියේදී සිරභාරයට ගත් තරුණයන් දෙදෙනා සම්බන්ධයෙන් කිසිඳු තොරතුරක් අදාල තොරතුරු සටහන් පොත්වල සටහන් කර නොමැති බව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව මෙම තරුණයන් දෙදෙනා සිරභාරයට ගෙන සිරමැදිරියේ **රඳවා තැබීම නිතියෙන් නියම කර ඇති කාර්යපටිපාටියට පරිභාහිරව කර ඇති** බවත් නිගමනය කල හැක.

## 2.3.2 සිරභාරයට ගන්නා යම් තැනැත්තෙකු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු වෙත ගෙන යාම

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ <u>36 වන වගන්තියට</u> අනුව වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගන්නා යම් තැනැත්තෙකු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව **ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු වෙත ගෙන යාම හෝ ඉදිරිපත් කිරීම කල යුතු බව දැක්වේ.**
තවද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ <u>38 වන වගන්තිය</u> අනුව වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් අධිකරණයට වාර්තා කලයුතු බව දක්වා ඇත.

මෙම සිද්ධියේදී තරුණයන් දෙදෙනා මහේස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කර නැති බව හා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 38 **වගන්තිය** අනුව අධිකරණයට වාර්තා නොකර ඇති බව විමර්ශනයේදී හෙලි වී ඇත.

<u>Jayasinghe Vs. Samarawickrama</u>[3] සහ <u>Nalika Kumuduni Vs. Nihal Mahinda OIC Hungama</u>[4] නඩු තීන්දුවලදී පෙත්සම්කරුවන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චකාරවරයා ඉදිරියට ගෙනයාමට වගඋත්තරකරුවන් අපොහොසත් වීම **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (2) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බව තීරණය කර ඇත.**

**<u>මෙම සිද්ධියේදිද සැකකරුවන් සම්බන්ධයෙන් එවැනි පියවරක් ගැනීම කිසිදු ලෙසකින් වාර්තා නොවන හෙයින් මරණයට පත්වන තරුණයන් දෙදෙනා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදු වී ඇති බව නිගමනය කල හැක.</u>**

## 2.4 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(3) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම්

**මියගිය** තරුණයන් දෙදෙනා මහේස්ත්‍රාත්වරයකු වෙත යොමු කර නොතිබීමත් ඔවුන්ට එරෙහිව විමර්ශන කටයුතු අවසන් වීමට ප්‍රථමයෙන් පොලිස් අත්අඩංගුවේ සිටියදී ඔවුන් ඝාතනය වීමත් මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **<u>13(3) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති සාධාරණ නඩු විභාගයකට මුහුණ දීමට ඇති අයිතිය නැමැති මූලික අයිතිවාසිකමද උල්ලංඝණය වී ඇති බවද මෙහිදී නිගමනය කල හැක.</u>**

## 2.5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ නීතියෙන් **විමසනු ලබන කාර්යපටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස කිසිම තැනැත්තකු <u>මරණීය දණ්ඩනයට යටත් කිරීම</u> හෝ කිසිම තැනැත්තකු බන්ධනාගාර ගත කිරීම නොකල යුතු බවයි.**

**<u>වික්‍රමබන්දු එදි සිරිල් හේරත් සහ තවත් අයු</u>**[5] නැමැති නඩුවේදි තීරණය කර ඇත්තේ නීතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට අනුකූලව කරනු ලබන රඳවා තබා ගැනීමක් මිස අනෙකුත් සෑම රඳවා තබා ගැනීමක්ම **<u>දණ්ඩනයකට යටත් කිරීමක්</u>** බවට සැලකිය හැකි බවයි.

---

[3] (1994) 2 SLR
[4] S.C. Application (FR) No. 615/95
[5] S.C Application 27/88

Case of Lama Hewage Lal[6]මේ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ජා කර ඇත. මෙම නඩුවේ පෙත්සම්කරුගේ ස්වාමිපුරුෂයා වන ලාල් යන අය මරණයට පත්වන්නේ බන්ධනාගාර නිළධාරීන් ගේ කෲර වධහිංසාවට ලක්වීමෙනි. මෙම <u>නඩුවේදී නිතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස කිසිම තැනැත්තකු මරණයට පත්කිරීම හෝ බන්ධනාගාර ගත කිරීම නොකල යුතු බව තිරණය කර ඇත</u>

**එහිදි ගරු විනිශ්වයකාරතුමා සිය තින්දුවෙහි පහත පරිදි සදහන් කර ඇත**

**<u>The alleged violation of Article 13(4) of the Constitution</u>**

The Petitioners have alleged that the deceased's fundamental right guaranteed in terms of Article 13(4) of the Constitution was violated by the actions of the 03rd, 4th and 5th Respondents.

"I am of the view of the Article 13(4) should be interpreted broadly to mean that the said article recognizes the **<u>right to life</u>** impliedly and that by reading Article 13(4) with Article 126(2) of the Constitution which would include the lawful heirs and/or dependents to be able to bring in an action in a situation where death had occurred as a result of violation of Article11

තවද <u>In Kotabadu Durage Sriyani Silva Vs Chanaka Iddamalgoda, Officer-in-Charge, Police Station, Payagala</u>[7] නඩුවේදී අධිකරණයකින් නියම කරන දණ්ඩනයකදී හැර අනෙක් සෑම විටම යම් තැනැත්තෙකුට **<u>ජිවත්වීමේ අයිතිවාසිකමක් ඇති බව</u>** තිරණය කර ඇත. (that **<u>a person has a right to live,</u>** unless a Court orders otherwise )

තවද මෙම නඩුවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාව මගින් **ජිවත්වීමේ අයිතිය** ව්‍යංගයෙන් පිළිගෙන ඇති බව සාකච්ජාවට බදුන් කර ඇත

A careful reading of Article 13(4) of the Constitution clearly reveals that no person should be **<u>punished with death or imprisonment except by an order of a competent Court.</u>** Accordingly if there is no order from such a Court no person should be punished **<u>with death and unless and otherwise such an order is made by a competent court,</u>** any person has a right to live. Considering the contents of Article 13(4) of the Constitution, Fernando J. stated that, expressed positively, that provision means Furthermore, when Article 13(4) of the Constitution creates a right to life, even impliedly, there cannot be a situation where such right is without a remedy.

On a consideration of the aforementioned positions as well as the decisions taken in both judgements of <u>Kotabadu Durage Sriyani Silva</u> (Supra) **I am of the view of the Article 13(4) should be interpreted broadly to mean that the said article <u>recognizes the right to life impliedly</u> and that by <u>reading Article 13(4) with Article 126(2) of the Constitution which would include the lawful heirs and/or dependents to be able to bring in an action in a situation where death had occurred as a result of violation of Article 11.</u>**

<u>Kapugeekiyana Vs. Hettiarachchi</u>[8] නඩුවේදී ඉතා දරුණු අපරාධකාරයකු හට වුවද මූලික අයිතිවාසිකම් සඳහා අයිතිවාසිකමක් ඇති බව පිලිගෙන ඇත. මේ හා සමානම නඩු තින්දුවක් වන <u>Amal Sudath silva Vs. Kodithuwakku</u>[9] දී අධිකරණය පහත තිරණයට එලඹ ඇත.

---

[6] S.C. (FR) Application No. 700/2002
[7] SC [FR] No. 471/2000, SC Minutes of 08.08.2003
[8] (1984) 2 SLR 153
[9] (1987) 2 SLR 119

Even **notorius** or **hardcore criminals** should not be subject to torture, inhuman and degrading treatment or punishment.

මෙම සිද්ධියේදි අත්අඩංගුවට ගෙන පැය කිහිපයක් ගතවීමට පෙර ඔවුන් දෙදෙනාගේ මරණය සිදුවී ඇති බව මරණ පරීක්ෂණ වාර්තා මගින් තහවුරු වී ඇත. තරුණයන් දෙදෙනාගේ මරණය අධිකරණයක් මගින් නියම කර ඇති දණ්ඩනයක් ලෙද සැලකිය නොහැකි බැවින් තරුණයන් දෙදෙනා විෂයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිතකර ඇති මූලික අයිතිවාසිකම් කණ්ඩනය වී ඇති බව තිරණය කල හැක.

## 2.6 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම්

**මෙම ව්‍යවස්ථාවෙන් කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකල යුතු බව දැක්වේ.**

මෙම සිද්ධියේදි මිය ගිය තරුණයන් දෙදෙනාව පොලිස් අත්අඩංගුවේ සිටියදි වධහිංසාවට ලක්කල බවට වන සාක්ෂි මිලඟට විමසා බලන ලදි.

සිද්ධිය සිදුවූ දින පොලිස් සිරමැදිරියේ රඳවා සිටි ගාල්ලගේ බැසිල් ප්‍රනාන්දු යන අය සහ දමිත් කුමාර යන අය සිරමැදිරියට දැමීමට පෙර පහර දුන් බව සිය ප්‍රකාශ වල සදහන් කර ඇත. පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙස ඉදිරිපත් වී ඇති රංගිගේ අනිල් පිරිස් යන අය ප්‍රකාශ කරනුයේ අගුලාන පොලිසිය ඇතුලේ කාට හෝ ගහන ශබ්දයක් ඇසි ඒ පිළිබඳ විපරම් කල බවයි. තවද මෙම පැමිණිල්ලේ මුල් පැමිණිලිකරුවන් යයි කියනු ලබන නදිකා කල්පනී සහ දර්ශන ද මැල් යන දෙදෙනාද පොලිස් නිළධාරින් විසින් **අත්අඩංගුවට ගත් තරුණයන් දෙදෙනාට තමන් ඉදිරියේදි පහර දුන් බව** ප්‍රකාශ කර ඇත.

## 2.7 වෛද්‍ය සාක්ෂි

මෙම සිද්ධියේදි මරණයට පත්වී ඇති තරුණයන් දෙදෙනා සම්බන්ධයෙන් පශ්වාත් මරණ පරීක්ෂණ වාර්තා නිකුත් කරන ලද අධිකරණ වෛද්‍යවරුන් විසින් ඔවුන් මරණයට පත්වීමට හේතු වශයෙන් දක්වා ඇත්තේ:

1) **පශ්චාත් මරණ පරීක්ෂණ වාර්ථාව[10] - දිනේෂ් තරංග ප්‍රනාන්ද**

There are multile blunt injuries to back of chest.But I am of the opinion that the <u>cause of death is multiple injuries to chest and headby discharges of rifled firearm/s</u>

2) **පශ්චාත් මරණ පරීක්ෂණ වාර්ථාව[11]- ධනුෂ්ක උදයකාන්ත**

**chest and abnominal injuries following discharge from riffled fire-arm**

[10] Post Mortem Report NO SR/401/08/09
[11] Post Mortem Report NO SR/400/08/09

මෙම තරුණයන් දෙදෙනාගේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වූ වෛද්‍යවරු දෙදෙනාම ඔවුන් දෙදෙනාගේම මරණයට **ආසන්නතම හේතුව රයිපල් ගිනි අවියකින් නිකුත් වූ උණ්ඩ වලින් ඇති වූ බහුවිධ තුවාල බව** සඳහන් කර ඇත.

එසේ වුවත් තරුණයන් දෙදෙනා අතරින් දිනේෂ් තරංග ප්‍රනාන්දු යන අයගේ මළසිරුරේ **<u>මොට ආයුධයකින් පහර දීමේදී සිදුවූවායැයි සැක කල හැකි බහුවිධ තුවාල (There are multiple blunt injuries to back of chest)</u>** නිරීක්ෂණය කරන ලද බව එම අයගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ අධිකරණ වෛද්‍යවරයා සඳහන් කර ඇත. එම තුවාල පහත පරිදි විස්තර කර ඇත.

- දකුණු උරහිස් තුඩ මත 10x5 cm ප්‍රමාණයෙන් යුක්ත **සිරීම් ප්‍රදේශයක්** දක්නට ඇත. එය උරහිස් තුඩේ සිට සෙ මී 4ක් ඇතින් පිහිටා ඇති අතර, දකුණු යටිපතුලේ සිට සෙ. මී. 140ක් දුරින් පිහිටා ඇත. එහි හම සිදුරු වීමක් දක්නට නැත.

- පපුවේ ඉහල පෙදෙසේ මධ්‍ය රේඛාවේ හරස් අතට පිහිටි 10x5 cm ප්‍රමාණයෙන් යුක්ත **තැලීමක් දක්නට ඇත. යටින් පිහිටි පේශින්ද තැලීමකට ලක්වී ඇත.**

- සලකුණු සහිත **7 x 5 cm සිරීම් ප්‍රදේශයක්** දකුණ පසු අංශපලකයේ (Scapula) තුඩට මදක් පහලින් වම් පසින් පිහිටා ඇත. මෙම සිරීම් එකිනෙකට සමාන්තරව විහිදී ඇති අතර, එම තුවාලවල මධ්‍යය මැද රේඛාවේ සිට සෙ. මී. 3ක් දුරින් පිහිටා ඇත. යටින් පිහිටි **පේශී තැලීමකට ලක්වී ඇති අතර,** පර්ශු බිඳීමක් දක්නට නැත.

- උදරයේ පිටුපස මධ්‍ය රේඛාව මත සෙ. මී. 12ක ප්‍රමාණයෙන් යුතු **සීරුණු ප්‍රදේශයක්** දක්නට ඇත. මෙම ප්‍රදේශය දළ වශයෙන් වෘත්තාකාර හැඩැති සෙ. මී. 1ක ප්‍රමාණයෙන් යුත් සීරීම් එකිනෙකට විජ්ජම (තිරස්) ආකාරයෙන් දැකිය හැක. මෙය මධ්‍ය රේඛාවේ ඇතුළත හා පිටත පේශීන් මත පිහිටා ඇත. යටින් ඇති **පේශීන්ද තැලීමකට ලක්වී ඇත.**

  එකිනෙකට සමීපව පිහිටා ඇති **සීරීම් තුවාල 5ක්** දකුණු වැලමිටේ පසුපස පිහිටා ඇති අතර, එක් එක් සීරීම දළ වශයෙන් 1x 0.5cmක ප්‍රමාණයෙන් යුක්තය.

- වම් මැණික් කටුවේ පිටුපස 2x1 cm ප්‍රමාණයෙන් යුත් **තැලීමක්** දක්නට ඇත. යටින් පිහිටි මාංශ පේශි තැලීමක් දක්නට නැත.

මෙම වෛද්‍ය සාක්ෂිය අනුවද ඉදිරිපත් වී ඇති අනිකුත් සාක්ෂිද අනුව නිගමනය කල හැක්කේ අත්අඩංගුවට පත් අවස්ථාවේ සිට මරණය සිදුවන තෙක් පොලිස් සිරභාරයේ සිටින අවස්ථාවේදී මෙම තරුණයා පහර දීමකට ලක්වී ඇති බවයි.

අත්අඩංගුවට පත් තැනැත්තාව පාලනය කිරීමට අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා යොදන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වන බව **<u>W.D.Abeygunwardena Vs P.C. Police Station Badulla</u>**[12] හිදී තීරණය කර ඇත.

**මේ අනුව දිනේෂ් තරංග ප්‍රනාන්දු නැමැති තරුණයා සම්බන්ධයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් කඩඩනය වී ඇති බව නිගමනය කල හැක.**

**වධහිංසාවලට සහ වෙනත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට හෝ දඬුවම් වලට එරෙහිව වූ ජාත්‍යන්තර සම්මුතිය** අනුව යමින් 1994 දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද <u>1994 **අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකිමකට**</u>

[12] BASL 95

හෝ දඬුවම් වලට එරෙහිව වූ සම්මුති පනත 2:1 වගන්තියට අනුව යම් තැනැත්තකුට වධදෙන යම් තැනැත්තකු වරදකට වරදකරු වියයුතු බව දැක්වේ.

එම පනතේ වධහිංසාව යන අර්ථ නිරූපණය කර ඇති අතර ඒ අනුව යම් තැනැත්තකුගේ තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබාගැනීමේ අදහසින් හෝ එම තැනැත්තා විසින් කරනලද හෝ කරන ලදැයි සැකකරන ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහාද එම තැනැත්තා බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහාද යම් රජයේ නිළධාරියකු හෝ නිල තත්වයෙන් කටයුතු කරන වෙනත් තැනැත්තකු විසින් හෝ එම තැනැත්තාගේ මුල් වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නාවූ යම් ක්‍රියාවක් වධහිංසාව යනුවෙන් අර්ථ ගන්වා ඇත.

මෙහිදි මෙම සිද්ධියේදි අදාල තරුණයන් දෙදෙනා අත්අඩංගුවට ගෙන පොලිස් සිරමැදිරියට දැම්මට පෙර අදාල වගඋත්තරකාර නිලධාරීන් විසින් පහර දි ඇති බවට වෛද්‍ය සාක්ෂි මගින් තහවුරු වි ඇති බැවින් මෙය මෙම නිළධාරීන්ට විරුද්ධව මෙම පනතේ 2:4 වගන්තිය යටතේ කටයුතු කලහැකි බවට නිරීක්ෂණය කල හැක.

## 2.8 රාජ්‍ය වගකීම හා මූලික අයිතිවාසිකම් සුරක්‍ෂිත කිරීම

පොලිස් අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම (Death in Custody) හෝ අත්අඩංගුවේ සිටියදී වධහිංසාවට ලක්වීම කිසිදු සිවිල් සමාජයක් අනුමත නොකරන්නකි. මෙය **නීතියේ ආධිපත්‍යයේ** එසේනැතහොත් rule of law හි විශාල පසුබෑමක් ලෙස නීතිවේදින් නීතිවිශාරදයන් නිරතුරුව සාකච්ඡා කරනු ලබයි.

නීතියේ ආධිපත්‍යය විවිධ ලෙස අර්ථ ගැන්වුවද ඉතා සරල ලෙස විග්‍රහ කරතහොත් **නීතියේ ආධිපත්‍යය** යනු රාජ්‍ය බලය රටක පුරවැසියන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අයුතු ලෙස හා අත්තනෝමතික ලෙස යොදාගැනීමෙන් වළකාලන යාන්ත්‍රනයක් නැතහොත් ක්‍රියාවලියකි.

In his book *The Morality of Law*, American legal scholar Lon Fuller identified eight elements of **rule of law** which have been recognized as necessary for a society aspiring to institute the rule of law. Fuller stated the following:

ඇමරිකානු නීති විශාරදවරයෙකු වන ලොන් ෆුලර්ට අනුව නීතියේ ආධිපත්‍යය සම්පූර්ණ වීමට නම් ;

- නීතිය පැවතිය යුතු අතර එයට සැවොම එනම් රාජ්‍ය නිළධාරීන්ද ඇතුළත්ව අවනත විය යුතුය.

- නිළධාරීන්ගේ ක්‍රියා සැමවිටම පවතින හා ප්‍රකාශිත නීතිය හා අනුකූල විය යුතුය.

යම් පුද්ගලයකු පොලිස් අත්අඩංගුවේ හෝ සන්නද්ධ සේවාවන්හි අත්අඩංගුවේ සිටියදි මරණයට පත්වීම රාජ්‍ය වගකීමක් ලෙස සාමාන්‍යයෙන් පිලිගන්නකි.

**Amal Sudath Silva Vs Kodituwakku IP**[13] හිදී අධිකරණය විසින් පොලිසිය රජයේ එක් ඉන්ද්‍රියක් ලෙස අර්ථගන්වා ඇත.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිලිගනු ලබන මූලික අයිතිවාසිකම් සියළු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුතු බවත් ආරක්ෂා කලයුතුව ඇති බවත් වර්ධනය කල යුතුව ඇති බවත් පිලිගෙන ඇත. එකී මූලික

---

13 1997 2 SLR

අයිතිවාසිකම් එහි දක්වා ඇති විධිවිධාන සලසා ඇති ආකාරයට මිස සංක්ෂිප්ත කිරීම සීමා කිරීම හෝ අහිමි කිරීම කල නොහැකි බවත් පිලිගෙන ඇත.

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ **සාමනිලධාරීන්** යන්නට පොලිස් නිලධාරීන් සහ දිසාපතිවරයා විසින් පත්කරනු ලබන ග්‍රාමසේවා නිලධාරීහු ඇතුලත් වේ. පොලිස් ස්ථානය නැමැති පාලන ආයතනයේ බලතල හා කාර්යයන් ක්‍රියාවේ යොදවනුයේ මෙම සාමනිලධාරීන් විසිනි. සාමය ආරක්ෂා කිරීමේ අරමුණින් කටයුතු කරන සාමනිලධාරියකු වශයෙන් යම් අපරාධමය වරදක් සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවේදී අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) වගන්තියෙන් දක්වා ඇති ආකාරයට **සෑම තැනැත්තකුගේම මූලික අයිතිවාසිකම් ආරක්ෂාවන ආකාරයට හා මූලික අයිතිවාසිකම් වලට ගරු කරමින් නීතියේ රාමුව තුල කටයුතු කිරීම** අපේක්ෂා කරන අතර මෙම සිද්ධිය එම අපේක්ෂාවන් ඉතා බරපතල ලෙස උල්ලංඝනය කල අවස්ථාවක් බව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත.

පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට පත් තැනැත්තන් වධහිංසාවලට ගොදුරු කිරීම සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සම් නඩු රාශියකදී චූදිත නිලධාරීන් විසින් පෞද්ගලිකව වන්දි ගෙවියයුතු බවට ආඥා කිරීම මගින් අධිකරණය විසින් දිගින් දිගටම සිදුවන එම උල්ලංඝනයන් වැලැක්වීම අපේක්ෂා කලද එය එම උල්ලංඝනයන් සම්බන්ධයෙන් ප්‍රබල බලපෑමක් සිදුකර නොමැති බව මෙසේ දිගින් දිගටම සිදුවන සාමනිලධාරීන් නීතිය අභිබවා කටයුතු කරන අවස්ථාවන්ගෙන් පිළිඹිබු වේ.

මේ සම්බන්ධයෙන් අධිකරණයට ඇති කළකිරීමද **රත්නපාල එදිරිව ධර්මසිරි**[14] **නඩුවේදී** කුලතුංග විනිසුරුතුමා විසින් පහත පරිදි සටහන් කර ඇත.

**"නඩු තීන්දු රාශියක් නොතකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති මූලික අයිතිවාසිකම් කඩකිරීම් කරමින් පොලිස් ස්ථානවලදී සිදුකරන ලබන වධහිංසා බාධාවකින් තොරව දිගටම සිදුකරමින් යනු ලබන බව මට පෙනේ"**

එමෙන්ම **ජයසේකර එදිරිව රාමනායක සහ තවත් අය**[15] **නඩුවේදී** ධරරත්න විනිසුරුතුමා විසින් මෙසේ සඳහන් කර ඇත.

"මෙම **නීතියේ ආරක්ෂකයන්** පිළිබඳව මෙම අධිකරණය විසින් ඇතැම් අවස්ථාවල ප්‍රකාශ කරනු ලැබූ අදහස් නොතකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ගෞරව බහුමානයෙන් යුක්තව සහතික වී ඇති පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් කෙරෙහි ඇතැම් පොලිස් නිලධාරීන් විසින් විටින් විට දක්වන නොසැලකිල්ල මෙම නඩුවේ සිද්ධිමය කරුණු වලින් පෙන්නුම් කරයි"

**ශ්‍රී ලංකා රජය අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතින් රැසක පාර්ශවකරුවෙක් වන අතර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව ජාත්‍යාන්තර සම්මුතියේ පාර්ශවකරුවෙක්ද වේ. මෙම සම්මුතිය අත්සන් කිරීමෙන් සහ අපරට අනුමත කිරීමෙන් ජාත්‍යාන්තර ප්‍රජාව හමුවේ එම සම්මුතියේ අයිතිවාසිකම් පුරවැසියන් වෙත ලබා දීමට සදාචාරාත්මක හා නෛතික වගකීමෙන් බැඳී සිටී. එමෙන්ම මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය විශ්විය ලේඛනයක් ලෙස පිළිගැනීමට ශ්‍රී ලංකාව නිරන්තරව කටයුතු කර ඇත.**

**මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙහි 3 වන වගන්තියෙන්** සෑම පුද්ගලයකුටම ජීවත්වීමට ඇති අයිතිය පිළිගෙන ඇත.

**එහි 5 වන වගන්තියෙන්** කිසිම පුද්ගලයකු **වධහිංසාවට හෝ කෲර අමානුෂික පහත් සැලකීල්ලකට හෝ දඬුවමකට භාජනය නොකල** යුතු බව පිලිගෙන ඇත.

[14] 1993 1 ශ්‍රී ලංකා නව නීති වාර්තා
[15] (SCFR) 17/94

එමෙන්ම 6 වන වගන්තිය මගින් සෑම පුද්ගලයකුම නිතිය ඉදිරියේ පුද්ගලයකු වශයෙන් පිලිගත යුතු බවද දැක්වේ

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ කැටි කරන ලද මෙම අයිතිවාසිකම් **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියෙහි 6 වන වගන්තිය** මගින් පුළුල් ලෙස විග්‍රහ කොට ඇත.

එහි 6 වන වගන්තිය මගින් **සෑම මනුෂ්‍යයෙකුටම ජිවිතය කෙරෙහි නෛසර්ගික අයිතියක් ඇති බවට පිලිගෙන ඇති** අතර එම **අයිතිවාසිකම් නිතියෙන් ආරක්ෂා කල යුතු බවත් කිසිවකුගේ ජිවිතය බලහත්කාරයෙන් අහිමි නොකල යුතු බවත් අවශ්‍යයෙන්ම පිලිගෙන ඇත.**

එමෙන්ම **එම සම්මුතියෙහි 9 වන වගන්තියෙහි (1,) (2) (3) (4 5 අනු වගන්තින්** මගින් අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනිමෙන් වැලකිමට හා අත්අඩංගුවට පත් වි සාධාරණ කාලයක් තුල සිය නිර්දෝෂිභාවය සනාථ කිරිම සඳහා නඩු විභාගයකට භාජනය විමට අවස්ථාව ලබා දිය යුතු බවටද පිලිගෙන ඇත

එමෙන්ම එහි 10 වන වගන්තියෙහි සඳහන් කරන්නේ **සිය නිදහස අහිමි කරනු ලබන තැනැත්තන්ට මනුෂ්‍ය දයාවෙන් සහ මිනිසාට ස්වභාවයෙන් හිමි අභිමානයෙන් යුක්තව සැලකිය යුතු බවයි** එමෙන්ම

එහි 14:2 වගන්තියද සඳහන් කරන්නේ සාපරාධි වරදක් සම්බන්ධයෙන් චෝදනා ලබන සෑම කෙනෙකුටම නිතිය අනුව වරදකරු බව ඔප්පු කරනු ලබන තෙක් තමා නිර්දෝශිය යන අනුමිතිය සඳහා හිමිකම් ඇති බවයි.

එම **සම්මුතියේ 17 වන වගන්තිය** නිතිය ඉදිරියේ පුද්ගලයකු හැටියට සලකනු ලැබිමට සෑම කෙනෙකුටම අයිතියක් ඇති බවට පිලිගෙන ඇත.

මේ අනුව පෙනි යන්නේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් හඳුන්වා දි ඇති එමෙන්ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියෙන් වඩාත් පුළුල් ලෙස අර්ථගන්වා ඇති **විශ්විය** ලෙස සලකන මෙම මුලික අයිතිවාසිකම් රටේ උත්තරීතර නිතිය ලෙස සලකනු ලබන අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ජේදය මගින්ද සුරක්ෂිත කර ඇති බවයි.
තවද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ව්‍යවස්ථාමය පියවරක් මගින් පිළිගැනිමක් ලබා දි නැති මානව හිමිකම් වලට අදාල ඇතැම් ව්‍යවස්ථා බලාත්මක කිරිම සඳහා **2007 වර්ෂයේදි සම්මත කරන ලද 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතේ දෙවන වගන්තිය මගින්** සෑම තැනැත්තකුටම නිතිය ඉදිරියේ තැනැත්තකු ලෙස පිලිගනු ලැබිමේ අයිතිය පිලිගෙන ඇත.

එමෙන්ම එහි 4 වන වගන්තිය මගින් වරදක් සිදුකල බවට චෝදනා ලැබ ඇති තැනැත්තකුගේ අයිතිවාසිකම් හඳුනාගෙන ඇත.

## 2.9 අගතියට පත් පාර්ශවය සම්බන්ධයෙන් වන්දි පිරිනැමීම සම්බන්ධ දේශිය හා ජාත්‍යන්තර නිති අර්ථකථනය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126:4 ව්‍යවස්ථාව මගින් මුලික අයිතිවාසිකම් පෙත්සම්වලදි ශ්‍රේෂ්ඨාධිකරණයට සාධාරණ හා යුක්ති සහගත යැයි හැඟෙනු ලබන සහනයන් සඳහා බලයක් ඇති බව පිලිගෙන ඇත. මෙම අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විවිධ නඩුවලදි ඉතා පුළුල් ලෙස භාවිතා කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ මුලික අයිතිවාසිකම් නඩුවලදි විශේෂයෙන්ම වධහිංසා නඩුවලදි වන්දි මුදලට අදාල වගකිම සහ ප්‍රමාණය බොහෝ නඩුවලදි සාකච්ජාවට බඳුන් කර ඇත.

**Premala de Silva Vs IP Rodrigo**[16] **නඩුවේදි** පෙත්සම්කරු පෙත්සම පැවරීමෙන් අනතුරුව අතුරුදහන් බවට වාර්තා වීමෙන් අනතුරුවද අධිකරණය විසින් නඩුව පවත්වා ගෙන ගොස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දි ඇති අනන්‍ය බලය භාවිතා කොට පෙත්සම්කරුගේ යැපෙන්නන්ට වන්දි ප්‍රධානය කිරීමට නියෝග කරන ලදි.

**Lakshman Vs. Rohan Fernando OIC Homagama Police Station**[17] නඩුවේදි පෙත්සම්කරු නඩුව පැවරීමෙන් පසුව පැහැර ගන්නා ලද බවට අධිකරණයට තොරතුරු වාර්තා විය අධිකරණය විසින් ආන්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ව්‍යවස්ථාව මගින් විධායක ක්‍රියා මගින් සිදුවන මූලික අයිතිවාසිකම් උල්ලඝංනය කිරීමේදි 126 වන ව්‍යවස්ථාවේ පරිදි ප්‍රතිකර්ම ලබා ගැනීමේ අයිතිවාසිකම අහිමි වි ඇති බවට තිරණය කරමින් පෙත්සම්කරුගේ යැපෙන්නන්ට වන්දි පිරිනමන ලදි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එක්සත් ජාතින්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව ඉදිරියේ සාකච්ජාවට බඳුන් වු **Sharma Vs. Government of Sri Lanka**[18] **නඩුවේදි මෙවැනි නඩුවලදී** වන්දි ප්‍රමාණය තිරණය කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව පුළුල් ලෙස විග්‍රහ කර ඇත.

එහිදි අන්තර්ජාතික මානව හිමිකම් නිතියේ උල්ලංඝනයන් හේතුවෙන් පිඩාවට පත් තැනැත්තන්ට ප්‍රතිකර්ම ලබා දිම සම්බන්ධයෙන් එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් සකස් කර ඇති ප්‍රතිපත්ති හා රෙගුලාසි සැලකිල්ලට ගෙන ඇත.

එහිදි වන්දි මුදල තිරණය කිරීමේදි උල්ලංඝනයේ බරපතලකම මෙන්ම ශාරීරික හා මානසික වේදනාව, අවස්ථා අහිමිවිම්, රැකියාව ඇතුළු අධ්‍යාපන අවස්ථාවන් අහිමිවිම සමාජ ප්‍රතිලාභ අහිමිවිම, ආදායම අහිමිවිම විශේෂඥ සහාය, වෛද්‍යසේවා සමාජ සහ මානසික සේවා සැලකිල්ලට ගෙන ඇත.

එසේ වන්දි මුදල මූල්‍ය ලෙස ප්‍රමාණකල හැකි සහ නොහැකි ලෙස වර්ග කල හැක. ඒ අතර මූල්‍ය ලෙස ප්‍රමාණ කල හැකි වන්දි ගණයට **ජිවිතය අහිමිවිම** සලකා ඇති අතර වන්දි මුදල තිරණය කිරීමේදි මියගිය තැනැත්තා ලබාගත් ආදායම පවුලේ යැපෙන්නන්ට අහිමිවිම හා අනාගත ඉපයිම් අහිමිවිම සැලකිල්ලට ගෙන ඇත, අනාගත ඉපයිම් තිරණය කිරීමේදි වයස රැකියාව අධ්‍යාපනය සහ ආයුකාලය සැලකිල්ලට ගත යුතු බව දැක්වේ. ඒඅනුව **ශර්මා නඩුවේදි** ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එක්සත් ජාතින්ගේ මූලික අයිතිවාසිකම් කමිටුවේ නිර්දේශ පරිදි **තේවරාජා ශර්මා යන අයගේ වයස රැකියාව සහ පුරුෂයකුගේ සාමාන්‍ය ආයුකාලය පදනම් කොට ගෙන වන්දි මුදල තිරණය කර ඇත.**

මෙම පැමිණිල්ලේ මියගොස් ඇති තරුණයන් දෙදෙනාගෙන් දිනේෂ් තරංග ප්‍රනාන්දු තරුණයා වයස අවුරුදු 26ක් වන අතර දනුෂ්ක උදයකාන්ත වයස අවුරුදු 21ක තරුණයෙකි. ඔවුන් දෙදෙනාගෙන් දිනේෂ් තරංග ධිවරයෙකු ලෙස සේවය කරනලද බව සහ ධනුෂ්ක උදයකාන්ත කායවර්ධන මධ්‍යස්ථානයක සේවය කර ඇති බවට කොමිෂන් සභාව විසින් සිදුකරන ලද විමර්ශනයේදි හෙලි වි ඇත. මොවුන් දෙදෙනා වෘත්තියන්හි යෙදිමෙන් දිනකට ඉපයූ මුදල සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ඉදිරිපත් වි නැත. කෙසේ නමුත් ඔවුන් දෙදෙනා ලාබාල වයසේ පසුවිමත් ජිවත් විමට තිබූ ආයුකාලය සැලකිල්ලට ගෙන සාධාරණ වන්දි මුදලක් තිරණය කිරීම කෙරෙහි අවධානය යොමු කල හැක.

[16] 1991 1 SLR/307
[17] SC Application 24/9SEM29.09.1995 (Unreported)
[18] Commiunication No.950/2000

## 2.10 තරුණයන් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ගේ වගකීම

මෙහි පළවන දෙවන තුන්වන සහ හතරවන වගඋත්තරකරුවන් තරුණයන් දෙදෙනාව අත්අඩංගුවට ගැනිමෙන් පසුව පිජ්රියෙන් පොලිස් ස්ථානයෙන් පිටතට ගෙන යාමට සහභාගි වු බවට සහ එසේ ගෙන ගොස් ඔවුන්ව පිජ් රියෙන් පිටතට ගෙන බැහැරට කැඳවා ගෙන යාමට සහභාගි වු බවටත් සාක්ෂි ඇත.
පහ හය සහ අට වගඋත්තරකරුවන් අගුලාන පොලිස් ස්ථානයෙන් තරුණයන් දෙදෙනාව රැගෙන යන පිරිසට සහභාගි වි ඇති නමුත් තරුණයන් දෙදෙනාගේ ඝාතනයට සම්බන්ධ වි ඇති බවට කරුණු අනාවරණය වීමක් නොමැත.

හත්වන වගඋත්තරකරු සිද්ධිය සිදුවන අවස්ථාවේදි උපසේවය භාරව කටයුතු කර ඇති අතර ඔහු ධනුෂ්ක නැමැති තරුණයාට පහර දුන් බවට සිවිල් ආරක්ෂක නිලධාරි සුසන්ත ජයලත් ගේ ප්‍රකාශයේ සටහන් වි ඇත. තවද කුමාර ධම්මික කුලතුංග යන අය තරුණයන් දෙදෙනාට පහරදුන් බව සිරමැදිරියේ රඳවා සිටි බැසිල් ප්‍රනාන්දු යන අය ගේ ප්‍රකාශයේ සඳහන්ව ඇත.

මෙහි <u>9 වන වගඋත්තරකරු ලෙස සදහන් මෙම සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලද අනුර ප්‍රදිප් කුමාර නැමැති පොලිස් කොස්තාපල්වරයා</u> සිද්ධිය සිදුවු දින ක්‍රිකට් තරගාවලියක විශේෂ රාජකාරි වාර්තා කර අළුයම නැවත අගුලාන පොලිස් ස්ථානයට වාර්තා කල බවත් තමා පොලිස් ස්ථානයට පැමිණෙන විට පිජ් රථය ලුනාව දෙසට ධාවනය වෙනු දුටු බවත් ඒ හැර මෙම තරුණයන් දෙදෙනා අත්අඩංගුවට ගැනිමට හෝ ඒ හා සම්බන්ධ අනෙකුත් කිසිදු ක්‍රියාවකට සම්බන්ධ නොමැති බවට කරුණු ප්‍රකාශ කර ඇති අතර මෙම වගඋත්තරකරු අත්අඩංගුවට ගැනිමට සම්බන්ධ වි ඇති බවට අනෙකුත් වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශවලද සටහනක් නොමැත.

## 2.11 මෙම පැමිණිල්ලෙන් අගතියට පත් පාර්ශවයන්ගේ අයිතිවාසිකම්

තමා නිවසේ නිදා සිටියදි තරුණයන් දෙදෙනෙකු පැමිණ අතවර කිරිමට තැත් කිරිමක් සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කල නදිකා කල්පනි යන තැනැත්තිය එසේ පැමිණිල්ලක් ගොනු කලාදැයි තහවුරු කර ගැනීමට ලේඛන ආශ්‍රයෙන් නොහැකි විය. කෙසේ හෝ ලිංගික අතවරයකට ලක්වු කාන්තාවක් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට අවතීර්ණ වීමේදි ඇය මුහුණදුන් තත්වය ශෝචනීය තත්වයක් වේ. මන්ද එම තැනැත්තිය පදිංචිව සිටි අගුලාන පොදුජන සුනාමි කඳවුරේ පිහිටි නිවස තරුණයන් ගේ ඝාතනය සැලවිමෙන් පසු ප්‍රකෝප වු ප්‍රදේශවාසින් විසින් විනාශ කර තිබු බව මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරින් විසින් විමර්ශනය කර ඇත.

අපරාධයට ලක්වූ වින්දිතයන් ආරකෂා කිරිම පිළිබඳව නීති කෙටුම්පත් කිරිම ආරම්භ වී තිබුනද ව්‍යවස්ථාදායකය මගින් එය නීතියක් බවට පත් කිරිම තවමත් සිදුවී නොමැත. මේ පිළිබඳව රජයේ අවධානය නැවත යොමුවිය යුතු බව මෙම සිදුවීම තුළින් තවදුරටත් සනාථ වේ අගතියට පත් මෙම පාර්ශවයේ නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වය අයිතිවාසිකම 12:1 උල්ලංඝනය වූ බව කොමිෂන් සභාව විසින් නිරීකෂණය කරනු ලබන්නේ ලිංගික අතවරය නැමති වරදේ වින්දිතයෙකු බවට සනාථ කිරීමට මෙම තැනැත්තිය සතු මුල් පැමිණිල්ල පවා විනාශ වූ බැවිනි.

# තුන්වන පරිච්ඡේදය

# නිර්දේශය

---

### 3.1 මූලික අයිතිවාසිකම් කඩවීම

සමස්ථ සිදුවීම තුළ වගඋත්තරකරුවන් විසින් මියගිය තරුණයන් දෙදෙනාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති 11, 13(2), 13(3) සහ 13(4) හි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව කොමිෂන් සභාව තීරණය කරනු ලබන අතර අගතියටපත් යැපෙන්නන් වෙත යම් වන්දි මුදලක් ප්‍රදානය කලයුතු බව නිර්දේශ කරනු ලැබේ.

මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි අංක HRC/3463/09 හි පැමිණිලිකරුවන් මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා ඇති බව අනාවරණය වන බැවින් වන්දි ප්‍රමාණයන් නිර්දේශ කිරීම කොමිෂන් සභාව සිදුකරනු නොලබයි. නමුත් වන්දි ගණනය විය යුතු ආකාරය මෙම වාර්තාව තුළ විස්තර කර ඇත.

ලිංගික අතවරයට ලක්වූවායැයි පැමිණිලි කිරීමට ගිය කාන්තාව නදිකා කල්පනී නැමැත්තියගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සාක්ෂාත් කර ඇති 12(1)ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකමක් වන **නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වය** වගඋත්තරකරුවන් වෙතින් උල්ලංඝනය වී ඇති බව කොමිෂන් සභාව තීරණය කරනු ලබන අතර සමස්ථ සිදුවීමේ පසු ක්‍රියාකාරීත්වය නිසා ඇයට වූ හානියද සලකා වගඋත්තරකරුවන් හෝ රජය මගින් සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කල යුතු බවටද කොමිෂන් සභාව මගින් නිර්දේශ කරනු ලැබේ.

### 3.2 විනයානුකූලව කටයුතු කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ රජයේ සේවකයෙකු සිදු කරනු ලබන වරදක් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමේ වගකීම විනය බලධරයා වෙත පැවරෙන්නේය ඒ අනුව මෙම සිදුවීමට සම්බන්ධ පොලිස් සේවයේ නියුතු වූ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට පොලිස්පති / ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කලයුතු බවට නිර්දේශ කෙරේ.

### 3.3 යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සමාජයක සමබරතාවය අපගාමී ක්‍රියා වැළැක්වීම යහපාලනය හා මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂවන්නාවූ ක්‍රියාවලියකි. ඒ සඳහා රජය මගින් විවිධ වූ වැඩ පිළිවෙලවල් දියත් කරනු ලබයි. එසේ වුවද යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සෘජුවදායක වන්නාවූ පොලිස් නිලධාරීන් මෙපරිදි කටයුතු කිරීම රටක මානව හිමිකම් ආරක්ෂා කිරීමට ඉතා අහිතකර ලෙස බලපාන්නකි.

එබැවින් බඳවා ගැනීම් වලදී මෙන්ම සේවා කාලය තුළදීද පොලිස් නිලධාරීන් සඳහා අඛණ්ඩ පුහුණුවීම් ලබාදිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

මෙම සිදුවීම තුලින් විධිමත් අධීක්‍ෂණ ක්‍රමවේදයක් ආයතනය තුළ නොපැවතීම නිසා මෙවැනි සිදුවීම් සිදුවීමේ ඉඩප්‍රස්ථාව අධික බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන බැවින් උසස් නිලධාරීන් මගින් සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේද මැදිහත්වීමෙන් සාමනිලධාරීන්ගේ ක්‍රියා අධීක්‍ෂණ කිරීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කල යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

### 3.4 වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව 2008 වර්ෂයේදි පාර්ලිමේන්තුව විසින් සාකච්ජා කර ඇත. නමුත් මේ වනතෙක් එය දේශිය නිතියට අන්තර්ගත විය යුතු පනතක් බවට පත්වී නොමැත. මෙම සිදුවීම තුල මෙවැනි නිතියක අවශ්‍යතාවය වඩාත් ඉස්මතුව පෙනෙන බැවින් එකි පනත් කෙටුම්පත නිතියක් බවට පත්විය යුතු බවටද කොමිෂන් සභාව නිර්දේශ කරනු ලැබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (References)


1. 1966 සිවිල් හා දේශපාල අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය

2. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය 1948

3. 1984 වධහිංසාවලට සහ වෙනත් කෘෘර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට හෝ දඬුවම් වලට එරෙහිව වු ජාත්‍යන්තර සම්මුතිය

4. 2007 වර්ෂයේදි සම්මත කරන ලද අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ ජාත්‍යන්තර සම්මුති පනත

5. 1994 අංක 22 දරණ වධදිමට සහ අනෙකුත් කෘෘර අමානුෂික හෝ නින්දිත සැලකිමකට හෝ දඬුවම් වලට එරෙහිව වු සම්මුති පනත

6. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978

7. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත

8. 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත

9. අබේසිංහ,තිලකරත්න, පොලිස් නිති අත්පොත අංක 1, කර්තෘ, ගම්පොල, 2001

10. පොලිස් ආඥා පනත 53 වන අධිකාරය (2008-12-31 දක්වා සංශෝධන හා අදාළ ගැසට් පත්‍ර සහිත) සහ මානව හිමිකම් පිළිබඳ අදාළ පනත් සහ නියෝග, පැන්සන්,ඕ.ආර්. 2009

11. වධහිංසාවෙන් තොර සමාජයක් : වධහිංසාව නිවාරණය පිළිබඳ නීතිමය සටහනක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2003

12. Amarasinghe, A.R.B, Our Fundamental Rights of Personal Security and Physical Liberty, Ratmalana, Sarvodaya Vishava Lekha, 1995

13. Weliamuna, J.C., Compensation and Other Reliefs for Torture Victims in Sri Lanka: With Special Reference to Fundamental Rights Case, A Family Rehablitation Centre Publication, 2000,

14. Torture in Sri Lanka, A Family Rehablitation Centre Publication

15. Ganesalingam, V.S., Some in Human Cases of Death in Custody and an Analysis of Factors Contributing Toward it, **LST Review** Volu.13,Joint Issue 186 & 187,April & May, 2003,1-8p.

16. Fernando Palitha, Death in Custody and Criminal Investigation, **LST Review** Volu.13, Joint Issue 186 & 187 April & May, 2003,9-13p.

17. Assistance and Protection to Victims of Crime and Witnesses – A bill, **LST Review,** Volu18, Joint Issue246&247, April&May, 2008, 01-29p.

18. Rights and Entitlements of Victims of Crime and Winesses: In the matter of a reference under Article 122(1) (b) S.C. Special Determination No. 1/ 2008, **LST Review,** Volu18, Joint Issue246&247, April&May, 2008, 30-36p.

19. Kulasinghe, Dulani, Objections to the Assitance and Protection to Victims of Crime and Witnesses bill, **LST Review**, Volu18, Joint Issue 246 & 247, April & May, 2008, 37-40p.

20. De Silva, Samith, Some thoiughts on the curent crisis affecting Sri Lanka's Criminal justice process, **LST Review**, Volu 18, April&May, 2008, 41-49p.

21. Suranjith R.K. Hewamanne, Attorney-at-Law, (on behaif of Anthony Michael Emmanuel Fernando) Vs Gayan Chishantha, Jail Guard and Others S.C. (FR) Application No. 128/2003, SCM 14.05. **LST Review**, Volu18, Joint Issue 246 & 247, April & May,2008, 50 -75p.

22. De Silva, Frank, The Sri Lanka Police: Disciplinary Control and questions therof,**LST Review**, Volu. 18, Issue 244, February 2008, 01 -32p.

23. Excerpt from the Police Commission Report of 1970 Sessional Paper XXI - 1970, **LST Review**, Volu. 18, Issue 244, February 2008, 33-41p.

24. Chandrasiri, Niriellege, Perera, U.C.P., Medico – Legal Perspectives of Toture, 2003

**උපදේශකත්වය** : නිමල් පුංචිහේවා මහතා
අතිරේක ලේකම් (නීති)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**මෙහෙයවීම** : සමන්ති ජයමාන්න මහත්මිය
අධ්‍යක්ෂිකා - පරීක්ෂණ හා විමර්ශන
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**විමර්ශන කණ්ඩායම:**

01. විමර්ශන නිළධාරී සි. අරුණකුමාර (කණ්ඩායම් නායක)
02. විමර්ශන නිළධාරී ප්‍රසන්න අරම්පත්
03. විමර්ශන නිළධාරී ජේ.එම්.ෆවුම්
04. විමර්ශන නිළධාරී ලාල් වීරසිංහ
05. විමර්ශන නිළධාරී නිහාල් විදානපතිරණ
06. විමර්ශන නිළධාරී ඒ.එස්.නිලන්ත

**වාර්තා සැකසුම** : නීතිඥ මනුජා විජේතුංග

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2009.12.15